**වසර 2500 පසු**
**මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි.**

# සත්‍ය ධර්මය අවදි විය

(අටවන වෙළුම)

# ආර්ය කමටහන්

## සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලුම ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළකිරීම් සපුරා තහනම් ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස බෙදා හැරේ.

## ආර්ය කමටහන්

අන්තර්ජාලයේ ධර්ම දේශනා ශ්‍රවණය කිරීමට
www.buddothpa.com

zoom දේශනාව youtube ශ්‍රවණය කිරීමට
https://youtube.com/@Zoom-up2ik

facebook හරහා ශ්‍රවණය කිරීමට
https://www.facebook.com/Buddothpado

රාත්‍රී සාකච්ඡා zoom ශ්‍රවණය කිරීමට
https://us06web.zoom.us/j/87341245000?pwd=dFFrSSt4SVBQWFpzeXppUy-tIZFZWUT09

youtube ශ්‍රවණය කිරීමට
https://youtube.com/@buddothpado

facebook හරහා ශ්‍රවණය කිරීමට
https://www.facebook.com/Buddothp?mibextid=ZbWKwL

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය - 2022 දෙසැම්බර්

ධර්ම ග්‍රන්ථය පිළිබඳ
විමසීම් Email: thanujafernando1975@gmail.com
Tel 070 351 8747 - බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ

පරිගණක මුද්‍රණ සැකසුම **වාක්‍යා රූ**
අංක 42/8, මකුළුදූව, පිළියන්දල.
දුරකථනය 011 2 708377

මුද්‍රණය **K.S.U. ග්‍රැෆික් (පුද්) සමාගම**
අංක 510, රාජගිරිය පාර, රාජගිරිය
දුරකථන 011 2884701

# නිවන් මඟ යා යුතු අනුපිළිවෙල

(සත්‍ය කෘත්‍ය කෘතක් ද්විදසාකාරක තිපරිවට්ටම්)

**බුදුන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය තුලින් ප්‍රථම වතාවට නිවන් මඟ යා යුතු ආකාරය අනුපිළිවෙලින් මෙසේ වදාළ සේක.**

1. **පූර්ව භාග ප්‍රතිපදාව** (පළමුව කලයුතු දේ )
   සත්‍යඥාණ අවබෝධය

2. **අපරභාග ප්‍රතිපදාව** (දෙවනුව කලයුතු දේ - ප්‍රායෝගිකවන ආකාරය)
   - **2.1** කෘත්‍යඥාණය - ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම
   - **2.2** කෘතක්ඥාණය - ආත්මීය භාවයෙන් මිදීමේ අත්දැකීම

1. **පූර්ව භාග ප්‍රතිපදාව** (සත්‍යඥාණ අවබෝධය) ශ්‍රාවකයාගේ උත්සාහය මත සහ කල්‍යාන මිත්‍රයාගේ පණිවිඩය මත පවතී

බුද්ධදර්ශනය අවබෝධකරගැනීම (දර්ශන ඥාණය = සත්‍යඥාණය)

- සිත හැදෙන හැටි අවබෝධකරගැනීම
- සිත මායාවක් බව අවබෝධකරගැනීම
- සිත යනු අරමුණම බව දැනගැනීම
- අරමුණෙහි සත්‍ය දැකීම, අරමුණට නොරැවටීම
- ආත්මීය භාවය හැදෙන ආකාරය අවබෝධකර ගැනීම
- අරමුණම ආත්මය බව දැකීම
- ශූන්‍යතා අවබෝධය
- ත්‍රිවිද්‍යා දැනගැනීම (පුබ්බේනිවාසානුස්සති ඥාණය, චුතුපපාත ඥාණය, ආසවක්‍ෂය ඥාණය)
  (සිත = අරමුණ = ආත්මය)

**1.1** කල්‍යාණ මිත්‍රයාගෙන් පණිවිඩය අසා දැන ගැනීම
**1.2** නැවත නැවත සද්ධර්මශ්‍රවනය
**1.3** යෝනිසෝමනසිකාරය
**1.4** ධම්මානුධම්ම ප්‍රතිපදාව

ශ්‍රාවකයා උට්ඨාන වීරියෙන් කලයුතු දෙයින් වැඩි ප්‍රතිශතයක් ඇත්තේ පූර්ව භාග ප්‍රතිපදාව තුලයි.

බුදුන් වහන්සේ කී පරිදි, නිවන් මඟයන ශ්‍රාවකයා කලයුතු සියල්ල හිමාලය පර්වතය නම්, පූර්ව භාග ප්‍රතිපදාවෙන් පසු තව කලයුතු වන්නේ අත ඇති ගල්කැටයක පමණ දෙයකි

සක්කාය දිට්ඨි ප්‍රහාණය මෙතැනදී සිදුවේ.

ශ්‍රාවකයා ආර්‍ය භූමියට පිවිසේ.

## 2. අපරභාග ප්‍රතිපදාව

**2.1.** **<u>කෘත්‍යඥාණය</u>** - අසාදැනගත් ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම (ධර්මය තමාතුලින් දැකීම = සතර සතිපට්ඨානය වැඩීම).

***2.1.1***. අරමුණෙහි සත්‍ය දැකීම; --දර්ශනය තුල සිත හැදෙන හැටි දකින ආකාරය ප්‍රායෝගිකව අත්දැකීම (යථාභූත ඥාණය = යෝනිසෝ මනසිකාරය)

***2.1.2***. අරමුණෙහි සත්‍ය දැක මිදීම

- අරමුණ සත්‍යක් නොවන බව ප්‍රායෝගිකව අත්දැකීම
- ඒ අනුව ආත්මයක් නැතිබව ප්‍රායෝගිකව අත්දැකීම
- සවිතක්ක සවිචාර සමාධිය අත්දැකීම (විදර්ශනා සමාධි.)

***2.1.3***. ත්‍රි විද්‍ය ප්‍රායෝගිකව අත්දැකීම (පුබ්බේනිවාසානුස්සති ඥාණය, චුතුපපාත ඥාණය, ආසවක්‍ෂය ඥාණය)

**2.2.** **<u>කෘතඥාණය</u>** (ශ්‍රාවකයාට කලහැකි කිසිවක් නැත. සොබාදහමේ අනාවරනයක් පමනි. ඥාණයට හසුවේ. බුද්ධ වචනයට අනුව මෙහිදී දැඟලුවහොත් පාරුව ගිලේ.) - සම්මා සමාධි, සම්මා විමුක්ති

ආත්මයක් නැතිබව ප්‍රායෝගික අත්දැකීමෙන්, මිදීම අත්දැකීම (ආත්මීය භාවයෙන් මිදීම නිසා ඇතිවන සමාධිමත් ස්වභාවය)

අවිතක්ක අවිචාර සමාධිය - අනිමිත්ත ශූන්‍යත අප්‍රනීත චේතෝ විමුක්තිය - අරහත්ත සමාධිය - නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යෝ

ශාන්ත ප්‍රනීත නිර්වාන සම්පත්තිය

# පෙරවදන

මෙය ඇසෙන ඔබ මහා භාග්‍යවන්තයි. ඔබ කොහේද යන්නේ, මුලාව රැවටීම හරි භයානකයි. සත්‍ය කුමක්ද? ඔබ සංසාර චක්‍රයක අතරමං වෙලා. විටෙක ඔබ සතුටින්, විටෙක ඔබ දුකෙන්, සැපේ දුකේ දෝලනය වන මේ ජීවිතය හරි භයානකයි. ඔබ සත්‍ය දන්නේ නෑ. ඒ සත්‍ය ඔබ අවබෝධ කළ යුතුයි. ඔබ සංසාර දුකින් මිදෙන කතාවයි මේ.

මෙම දේශන මාලාව මඟින් ඔබට සත්‍ය ධර්මය අවබෝධය සඳහා යම්කිසි උපකාරයක් ලැබෙනවා. සියලු දුකින් මිදෙන තැන හමුවන ඒ 'සදාතනික සුවය' මෙම දේශන මාලාව මගින් අත්දකින්නට ඔබට ද හැකියාව ලැබේ. බාහිර ඇත්ත කරගෙන සිටින තාක් ඔබ ඉන්නේ මිත්‍යාදෘෂ්ටියේමයි. ඒතාක් ඔබට දුක උරුමයි. සිතද මායාවක් වන තැන

සිතේ මායාවෙන් මිදුනු තැන,
බාහිර ඇත්තක් නොවන තැන
සිතද සත්‍යයක් නොවන තැන
ඒ සිතෙන් මිදෙන තැන
ඒ බාහිර ඇත්තක් නොවන තැන
'අජ්ජත්ත බහිද්ධා' කියන තැන
අන්ත දෙකම මිදුන තැන, එනම්,

ධර්මය තුළ සඳහන් වන නාම, රූප අන්ත 2න් මිදීමයි නිවන් මග වන්නේ. මලොව උපදින සියලු සත්ත්වයෝ නිවනින්මයි සැනසීම ලබන්නේ. ධර්මය නම් ධර්මතාවයයි. ඒ පටිච්චසමුප්පාද ධර්මයයි. එනම් ඉදප්පච්චතාවයයි. එනම් දෙයක් නැති බවයි. දෙයක් නැති බව බුද්ධ ස්භාවයයි. දෙයක් නැති තැන

චෙතෝවිමුක්තියයි. එනම් අනිමිත්ත, ශූන්‍යත, අප්ප්‍රනිත චේතොවිමුක්තියයි. ඒ බුද්ධ ස්වභාවයයි. මේ දහම අවබෝධ වේ නම් ඔබ අප සියලු දෙනාම ඒ බුද්ධ ස්වභාවටයි අවදි වෙන්නේ. ඒ බුද්ධ යනු ශූන්‍යතාවයි.

"නිස්සත්වෝ නිස්ජීවෝ ශූන්‍යයෝ"

පහන නිවීගිය පසු ගිය තැනක් කොහින්ද? ඒ නිවීමමයි නිවන. ඒ කෙලෙස් ගින්නේ නිවීයාමයි. ඒ සසර ඕඝයේ නිමාවයි. ඒ විඤ්ඤාන නිරෝධයට ගිය තැන සියලු දුකෙන් මිදීමයි.

විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පහං
එත්ථ ආපෝච පඨවි ච - තේජෝ වායෝ න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපංච - අසේසං උපරුජ්ජති
විඤ්ඤාස්ස නිරෝධෙන - එත්තෙ තං උපරුජ්ජන්ති

සිතෙන් මිදෙන මඟ
නිවන් දකින මඟ
දුකින් මිදෙන මඟ
එයයි නිස්සරණ මඟ

නිවැරදි නිවන් මඟ ඔබටත් හමුවේවි. ධර්මය සොයන්නාට බුදුන් හමු වේ. බුද්ධ යනු සොබාදහමයි. ප්‍රායෝගික පුහුණු විය යුතු ආකාරය හඳුනාගෙන අවබෝධ කළ යුතු ධර්මයකි.

**බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ**

# හැඳින්වීම

මේ ගෞතම බුද්ධ ශාසනය තුළ අපි හැමදෙනාටම අවශ්‍ය වන්නේ නිවීමක්, සැනසීමක්, දුකින් මිදීමක්. නිරන්තර පවත්නා රාග, ද්වේශ, මෝහ. නිවා ගැනීමයි නිවන කියන්නේ. කිසාගෝතමී, පටාචාරා, අම්බපාලි වැනි බොහෝ පිරිස් බුදුරජාණන් වහන්සේ අභියස ඒ ගිනි නිවා සදාකාලික සැනසීම ලැබුවා.

අද බෞද්ධ සමාජයට මේ නිවීම සැනසීම අහිමි වෙලා බොහෝ පිරිස් නොයෙකුත් රාමුවලට සිරවී, ග්‍රන්ථ ධූරයට පමණක් සීමාවෙලා සිටින්නෙ. ඒ තුළින් සත්‍ය දැකීම අපහසුයි. විදර්ශනා ධූරය සමාජයෙන් ඈත් වී ඇති මෙවන් යුගයක නැවතත් ඒ ගිලිහී ගිය බුද්ධ දර්ශනය, විදර්ශනා ධූරය තුළින් ම ඉස්මතු වෙනව. ඒ අති ගම්භීර, නිර්මල, පරම සත්‍යය අපට අහන්න ලැබෙනවා. මේ නිවැරදි බුද්ධ දර්ශනය පෙර නොඇසූ විරූ දහම, ධම්ම චක්ඛුෂය අපි අවබෝධ කරගත යුතු වෙනව. මේ සත්‍ය දර්ශනය බාහිරින් හමුවන දෙයක් නොවේ. බාහිර ඇත්ත වූ තැන පවතින්නෙ ආත්මීය ස්වභාවයක්.

මේ අනාත්ම ධර්මය උතුම් බුද්ධ දර්ශනය 'බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ මාලාව' තුළින් ඔබට කියවන්න ලැබෙනව. එය හොඳින් කියවන්න. ධාරණය කරගන්න. ඔබට සත්‍ය අවබෝධයට මෙය උපකාරී වේවි. මේ අප ගන්නා උත්සාහයේ එක් අවස්ථාවක් පමණි.

**අප කල්‍යාණ මිත්‍ර මෙහෙණින් වහන්සේ**

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මේ උතුම් සත්කාරය සඳහා අර්ථයෙන්, ධර්මයෙන්
සියළුම ආකාරයෙන් උදව් උපකාර කළා වූ
සියළුම දනන් හට, මෙම ධර්ම දානය තුළින්
ජනිත වන්නා වූ පුණ්‍ය ශක්තිය
මේ ගෞතම බුද්ධ ශාසනයේ දී ම
ඒ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය
අවබෝධ කරගෙන සංසාර දුකින් මිදී
නිවනින් ම සැනසීම ලබන්නට
හේතු වේවා !

# පිදුම



මිථ්‍යා දෘෂ්ඨික භූමියේ සිටින,
අසෘතවත් පෘථග්ජනා,
රාගාදී එකොළොස් ගින්නකින්
ඇවිලී ගිනි ගනිද්දී,
කුමන සිනහවක්ද? කුමන සතුටක්ද?
අවිද්‍යාව නමැති අඳුරින් වෙළුන
ඔබ, නිවන් එළිය නොසොයන්නේද?
නැවත නැවත ඉපදීම දුකකි,
සසර වඩන්නකු නොවිය යුතුය.
නුවණැත්තෙකු වී,
කෙලෙස් මාරයා පරදවා
ලෝකෙන් නික්මෙන්න
අධිෂ්ඨාන කළ යුතුය.
අවිද්‍යා ඝණඳුර පහ කරමින්,
විද්‍යාවේ සදහම් කිරණ
මුළු දෙරණ සිසාරා පැතිරී යන
මේ මොහොතේ,
සියලු දනන් හට අවිද්‍යාව දුරු කර,
"ධම්ම චක්ඛුසය"පහළ කරගෙන,
භයානක සසර ඕඝයේ නිමාව දකින්න
මෙම සදහම් පර්යාය හේතු වේවා !!!

# පටුන


| | පිටුව |
|---|---|
| 01. පළමුවැනි දේශනය | 13 - 19 |
| 02. දෙවැනි දේශනය | 20 - 40 |
| 03. තුන් වැනි දේශනය | 41 - 47 |
| 04. හතර වැනි දේශනය | 48 - 54 |
| 05. පස් වැනි දේශනය | 55 - 71 |
| 06. හය වැනි දේශනය | 72 - 85 |
| 07. හත් වැනි දේශනය | 86 - 103 |

# පළමුවැනි දේශනය

**ස්වාමීන් වහන්සේ නමක්:** ආර්යයන් වහන්ස සිත විසිරෙන විදිය කොහොමද? විස්තර කරලා දෙන්න පුළුවන්ද?

**ආර්යයන් වහන්ස:** සිත කොහොමත් විසිරෙනවා. හිතේ ස්වභාවය කොහොමත් විසිරෙන ස්වභාවය. හැබැයි ඒ ප්‍රශ්නයෙ සිත විසිරෙන ස්වභාවය සිහියට හසුවෙනවා. සිහියට නුවණට හසුවෙනවා. සිතට ද්වාර හයෙන්ම අරමුණු එනවා. එතකොට අපේ හාමුදුරුවනේ, කොහොමත් අරමුණක් මේ සිතේ, ඒ කියන්නෙ මේ සිතිවිලි නැති වෙන වෙලාවක් අපිට හමුවෙන්නෙ නැහැ. හැම මොහොතෙම සිතක් ඉපිද නිරුද්ධ වෙනවා ආස්වාස - ප්‍රස්වාස වෙනකම්ම සිතක් ඉපිද නිරුද්ධ වෙනව එකක් දිගටම සිද්ධ වෙනවා. හැබැයි මේ මාර්ගය තුළ කටයුතු කරන යෝගාවචරයින් විදියට. මේ යෝගාවචර භික්ෂූන් වහන්සේ නමක් සමාධිමත් ස්වභාවයකින් නැත්නම් මේ සමාධිමත් සිත හදාගෙන, සමාධිය හදාගෙන, ලෞකික සමාධියක් වෙන්න පුළුවන්. හුස්ම ඒකාග්‍ර කරන, එකම නිමිත්තක සිහිය පිහිටවගෙන විවේක සුවයෙන්, විවේකී මනසකින්, අර විසිරෙන මනස තැන්පත් කරමින්. ඒ සමාධියම අරමුණු කරගෙන කටයුතු කරනවා වෙන්න පුළුවන් හිතේ විසිරෙන ස්වභාවය සාමාන්‍ය ස්වභාවයක්. හැබැයි මේ සමාධිමත් ස්වභාවයේ දී සිත විසිරෙන එක තැන්පත් කරගන්න එක මූලික කෘත්‍යයක්. එතකොට, සිතේ ස්වභාවය කොහොමත් විසිරෙන ස්වභාවයක් ගන්නවා. හැබැයි යෝග ාවචර භූමියේ ඒ විසිරෙන ස්වභාවයේ තැන්පත් කරගන්න එකමයි අපි මේ මාර්ගය තුළ කටයුතු කරනවා කියලා කියන්නෙ. එතකොට සිත නැති මොහොතක් නෑ. සිත හැම මොහොතෙම ඇතිවෙනවා නැතිවෙනවා. ඒ

ගැන හොඳ අවබෝධයක් තියෙන්න ඕනි. මූලික අවබෝධයක්. හැබැයි ඒ සකස් වෙන සිත සුඛුම ස්වභාවයකට පත්වීමක් සිද්ධ වෙනවා. මේ සමාධිමත් ස්වභාවය දියුණු වෙන අවස්ථාව වෙනකොට මේ සිතට අරමුණු නොදැනෙන ස්වභාවයක් එනවා. ඒක හතරවෙනි ධ්‍යාන මට්ටමේ දී තමයි අපිට ගොඩක් දකින්න ලැබෙන්නෙ.

හැබැයි මේ සිත මුල් අවස්ථාවේදී විසිරෙන ස්වභාවයෙ තමයි තියෙන්නෙ. ඒක තමයි ඊට පස්සෙ, ඒ අපි හුස්මට සිත පිහිටවගෙන හරි, නැත්නම් එළියෙ තියෙන අරමුණකට සිත පිහිටුවගෙන හරි. එහෙම නැත්නම් අපි කතා කරනවා සතළිස් කමටහන් කියලා. එතකොට අපි කසින භාවනා කියලා දස කසින කියලා කතා කරනවා. එතකොට නීල, පීත, ලෝහිත, ඕදාන කියලා. එතකොට අපි ඒ කසින මණ්ඩලයක් හදාගෙ නයි එතකොට අපි කටයුතු කරන්නෙ. එතකොට අපි මේවා හොඳින් තේරුම් ගන්න ඕනි සමථයටයි මේ කාරණා වැදගත් වෙන්නෙ. එතකොට විදර්ශන කියන්නෙ, සිතට එන අරමුණේ සත්‍යය දැකලා ඒ සිතෙන් මිදෙන මග යන එක. නමුත් අරමුණු දකින්න බෑ. හිත විසිරෙන කොට. එහෙනම් අපිට වැදගත් වෙනවා. මේ සති කමටහනක සිත පවත්ව ගන්න එක සිත විසිරෙන්නෙ නැතුව තබා ගත්තොත් තමයි සිතට එන අරමුණ අපිට සිහියට හසුවෙන්නෙ. ඒ කියන්නෙ මේ මොහොතේ කුමන සිතක් ද පවතින්නෙ කියලා අපිට සිහියක් තියෙන්න ඕනෙ විදර්ශනා වඩන්නන්. හැබැයි විදර්ශනා වඩන්නත් මේ මොහොතේ පවතින්නෙ කුමන සිතක් ද කියලා අපිට සිහියක් නැත්නම් ඒ විදර්ශනාව සිද්ධ වෙන්නෙ නෑ. අන්න ඒ නිසා තමයි බුදුන් වහන්සේ සමථයේ තියෙන වටිනාකම පැහැදිලි කරන්නෙ. ඒ කියන්නෙ සමථය අඩු නම්, එයා සමථය වැඩියෙන් වඩන්න ඕනෙ. යෝගාවචර භික්ෂුව. එතකොට "සමථ පුබ්බංගමා ධම්මා විපස්සනා භාවේ තබ්බං" කියලා එතනදි සමථයානිකයෙක් විධියට තමයි අපි ධර්මය තුළ හඳුන්වන්නෙ.

හැබැයි යම්කිසි භික්ෂුවක් ඉන්න පුළුවන් සමථය හොඳින් දියුණුයි. සමථය එච්චර දියුණු මට්ටමට විදර්ශනාව දියුණු වෙලා නෑ. ඒ කියන්නෙ සිතට එන අරමුණු අර පටිච්චසමුප්පාදය මෙනෙහි වීම, ඒ යථාභූත ඥානය නෑ. එතකොට ඒ භික්ෂුව සමථය හුඟක් දියුණු නිසා විදර්ශන

භාවනාවට වැඩියෙන් යොමු වෙනවා. සමථය දියුණු නිසා ඒ භික්ෂුව විදර්ශනා යානිකයෙක් විධියට ධර්මය තුළ සඳහන් කරනවා. එතකොට "සමථ පුබ්බංගමා ධම්මා විපස්සනා භාවේතබ්බං" එහෙම නැත්නම් ඊගාව අවස්ථාව තමයි ඒ සමථය අඩු එක්කෙනා සමථය වැඩියෙන් වඩන නිසා. හැබැයි විදර්ශනයේ සමථය හොඳින් තියෙනවා නම්, යම් භික්ෂුවක් ගාව, ඒ භික්ෂුවට ඒ විදර්ශනාව තමයි වැඩියෙන් වැඩීම සිද්ධ වෙන්නෙ. ඒ නිසා "විපස්සනා පුබ්බංගමා ධම්මා සමථං භාවේතබ්බං" කියන තැනට එනවා. එතකොට සමථ විපස්සනා යුගන්ධන ගමන. කොහොමත් මේ සමථ යානිකයෙක් වේවා, විදර්ශනා යානිකයෙක් වේවා, ඒ දෙදෙනා ම සමථ විපස්සනා යුගන්ධන් ගමනක් තමයි නිවන් මග තුළ කටයුතු කරන්නෙ. සමථය අඩු කෙනා සමථය වැඩියෙන් වඩනවා. එතකොට විදර්ශනාව අඩු කෙනා විදර්ශනාව වැඩියෙන් වඩනවා. මේක තමයි සමථ යානිකයා විදර්ශනා යානිකයා කියලා අපි කතා කරන්නෙ. එතකොට මෙතනදි අපිට වැටහෙනවා මේ, සමථය සිත විසිරෙන එක. අර චිත්තඒකාග්‍රතාව ඇති කර ගන්න එක. සිත විසිරෙන්නෙ නැතුව තබා ගන්න එක. ඒ චිත්ත ඒකාග්‍රතාව ඇති කර ගන්න එක. එතකොට මේ සිත දකින්න හේතු වෙනවා. ඒක නිසා සති කමටහනක සිහිය තබා ගන්න එකෙන්, සිත විසිරෙන්නෙ නැතුව සිතට එන අරමුණට හොඳට සිහියක් පවතිනවා ඒ තුළ. ඒ නිසා ආනාපානසති භාවනාවේදීත් හුස්මට සිහිය පිහිටුවන තැනේදි හිත විසිරෙන්නෙ නෑ.

අපි සාමාන්‍යයෙන් විග්‍රහ කරනවා ලෝකෙ වටේ යන හිත, රට වටේ යන හිත, ගම වටේ යන හිත මේ මෙතනට. මෙතන තියෙන අරමුණකට සීමා කර ගන්න එක. තමන්ගෙ ඉස්සරහ තියෙන අරමුණකට සීමා කර ගන්න එක. එතකොට සිත හැමතැනම දුවන්නෙ නෑ. එතකොට ඒ සිත තියෙන අරමුණට සීමා වෙනවා. අපි බුදුපිළිමයක් දිහා බලාගෙන කමටහනක් විදියට ඒ බුද්ධානුස්සතිය වඩන කොට, අර බුදු පිළිමෙ නිමිත්තක් කරගෙන බුදුපිළිමෙටම සිහිය පවත්වන එක. අපි දන්නවා බුදු පිළිමෙ ඉදිරිපිට වාඩිවෙලා බුදු පිළිමෙ දිහා ඇස් ඇරලා බලනවා. බලලා අර බාහිරෙන් නිමිත්තක් විදියට බුදු පිළිමෙට සිහිය පිහිටුවා ගන්නවා. එතකොට ඊට පස්සෙ අපි ඇස් පියාගෙන සිතින් ඒ බුදුපිළිමෙ මෙනෙහි කරනවා. එතකොට බාහිරට යන සිත බුදු පිළිමෙට සීමාවීම අපි උග්ගහ

නිමිත්ත ලෙස හඳුන්වනවා. එතකොට ඇස් දෙක පියා ගත්තහම සිත තුළින් ඒ බුදු පිළිමෙම අපි දකින්න අරමුණු කළොත්, ඒක අපිට සිත තුළින් දැකීමේ හැකියාව තියෙනවා. එතකොට ඒක පටිභාග නිමිත්ත බවට පත් වෙනවා. උග්ගහ නිමිත්ත බාහිර බුදු පිළිමය දකින එක පටිභාග නිමිත්ත දෑස් පියාගෙන සිත තුළින් ඒ බුදු පිළිමෙ දකින එක එතකොට සිත විසිරෙන්න හේතු නෑ. ඒක බුද්ධානුස්සතිය වඩන කොට අපි ඒ කරන දෙයක්. ඒ විධියම තමයි අපි එළියෙ තියෙන අරමුණක්. අපි යම් අරමුණක සිහිය පිහිටුවාගෙන ඒක අපි දෑස් පියාගෙන, ඒක සිතින් මෙනෙහි කළොත් ඒ උග්ගහ නිමිත්ත පටිභාග නිමිත්ත කියන්නෙ ඒ සමාධියට හේතු කාරණා වෙන උපචාර සමාධියෙ මූලික අවස්ථාවට එනවා. ඕභාස අවස්ථාවට එනවා. මේක වචන ගොඩක්.

අපි භාවිත කරන්නෙ ධර්මය තුළ සඳහන් වෙන වචන. හැබැයි මෙතන සිද්ධ වෙන්නෙ ඇත්තටම සිත විසිරෙන්නෙ නැතුව සමාධිමත් ස්වභාවයක් හැදෙන එක. එතකොට හුස්මට සිහිය පවත්වන කොටත් එහෙමයි. හුස්මට සිහිය පවත්වන කොට හුස්මට සිහිය වදින තැන තමයි ඒ නිමිත්ත. සති නිමිත්ත. එතකොට තොල අග්‍රය වෙන්න පුළුවන්. නාසිකාග්‍රය වෙන්න පුළුවන් තමන්ගෙ ස්වභාවය අනුව ආස්වාස ප්‍රාශ්වාස කරන කොට ඒ හුස්ම වදින තැනට සිහිය පවත්වන එක. ධර්මය තුළ ඉතින් දීර්ඝව ආනාපානසති භාවනාව තියෙනවා "දීඝංවා අස්සසන්තෝ දීඝං අස්සසාමීති පජානාති" දීර්ඝ හුස්ම එතකොට ඒක දැනෙනවා. "රස්සංවා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති" අපි මේ කතා කරන්නෙ ලෞකික සමාධියක් ලබන ආකාරය. ඒ කියන්නෙ මේ විදර්ශනා භාවනාව නෙමෙයි. මේ සමථය තුළ තියෙන වැදගත්කම නිසා සිත විසිරෙන්නෙ නැතුව තබා ගන්නෙ කියන එකම තමයි. ඒක ලෞකික වෙන්න පුළුවන්. ඒ වචන අදාළ නෑ. මෙතන වැදගත් වෙන්නෙ සිත විසිරෙන්නෙ නැතුව එකම අරමුණක පැවැත්වීමත් කියන එක චිත්ත ඒකාග්‍රතාව.

ඉතින් අපි ආනාපානසතියෙ එන වාක්‍ය විදියට දීඝංවා. රස්සංවා ආශ්වාස ප්‍රාශ්වාස වෙන ආකාරයට සිහිය පවතිනවා. දීර්ඝව හුස්ම වැටෙනවා කෙටිම හුස්ම වැටෙනවා. නමුත් මෙතන වැදගත් වෙන්නෙ -

කොතනද හුස්ම දැනෙන තැන කියන එක. නාසිකාග්‍රයෙද තොල අග්‍රයෙද හුස්ම දැනෙන තැන අල්ල ගන්න එක තමයි සති නිමිත්ත වඩනවා කියන්නෙ. එතකොට සිත විසිරෙන්නෙ නෑ. කොහෙවත් යන්නෙ නෑ. ඊට පස්සෙ අපි ඒක සිත තුළින් දකිනවා. දැන් "සබ්බකාය පටිසංවේදී අස්සසිස්සාමිති සික්ඛති සබ්බකාය පටිසංවේදී පස්සසිස්සාමිති සික්ඛති" ඒ කියන්නෙ බාහිර තොල අග්‍රයෙ හුස්ම වදින තැන. අර බාහිර බුදුපිළිමෙ දැක්කා වගේ නිමිත්ත. ඊට පස්සෙ ඒක සිත තුළින් දකිනවා උග්ගහ නිමිත්ත කියන්නෙ බාහිර පටිභාග නිමිත්ත කියන්නෙ ඒක අපි සිත තුළින් දකින එක. එතකොට ඒ හුස්ම වදින ස්වභාවය දැනෙන ස්වභාවයට සිහිය පවතිනවා. එතකොට දෑස් පියාගෙන සිත තුළින් දකිනවා. දැන් මේ ආනාපානසති භාවනාවෙ මූලික අවස්ථාව. එතකොට ඒක පටිභාග නිමිත්ත බවට පත්වෙනවා. හිත විසිරෙන්නෙ නෑ කොහොමත් මේ අවස්ථාවේදී. එතකොට විතක්ක විචාර සංසිඳෙන අවස්ථාව වචනය සංසිඳෙන තැන. විතක්ක විචාර සංසිඳෙන තැන. හැබැයි මූලික අවස්ථාව.

විතක්ක විචාර තියෙන අවස්ථාවෙ තමයි. අර හුස්ම අර දැන් මෙතන චිත්ත ඒකාග්‍රතාව ඇතිවෙන්න කලින් සිත විසිරෙන ස්වභාවයක් එනවා. එක එක ඒවා හිතට හිතෙනවා. අරමුණු පරණ ඒවා මතක් වෙනවා. ඒ වගේ ද්වාර වලින් එන අරමුණු මනෝද්වාරයෙන් අරමුණු එනවා. එතකොට ඒ අරමුණු එන එක නවතිනවා. නිමිත්තට සිත බැසගෙන ඉන්න කොට අන්න එතන තමයි සිත විසිරෙන්නෙ නැතුව තියෙන තැන. ඒ විසිරෙන එක තමයි අර අපි කියන්නෙ විතක්ක විචාර කියලා. විතක්ක එනවා සංඥා එනවා ගැස්සි ගැස්සි තිබිලා. ඒ කියන්නෙ අරමුනු එනවා යනවා උනාට ඒක ටිකක් යනකොට හරියනවා. එන්නෙ නෑ මුකුත් ඊට පස්සෙ. ඊට පස්සෙ අර අරමුණම පිහිටුව ගන්න පුළුවන්. ඕක ලේසියි. ඇත්තටම බුදු පිළිමයක් වගේ ඉස්සරහ මොනවහරි දෙයක්. අරමුණක් මොකක්ද තියෙන්නෙ ඒ මොනවහරි එක අරමුණක සිහිය පවත්ව ගන්න එක තමයි මෙතනදි වැදගත් වෙන්නෙ. ඒක අර සිත තුළින් දකින එක තමයි. එතකොට අර නීල කසිනය කියන්නෙ. නිල් පාට - අඟල් 18ක විතර රවුමක් හදාගෙන මේකෙ මැද්දෙ පොඩි තිතක් තියෙනවා. තිතක් තියලා අර තිතට තමයි සිහිය පිහිටවන්නෙ. එතකොට නිල්පාට තමයි

ප්‍රකට වෙන්නෙ. සිත තුළටත් ඇස් දෙක පියා ගන්න කොට අර නිල්පාට තමයි ප්‍රකට වෙන්නෙ. ඒවා ගොඩාක් අන්තයට යනවා වැඩියි. සමථය පැත්තෙන් ඒක යන්නෙ. අර වේදය තුළ යන පැත්තනෙ.

නමුත් "ඉධ භික්ඛවේ භික්ඛු" මේ සාසනයේ භික්ෂුවට මෙතනදි වෙන්නෙ චිත්‍ර ඒකාග්‍රතාවයෙ වැදගත්කම විතරයි. ඒක මහා සලායතන සූත්‍රය තුළ බුදුන් වහන්සේ පැහැදිලි කරන කාරණාවක්. දැන් අපි ආරණ්‍යවාසීව වාසය කරන කොට යෝගාවචර භික්ෂූන් විදියට කොහොමත් අපිට ගේහ සිත, ඒවා වැඩක් නෑ. අපිට නෙක්ඛම්ම සිත තමයි වැදගත් වෙන්නෙ. ඒ කියන්නෙ අපිට ඔය ගිහි ජීවිතය තුළ ඒ තියෙන අරමුණු වලින් පළක් නෑ. මොකද අරණ්‍යවාසීව කටයුතු කරන්නෙ. එහෙනම් අරණ්‍යවාසීව කටයුතු කරනවා නම් නෙක්ඛම්ම සිත ඒ කියන්නෙ කම්සැප පිනවීමෙන් තොරව කටයුතු සිද්ධවෙන්න ඕන. එතකොට විතක්ඛ කොහොමත් අඩුවෙනවා එතකොට. විතක්ඛ ගොඩක් අඩුවෙලා "ප්‍රපංච සංඥා සංඛා සමුදා චරන්ති" ඒක ධර්මය තුළ සඳහන් වෙනවා. එතකොට මේ අරමුණු හොඳින්, අන්න එතන විසිරෙන ස්වභාවයෙන් අපි හොඳින් මිදෙනවා. දැන් ඔබ වහන්සේගෙ ප්‍රශ්නෙට අවතීර්ණ වෙන්නෙ විදර්ශනා භාවනාවට. ඒ කියන්නෙ අපි යන්න ඕන බුදුන් වහන්සේ ගිය මග. නිවන් දකින මග. නිවන් දකින මගට උපනිශ්‍රය වෙන්නෙ ඒ ටික. මහා සලායතන සූත්‍රයෙ බුදුන් වහන්සෙ පෙන්වනවා ඕනෑම චිත්ත ඒකාග්‍රතාවකින් නිවන් දැකිය හැකියි මහණෙනි කියලා. අන්න එතකොට අපිට තේරෙනවා දැන් හිත විසිරෙන්නෙ නැත්නම් සිතට එන අරමුණ ජේනවා කියන එක. සිතට එන අරමුණු ජේනවා කියන තැන තමයි මෙතන යෝනිසෝ මනසිකාරය කියන එක. ඒක අරමුණේ සත්‍ය දකින්නත් අරමුණු ජේන්න ඕනෙ. සති සම්පජන්‍ය තියෙන්න ඕන. එහෙම උනොත් විදර්ශනාවට ඇත්තටම ඒක හේතු වෙනවා.

විදර්ශනාව කියන්නෙ ඇත්තටම මේ අරමුණේ සත්‍ය දකින එක. අරමුණේ සත්‍ය දැක්කොත් තමයි අරමුණේ නොරැවටී අරමුණෙන් මිදෙන මග යන්නෙ. ඒ කියන්නෙ නිවන් දකින මග යන්නෙ. ඉතින් විදර්ශනාව තමයි මෙතන වැදගත් වෙන්නෙ. බුදුන් වහන්සේ ලෝකෙට හෙළි කරන්නෙ විදර්ශනා භාවනාව. සමථ භාවනාව වේදය තුළ තිබුණා.

පස්වග තවුසො ඒවා දැක්කා. ඉතින් අපිට ඒවා හොඳින්ම වැටහෙනවා පෙර නොඇසූ නොවූ විරූ දහමක් බුදුන් වහන්සෙ ලෝකෙට හෙළි කරන්නෙ විදර්ශනා භාවනව. එතකොට සමථය අපි භාවිත කරනවා පමණයි. මේ එන අරමුණේ සත්‍ය දකින්න තමයි එතකොට චිත්ත ඒකාග්‍රතාව, හිත විසිරෙන්නෙ නැතුව තියා ගන්න එක වැදගත් වෙන්නෙ. මූලික සිද්ධාන්ත. එතන වැදගත් කාරණා. නමුත් මෙතන මූලික කියලා නෑ. මොකද නිවන් දක්වාම ඕක වැදගත් වෙනවා. ඕක නිවන් දකින මොහොත වෙනකම්ම අරහත්වයට පත්වෙනකම්ම වැදගත් වෙනවා. එතකොට අපේ හාමුදුරුවන්ට ඒක ටිකක් වැදගත් වෙනවා. විදර්ශනා භාවනාව ගැන අපි පසුව කතා කරමු. එහෙම නේද අපේ හාමුදුරුවනේ.

**ස්වාමීන් වහන්සේ නමක්** - එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ** - බොහොම හොඳයි. එහෙනම් වෙන දවසක අපි විදර්ශනාවට යොමු වෙමු. අපේ හාමුදුරුවනේ අද මෙතනින් මේ දේශනය සීමා කරමු. හොඳමයි අපේ හාමුදුරුවනේ.

**ස්වාමීන් වහන්සේ නමක්** - එහෙමයි ආර්යයන් වහන්ස. පාද නමස්කාර වේවා! තෙරුවන් සරණයි.

**ආර්යයන් වහන්සේ** - තෙරුවන් සරණයි.

# දෙවැනි දේශනය

**මෙහෙණින් වහන්සෑ** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සෑ** තෙරුවන් සරණයි.

**මෙහෙ.වෑ** ආර්යයන් වහන්ස දැන් අපිට සිතුවිලි වලට සිහිය පවත්වනවනේ. දැන් අපි ඉන්ද්‍රියන් පිනවන ස්වාභාව කාම දැනෙනවනෙ ආර්යයන් වහන්ස. එතකොට ඒ ස්වභාවය ටික ටික දියවෙලා යන්නෙ ආර්යයන් වහන්ස. නැත්නම් අපි පිරිසිදු වෙන්න ඕනි ද තව ආර්යයන් වහන්සේගෙන් උපදෙස් මොනවහරි ගන්න ඕනිද ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සෑ** ඔව්. ඒක තමයි. ඇත්තටම මේ ඉන්ද්‍රිය පිනවන ස්වභාවයක් තියෙනවාද?

**මෙහෙ.වහන්සෑ** එහෙමයි ආර්යයන් වහන්ස. අපිට ඒක ඔටෝම එන්නෙ නැතුව නෙමෙයිනෙ ආර්යයන් වහන්ස. ඒක දැනෙනවා. දැන් මේක සිස්ටම් එකක් 'සෙන්සර් එකක්' කියල අපි නිතරම සිහිය පවත්වනවනෙ සිතුවිලිවලට ආර්යයන් වහන්ස. ඒත් තාම තියෙනවා කියල දැනෙනවනෙ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සෑ** ඒක තමයි.. ඒකෙන් අහන ප්‍රශ්නය මොකක්ද ඔබතුමිය.

**මෙහෙ.වහන්සෑ** එතකොට ආර්යයන් වහන්ස ඒක ටික ටික ද දියවෙලා යන්නෙ ආර්යයන් වහන්ස. මේ විදිහට පුරුදු කරන කොට.

**ආර්යයන් වහන්සෑ** ඔව්. ටික ටික තමයි දියවෙලා යන්නෙ. ටික ටික දියවෙලා යනවා. අර සත්‍යය සද්ධර්මය ශ්‍රවණය මෙතන ලොකු දෙයක් සිද්ධ වෙනවා. සද්ධර්ම ශ්‍රවණය තුළ අර ධර්මතාව නිතරම මෙනෙහි වෙන්න ගන්නවා. දැන් ඇත්තටම මේ... පිනවන ස්වභාවය අර ටිකක් අර සංඥා අභිසංකරණයක් කියන්නෙ පුරුදු ටිකක්. එතකොට සිත කියල භාවිත කළාට මෙතන තියෙන්නෙ බලගැන්වුණු සිස්ටම් එකක් අභිසංකරණයට තමයි මේ අපි සිත කියන්නෙ.

**මෙහෙ. වහන්සෑ** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සෑ** මෙතන ඇත්තටම සිත කියල ලිහාගෙන ලිහාගෙන ගියොත් සිතක් හම්බ වෙන්නෙ නැහැ. දැන් අර සංඛාරාවල ස්වභාවය "කඳලුපමංච සංඛාරා" කියල බුදුන් වහන්සේ **කෙසෙල් කඳකට සංඛාර උපමා කරන්න හේතුව තමයි කෙසෙල් කඳ පතුරු ගහගෙන ගහගෙන ගියොත් අවසානෙ හම්බ වෙන දෙයක් නැහැ. මෙන්න මේ වගේ මේ සිත හොඳින් කවුරුහරි පිරිසිදු කරගෙන බල බල බල බල ගියොත් ඇත්තටම සිත කියල දෙයක් හම්බ වෙන්නෙ නැති තැනටම දියවෙලා යනවා.**

**මෙහෙ. වහන්සෑ** එහෙමයි.

**ආර්යයන් වහන්සෑ** හැබැයි මෙතන සිස්ටම් එකේ තියෙනවා මේ සෙන්සර්වල තමයි මේ කතාව තියෙන්නෙ. දැන් ඔය සිත කියල කියන්නෙ 'නාම රූප' වලටයි. දැන් නාම රූප කියන්නෙ ශබ්ද, වර්ණ, ගන්ධ, රස, ස්පර්ශ. ඔය ශබ්ද, ගන්ධ, පහස වලින් අපි ඔය ශබ්දයි වර්ණයි ගන්ධයි රසයි පහසයි තමයි අපි දෙයක් කරල අපිට මැව්ල තියෙන්නෙ. ශබ්ද, ගන්ධ වර්ණ රස පහස වෙන වෙනම ගත්තොත් දෙයක් නැහැ.

**මෙහෙ. වහන්සෑ** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සෑ** හැබැයි අපි ඒ ටික එකතු කරල ගත්තොත් දෙයක් වගේ දැනෙනවා. ඒක මෙන්න මෙහෙමයි. දැන් කේක් එක ඔක්කොම අනල ගත්තොත් කේක් එකක් හැදෙනවා. හැබැයි ඕක වෙන්

කරල ගත්තොත් 'පාන් පිටි වෙනම, සීනි වෙනම ඔක්කොම වෙන් කරල ගත්තොත්. එතන කේක් එකක් නැහැ. මෙන්න මේ වගේ තමයි මේ කතාව සම්පූර්ණයෙන්ම. දැන් නිතරම අපි කේක් එකම පවත්තගෙන යන එකක් තියෙනවා. මේ නිතරම අන අන ඉන්නව කේක් එක. අන අන ඉන්නකම්ම කේක් තියෙනවා හැමදාම. මේ වගේ අපි හැමදාම කේක් කකා තමයි යන්න හදන්නෙ. නමුත් කේක් එකක් නැහැ. දැන් මේක තමයි සුද්ද වෙලා යන්න ඕනි. පොඩ්ඩ පොඩ්ඩ තමයි අර දිය වෙන්නෙ. ඇත්තට මේකෙ ගම් එක වගේ දෙයක් තියෙනවා මෙකේ ඇලෙන ස්වභාවයක්. ඔය මේ... ශබ්ද, වර්ණ, ගන්ධ, රස, පහස කියල, අපි ඔය එකට එකතු වෙච්ච දෙයක්නෙ අපි බිත්තිය කියන්නෙ, පොත කියන්නෙ, මේසෙ කියන්නෙ. ඔය හැම දෙයක් තමයි අපි වටපිට බලන කොට දෙයක් තමයි අපි ඇසුරු කරන්නෙ.

**මෙහෙ. වහන්සඃ** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සඃ** හැබැයි අපි දැන් **දෙයක් කියන එක අපේ චිත්ත ස්වභාවයක්. දෙයක් කියල දැනෙන එක, ආත්මීය දැනීමක්. භවය කියන්නෙ ඕකමයි.** හැබැයි අපි ඔය සේරම පැත්තකට කළොත් එහෙම සාමාන්‍ය විදිහට වෙනද විදිහට අපිට පේනවා. හැබැයි අර දෙයක් කියල දැනෙන එක තමයි නැති වෙන්නෙ. **දෙයක් කියල අපිට වටිනාකමක්, ආරෝපණයක්, උද්දීපනයක්** අර මේකෙ තියෙන්නෙ මේ හොඳම වචනෙ තමයි **"නන්දියක්" තියෙනවා.**

**මෙහෙ. වහන්සඃ** එහෙමයි.

**ආර්යයන් වහන්සඃ** අපිට තියෙනවා අභිනන්දනයක්. චුන් වෙවී ඔය කවුරුත් කැමති නැහැ කියනවට ඔය වචනෙ. චූන් වෙවී ඉන්න කියන එකට ඕකෙ ඇත්තම තේරුම තියෙන්නෙ "උද්දීපනය" කියන එක. උජ්ජිත්තදි චූන් වෙනවා කියන එක තමයි රුප්පනය කියල කියන්නෙ. ඕක තමයි අපි ගාව තියෙන්නෙ. ඕක තමයි අපි හැම තිස්සෙම පොතක්, මේසයක්, ඇඳක් කියල ඔය දාගන්න ශබ්ද ටිකක් දැන් පොඩි වෙලාවකට කලින් කුවේට්වල අම්ම කෙනෙක් කතා කළා. ඒ අම්ම කියනවා ඒ භාෂාව සම්පූර්ණයෙන් වෙනස්.

**මෙහෙ වහන්සඃ** එහෙමයි.

**ආර්යයන් වහන්සඃ** බිත්තියට කියන්නෙ 'කදාර්' කියල ඔන්න ඔහොම එකක්. එතකොට මේ දැන් සාමාන්‍යයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් කියන්නෙ "වෝල්." සිංහල භාෂාවෙන් අපි කියනව බිත්තිය කියලා. එතකොට මේ ශබ්දෙ කියන එක කිසිම තේරුමක් නැහැ වගේ තේරෙනවා. මෙතන එහෙම දෙයක් තියෙනවද. මේ බිත්ති කතාව මොකක්ද මේ. ශබ්දයයි වර්ණයයි කියන්නෙ අපි පොඩි කාලෙ ඉඳල මේක අහල අභිසංකරණයට ලක්වෙලා කියලා හොඳට තේරෙනවා.

දැන් අපි ඇත්තට ගත්තොත් මෙනෙහි කරල බැලුවොත් එහෙම. අපි දැන් නුවරඑළියෙ ඉපදුණා කියලා අපි හැමදාම දකින දෙයක් තමයි ඔය නුවරඑළියෙ තියෙනවා පෙයාර්ස්, ස්ට්‍රෝබෙරි. අපි නිතරම නුවරඑළියෙ ටවුන් එකේදි පොඩි කාලෙ ඉඳල නිකන් අර අම්මලගෙ අතේ එල්ලිලා එහෙට මෙහෙට ගිය නුවරඑළියේ දරුවෙකුට ඕක නිකම් මහ ලොකු දෙයක් නෙමෙයි. ඔය පෙයාර්ස්, ස්ට්‍රෝබෙරි හැමදාම ටවුන් එකේ තියෙනවා. ඉතින් ඕක දැකල දැකලා හරියට නිකන් අරක සාමාන්‍ය දෙයක්. දැන් අර මේ පැත්තෙ ඉන්න දකුණු පළාතෙ දරුවෙක් ජීවිතේ පළමු වතාවට නුවරඑළි ගියොත් මෙයා එකපාරටම 'හානේ' මේ තියන්නෙ ස්ට්‍රෝබෙරි කියල අමුත්තක් එනවා. මෙන්න මේ වගේ ස්වභාවයක් තමයි මෙතන. ඒ කියන්නෙ අපිට නිතරම ඒක අපිට බලගැන්විලා බලගැන්විලා බලගැන්විලා සාමාන්‍යයෙන් අර නුවරඑළියෙ ළමයා ඉන්න විදිහට තමයි අපි ඉන්නෙ.

**මෙහෙ වහන්සඃ** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සඃ** අපිට ඒ සාමාන්‍ය ලෝකෙ ස්ට්‍රෝබෙරි තියෙනවා. පෙයාර්ස් තියෙනවා. අර එකපාරටම අර දකුණු පළාතෙ ළමයාට මේක අලුත් දෙයක්. මෙන්න මේ වගේ. ඒ ළමයත් නිතරම නුවරඑළි යනවා නම් ඒ ළමයටත් ඒක කාලයක් ගියොත් සාමාන්‍ය දෙයක් බවට පත්වෙනවා. මෙන්න මේ වගේ. අපි හිතමු පුංචි දරුවෙක් "ලේ කැටි දරුවෙක්" ලේ කැටි දරුවට "මහණෙනි ඇසේ උපතයි උපත" කියන තැනින්. අර පළවෙනි වතාවට දෙයක් කියල දැනෙන ගතියක් එන තැනක් එනවා. අර

ඇසින් බලල කනින් අහල. අර දෙයක් කරල ශබ්ද, වර්ණ එකතු කරල දෙයක් කරලා ස්කන්ධානං පාතිභවෝ - ආයතනානං පටිලාභෝ අයං උච්චති ජාති. කියන තැන ඇසේ උපතයි මහණෙනි, උපත කියන තැන.

ඔන්න ඔතන තමයි අර එකපාරටම අපි මෙතන අල්ල ගත්ත තැන. අර ළමයා එකපාරටම නුවරඑළියෙ ගිය දවස. ඊට පස්සෙ මොකද වෙන්නෙ. නිතරම නුවරඑළි ඉන්න කොට ඒක සාමාන්‍ය දෙයක් උනා වගේ. අපි දැන්, අපේ අම්මා මේ අම්මා, අපේ ගෙදර මේක, අපේ මේක බිත්තිය, මේක පුටුව, මේ තියෙන්නෙ රත්තරං, මේ තියෙන්නෙ යකඩ. මම ගෑනු ළමයෙක්, මේ පිරිමි කෙනෙක්. දැන් එක එක හැඩතල එක එක විදිහට දේවල් ගොඩක් අන්තිමට ත්‍රිලියන් ගාණක් ඩේටා." දැන් අපි අර කම්පියුටරේ දත්ත දානවා වගේ. මේක වැදිල වැදිල වැදිල ශබ්දයි වර්ණයි වැදිල වැදිලා වගේ, අන්තිමට විශාල අපි අර මේ බඹරෙකට අහුවෙලා වගේ විශාල අභිසංකරණයකට ලක්වෙලා දෙයක් බවට පත්වෙලා. ගුලියක් වගේ ඝන වෙලා. දැන් අපි ඉන්නවා හදා ගත්ත නිකන් අර පිස්සු හැදිච්ච අර සතෙක් වගේ. මේ ඔක්කොම පිස්සු හදාගෙන ඉන්නවා. සේරම දේවල් තියාගෙන.

**මෙහෙ වහන්සෑ** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සෑ** දැන් අර මම උදේට කන්න ඕනි. දවල්ට කන්න ඕනි. රෑට කන්න ඕනි. තුන් වේලක් හදාගෙන මේ ඔක්කොම නිකම් පුරුදු ගොඩක්. දැන් අපි කතා කරන වචන හැම එකක්ම පුරුදු. දැන් මේ සිත කියන්නෙම දැන් අපි පුංචි දරුවට සිතක් පනවන්න බෑ. අර පොඩි දරුවා හිනාවෙනවා තමයි, දකිනවා තමයි, පේනවා තමයි. ඒත් දෙයක් නෑනෙ. එයාට ලෝකයක් කතාවක් නෑනෙ පොඩි දරුවට. පොඩි දරුව ඉපදුණා දන්නෙත් නැහැ. මැරුණා දන්නෙත් නැහැ. දැන් ඊට පස්සෙ දැන් හදාගෙන හදාගෙන යන කොට අපිට දැන් දුකක් එන්නෙ ඇයි. අපි දන්නවා ඉන්න බව, තියෙන බව, සේරම දේවල් වෙලා. ඒවයෙ බලගැන්විලා ආරෝපණයක් අපි තුළම ඇති වෙලා.

මේක විවිධාකාර විදිහට අපි විග්‍රහ කරනවා. අපි එක එක විදිහට විග්‍රහ කරනවා. කෙන කෙනාගෙ විදිහට එතකොට ඔය සමහරවිට

වෛද්‍යවරයෙක් නැත්නම් ඔය සයන්ස් පැත්තෙ හරි මොනවහරි දෙයක් කතා කරනවා. මේක අභිසංකරණයක් වෙනවා. මේක ඉලෙක්ට්‍රික් වගේ, මේක කරන්ට් එකක් වගේ උපදිනවා. ආරෝපණයක් වගේ මේක බලයක් ඇතිවෙනවා. මෙන්න මෙහෙම එකම දේ නැවත නැවත දැකීම තුළ ඒක බලගැන්වෙනවා. ඇත්තටම මේක අපිට මේක සතා සිව්පාවාට තේරෙන්නෙ නෑ. හැබැයි මනුෂ්‍යයට මේක නුවණට අසුවෙනවා. මේ සිස්ටම් එක ඇතුළෙම. මේ සිස්ටම් එකෙන්ම, අර නැවත නැවත නැවත නැවත එතකොට බලගැන්වෙන සිස්ටම් එකෙන්ම, ඒ සිස්ටම් එකෙන්ම හඳුනා ගැනීමක් තමයි, දෙයක් වගේ දැනෙන්නෙ. එතකොට ඒ නැතිදෙයක් නැති දෙයක් බවට දැනෙන ගතියක්- ඒ සිස්ටම් එකෙන්මයි ඇති වෙන්නේ. මේක තමයි "මනසිකරෝති" කියල කියන්නෙ.

**මෙහෙ වහන්සෘ** එහෙමයි.

**ආර්යයන් වහන්සෘ දෙයක් හැදෙන විදිහට හැදෙන බවත්, දකින ඒ මනසිකාරයේම ආයේ දෙයක් එහෙම නොතිබෙන හැටි දකින එකක් ඒ මනසිකාරයේම සිද්ධ වෙනවා.** මේක තමයි ආශ්චර්යයි අත්භූතයි සිද්ධිය. නිවන් දකින්නෙත් ඒකෙන්මයි. හැදෙන තැනින්ම ඇති උනොත් ආත්මෙත් හැදෙනවා, හැබැයි හැදෙන තැන ඇතිවෙන විදිහෙන්ම, ඒ හැදෙන දේ නැතිවෙන බව දැකීම තුළ, අන්න ඒ දේ නිවනයි. හරි පුදුම හිතෙනවා මේ කතාව. ඇතිවෙන ආකාරයෙන්ම නැතිවෙන ආකාරය දකින්නෙ කොහොමද? කියල ඒක තමයි අනුසෝතයයි පටිසෝතයයි දෙපැත්තට කැරකෙන තැන. මේකෙ ආත්මයක් හැදෙන හැටිත්, ආත්මයක් නැතිවෙන හැටිත් දකින හැකියාව, භාවිත කිරීමක් සිද්ධ වෙනවා.

ඇත්තට මේක මහ ආශ්චර්යයක්. මේක නම් දකින්නම ඕනි කාරණාවක්. මේක තමයි ඇත්තටම අපි මේ නිතරම කන බොන හැම අපි ආහාරය වලඳන්න ඕනි මේක අවබෝධ කරගන්න. අපි මේ සිව්පසේ පරිභෝජනය කරන්න ඕනි මේක අවබෝධ කරගන්න. දැන් මොකක්ද මේ හැදෙන සිස්ටම් එක කියල මොකද්ද මේ හැදෙන සිස්ටම් එක. මේ සිස්ටම් එක හැදෙන විදිහ දැක්කාම මේක බලගැන්වෙනවා. එතකොට මේක දෙයක් වගේ ශබ්දය වර්ණය එකතු වෙලා දෙයක් වගේ. අපි දැන්

මේ දීර්ඝ කාලයක් බලගන්වගෙන ඉන්න බව බලගැන්විලා තියෙන්නෙ. අපි අසුවෙලා ඉන්න බව, අපි දැන් දිය සුළිය පැත්තට වැටුණු අර නිකන් අර කැරකි කැරකි තියෙන රොඩ්ඩක් වගේ.

අපි දිය සුළියක් දිහා අපි දැක්කොත් ගඟේ වුණත් වතුර වල දැකලා තියෙනවා කැරකි කැරකි තියෙනවා. එතකොට අපි දැකල තියෙනවා එතනට කොළයක් වැටුණොත් ඒකත් කැරකි කැරකි තියෙනවා. අපිත් නිකම් මෙන්න මේ දිය සුළියට අසුවූ අර නිකම් අර කොළයක් වගේ. ඔහේ කැරකි කැරකි දැන් මේව ඔක්කොම අර සේරම ඇත්ත කරගෙන ඔහේ කැරකි කැරකි තියෙනවා. සේරම ඇත්ත වෙවී ඔහේ කැරකි කැරකි කැරකි කැරකි තිබුණාට මේකෙ ඇත්තක් නැහැ. මේ තියෙන්නෙ ශබ්ද, වර්ණ ටිකක්. දරුවා කියන්නෙ ශබ්දයයි, වර්ණයයි කිව්වොත් දරා ගන්න බැහැ. අපේ අම්මලාට, "ඒක වෙන්නෙ කොහොමද දරුව කියන්නෙ දරුවට. ඒක ශබ්දයයි, වර්ණයයි වෙන්නෙ කොහොමද? නෑ, මේ ඇසට ආවේ වර්ණය කනට ආවේ දරුව කියන ශබ්දය. ඔය දෙක තමයි දැන් මේ ශබ්දයයි වර්ණයයි තමයි දරුව කියල ඔයිට වැඩිය දෙයක් නැහැ.

ඔබතුමියට නින්ද ගියාම හීනෙන් පේන්නෙ වර්ණය. ඒ දරුව කියන අර සංඥාව තියෙනවා. හැබැයි ඒ දරුව හොඳ දරුව නරක දරුව ඒ දරුව මම නිතරම නිතරම මම දැකපු මම ආදරය කරපු නිතරම පුතේ දුවේ කියල අතගාපු අර බලගන්වපු අර පිහිය මුවත් තියෙනවා වගේ, නිතරම මේක අර අපි ඇති කරල තියෙනවා බලයක්. මේකේ අර මේ විහින්ම මේක තමයි අභිසංකරණය අවබෝධ කරගන්න තියෙන අමාරුකම. මේ දරුව කොහොමද බලගැන් වුණේ කියලා. අන්න දෙයක් කොහොමද හැදුණෙ කියලා. භවය හැදුණෙ කොහොමද කියලා. අර භවය දෙයක් බවට පත් උනේ නැවත නැවත බැලිල්ල නිසා. හැබැයි අපිට පුළුවන් කාටුන් හදන්න. අපිට පුළුවන් අර පිටු 200 පොතක් අරගෙන දුවන ළමයෙක් ඇඳලා පිටු පෙරළලා මේ ළමයා දුවනවා කියන එක දකින්න. අපිට පුළුවන් අර කැමරාවෙ වගේ, රීල් එකක් දාලා පින්තූර ගොඩක් ගත්තා වගේ ප්‍රොජෙක්ටර් එකකින් මේක යවලා ෆිල්ම් එකක් වගේ අර දකින්න හැකියාව තියෙනව.

අපි දන්නවා කාටුන් හැදුවෙ ඔය ක්‍රමේට. අපි දන්නවා පින්තූර ගොඩාක් ඇඳල වේගෙන් ප්‍රොජෙක්ටරේකින් යවනවා. යවන කොට අර සේරම චිත්‍රපටිය වගේ සේරම පේනවා. එතකොට එක පින්තූරෙකින් මේක සිද්දවෙන්නේ නැහැ. මේක වේගෙට පින්තූර ගොඩක් යනකොට අපිට ඒක ඇස්බැන්දුම් වගේ එකක් තමයි මේකෙ තියෙන්නේ. අපි සිනමා ශාලාවට ගිහින් චිත්‍රපටියක් බලන් ඉන්න කොට පිටි පස්සෙ ප්‍රොජෙක්ටරයක් දාල තියෙන ඒකෙ රීල් එකක් දාලා තියෙනවා. ඒක දුවනවා. පින්තූර වේගෙන් යනකොට අපි හිතනව චිත්‍රපටියක් කියල. මේක තමයි සිද්ධ වෙන්නෙ. ඕක තමයි ෆිල්ම් හෝල් එකේ සිද්ධ වෙන්නෙ. එතකොට අපි බලන්න ඉන්නව තිරය දිහා. පිටිපස්සෙන් යනවා වේගෙන් පින්තූර ටිකක්. ඒකට ඉස්සරහින් ෆිල්ම් එක වගේ දුවනවා. වැඩ කරනවා. ඒවා අර පිටු 200 පොත පෙරළුවා වගේ තමයි.

එතකොට මේ සිද්ධ වෙන්නෙ ඒකම නෙමෙයිද? සංඛාරා කියන්නෙ මේකට. සංඛාරා කියන්නෙ මේ ශබ්ද වර්ණ වේගයට බලගැන්විලා දෙයක් වගේ අපිට දැන් හීනෙනුත් පේනවා. අර දැන් අපි දන්නවා සාමාන්‍යයෙන් කෙනෙක් ඉපදිලා දැන් තරුණ වයසට එනව නම් එයාට කවුරුවත් සමහරවිට දැන් මුලින් මහත්තයෙක් හිටියෙත් නෑ, නෝනා කෙනෙක් හිටියෙත් නැහැ. පස්සෙ මහත්තයෙක් හම්බ වුණා. පස්සෙ කසාද බඳිනව. පස්සෙ දරුවෙක් හම්බ වෙනවා. දැන් දරුව, දරුවගෙන් පිට ලෝකයක් නැහැ. පස්සෙ මහත්තයා දැන් ඊට පස්සෙ... මේක පුදුම බන්දනයක්නෙ. මේක පුදුම බන්ධනයක්නෙ.

දැන් මේ දරුව බැඳෙන විදිහට නෙමෙයිද? දැන් අපි මොන්ටිසෝරි යන දරුවෙක් දිහා බැලුවොත් එහෙම මකන කෑල්ලක් දුන්නත් පැන්සලක් දුන්නත් පාට පාට බලලා මේකෙ බැඳෙනවා. ඊට පස්සෙ ඒ දරුවට අර ඇස් වලට දැකපු පාට වලට ආසාවට කෑම පෙට්ටියයි බෝතලයයි හොඳට බලන්නකෝ, මේ දරුවට පොඩි දරුවකුගෙ හැම තැනම ධර්මය තියෙනවා. බලන්න වතුර බෝතලේ, පැන්සල් පෙට්ටිය, මකන කෑල්ල, පැන්සල මේවා දීල ළමයි රවට්ටන්නත් පුළුවන්. ටොෆියක් දීල රවට්ටන්නත් පුළුවන්. චොක්ලට් කෑල්ලක් දීල රවට්ටන්නත් පුළුවන්.

ඇයි මේ, ලොකු එක්කෙනෙක්ව රවට්ටන්න බෑ. ඇයි ඒ, අර ඇහැට කනට දිවට නාසයට අර ටික නේද අර පිනවන්නෙ. අර මොන්ටිසෝරි දරුවා පිනවනවා නේද? අර පොඩි පොඩි දේවල් ටික එතකොට ලොකු වෙනකොට මොකද වෙන්නෙ. ඊට වැඩිය ඒවා එනව පිනවන්න.

පොඩි කාලෙ පිනෙව්වෙ වර්ණ ටිකයි, ශබ්ද ටිකයි ගන්ධ ටිකයි රස ටිකයි. ටික ටික ලොකු වෙන කොට මොකද වෙන්නෙ. අර වර්ණ, ගන්ධ, රස ටික පිනවනව වෙනුවට, ඊට වැඩිය දෙයක් හදාගෙන ඒ දේවල් පිනවන්න යනවා. අරක සාමාන්‍යයෙන් එපා වෙනව නේද ටිකක් කල් යනකොට. ඒක දැකල දැකල අපිට එපා වෙනව නේද ටිකක් කල් යනකොට. ඒක දැකල දැකල. අපිට එපා වෙනවටත් වැඩිය, ඒක ස්ථාවර වෙලයි සිද්ධ වෙන්නෙ. ඒ කියන්නෙ පඩි පෙළක් උඩට නැගල පඩිපෙළ උඩ ස්ථාවර වෙලයි ඊගාව පඩියට නැග්ගෙ වගේ. අර දිගටම පඩිපෙළ ටික නැඟ නැඟ යනවා. මේකෙ බැසීමක් නැහැ. ඔක්කොම ඇත්ත වෙවී තමයි "අභිසංකරණයක්" වෙන්නෙ. දැන් ඕකම නේද ආයතන පිනවනවා කියල කරන්නෙ. දැන් බලන්න පුංචි දරුවට දැන් ඔය පැන්සල් පෙට්ටියටයි, ඔය මකනෙටයි ඕකට ආස හිතුණොත් දැන් අපිට ඕකට ආස හිතෙන්නෙ නැහැනෙ.

අපි ආයතන පිනවනව කියල කරල තියෙන්නෙ, පොඩි දරුව ආයතන පිනවනෙ එහෙම කියනව නම්. දැන් ඒ දරුව මොකුත් දන්නෙ නැතුවට ඒ දරුව පළවෙනි වතාවට අර අපි කියන්නෙ අර ස්‍රසවීය ස්වභාවය. සෙන්සස්වල ඇලෙන ගතිය. මේකනෙ සංසාර ගමනට හේතුව. සංසාර ගමනට හේතුව. අපේ කියන 'ආස්‍රව' ආස්‍රව තමයි අපේ මේ සසර ගමන ගෙනියන්නෙ. "තණ්හාව නමැති වඩුවා තා මා දිටිමි. තාට නැවත නිවසක් සෑදීමට ඉඩ නොදෙමි කියනකොට නමැති තණ්හාවෙ ප්‍රභේද තමයි 'රාග, ද්වේශ, මෝහ යන කෙලෙස. ඒක තමයි තණ්හාවෙ ප්‍රභේධ. එතකොට තණ්හාව කියන්නෙ අපි දන්නව 'කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා එහෙම නැත්නම් පෝනෝභවිකා නන්දිරාග සාගතා තත්‍ර තත්‍රාභිනන්දනී. එතකොට මේ මොනව කිව්වත් කියන්නෙ ගම් එකක ස්වභාවයක්. බන්ධන ඇලෙන ගතියක්. මේ හැම එකේම තියෙන්නෙ අභිසංකරණයක්. එතකොට මේ හැම එකම උපාදානයක්.

මේ වචන ගොඩක් විතරයි. මේ ඔක්කොම වචන සංඛාරා. වචන භාවිත කරනවා විතරයි. මෙතන අවබෝධය තමයි වැදගත් වෙන්නෙ.

එතකොට ස්‍රාසවීයයි කියන්නෙ මේ ඔක්කොගේම ස්ප්‍රිට් එක වගේ. ස්‍රාසවීයයි කියන්නෙ. ඒ කියන්නෙ මේ පුංචි දරුවගෙ ආයතනවලම තියෙනවා. ගම් එක ඇලෙන ශබ්දයක් ආවම ඒකට ඇලෙනවා. වර්ණයක් ආවම ඒකට ඇලෙනවා. ඒ විතරක් ඇලිලා නවතින්නෑ. ශබ්ද වර්ණ දෙකට ම ඇලෙනවා. ඊට පස්සෙ දෙයක් වගේ දැනෙනවා. එතන ඉඳල එකින් එක එකින් එක ඇහිඳ ඇහිඳ යන එකක් තමයි පේන්නෙ. අර අපි වෙරළු ගස් යට වෙරළු ඇහිඳිනව වගේ එක එක ගෙඩිය ගෙඩිය අන්න ඒ වගේ තමයි පොඩි දරුවෙක් මේ ඔක්කොම එක එක අල්ලගෙන අල්ලගෙන අල්ලගෙන අල්ලගෙන මුළු ලෝකයක් ම ගව් එක වගේ බදාගෙන අන්තිමට. ලොකු වෙනකොට අත්හැර ගන්න බැහැ නේද? මේක නේද මේ මුළු කතාවෙම තියෙන්නෙ. මේ කතාවම අපිට හොඳට පැහැදිලියි. එතකොට දැන් අපි තාමත් කරන්නෙ ඔය ටිකමයි. අර ආපු ගමනට ඔහේ අනුසෝතය තුළ ගලපු ගැලිල්ලට ඔහේ යන්න හදනවා. ගහගෙන යනවා. ඔහේ අර දිය සුළිය වගේ කැරකි කැරකි කැරකි කැරකි ඔහේ ඕකම කර කර යනවා, දිගටම. හැබැයි මේ ධර්මය දකින කොට තමයි අන්න මේකේ අර ස්වභාවය තමයි දිගටම මේකෙ සාමාන්‍ය ස්වභාවය තමයි මේක ආයතන ටික වැඩ කරනවා මනායතනයෙන් මේකෙ අවබෝධය ඇති කරනවා.

මනායතනයෙන් ඇති කරන කොට ආයතනවල ස්වභාවය මනායතනයෙන්, සිහියෙන් මේක අසුවෙනවා. අපිට තියෙනවා දැනෙන ස්වභාවයක්. හිතන ස්වභාවය වෙනයි. දැනෙන ස්වභාවය වෙනයි. හිතන හිතන හිතන හිතන එක ම තමයි අර අභ්‍යන්තර පරිවර්තනය. දැනෙන දැනෙන බලගැන්වෙන, මේක තියෙනවා අර බේස් එකක් වගේ අපිට බලගැන්වෙන තදබල විදිහට මේක බන්ධන බලයක අරටුව වගේ එන එකක්. අන්න එතනට තමයි මේ පහර වදින්නෙ. අවබෝධය එන්නෙ. අර සද්ධර්මය ශ්‍රවණය තුළ සිද්ධ වෙන්නෙ. මේක නිතරම නිතරම මෙයාට මෙනෙහි වෙන්න ගන්නව මේකේ සත්‍යය පැත්ත. මේ ආත්ම කතාව නෙමේ මේක හැදෙන්නෙ කොහොමද කියන එක නිතරම මෙනෙහි

වෙන කෙනාට අර 'චන්දං ජනේති' තියෙන්න ඕනි. එයාට ඕනිකමක්, ඡන්දං ජනේති 'වායමතී' වෑයම් කරන්න ඕනි ඒක දකින්නත්. වායමතී වීරියත් ඒකට වීරියත් තියෙන්න ඕනි. 'ආරාභති චිත්තං පග්ගාති පජහතී ඒකට සතර සම්‍යක ප්‍රධාන වීර්ය කියන එක. මේ කටයුත්තෙ බැසගෙන තියෙනවා මේ මුල් අවස්ථාවෙ යෝගාවචර භූමියෙ.

දැන් මෙහෙනින් වහන්සේලාට කතා කරන තැන. එතකොට මෙතනදි දැන් සාමාන්‍යයෙන් එකපාරටම මේ බිත්තියක අර ස්විච් එකක් දැම්ම වගේ එකපාරටම මේක වෙන්නෙ නැත්තෙ අර මේ සංකත ධර්ම සකස් වෙලා තියෙන්නෙ නැවත නැවත බලගැන්විලා. ඒක එතකොට දියවෙන්නෙත් ටිකෙන් ටික. අනිත් පැත්තට කැරකෙන්න ඕනි. පටිසෝත කිව්වෙ ඒකයි.

**මෙහෙ. වහන්සඃ** එහෙමයි.

**ආර්යයන් වහන්සඃ** අනුසෝතය බලගැන්වුණ ආකාරයටම ඊට සත්‍ය දකින එකත් පටිසෝතය තුළ අනිත් පැත්තට කැරෙකන්න ඕනි. බඹරෙ මේ අතට කරකෝන කොට මේ අතට කැරකෙනවා. අනිත් පැත්තට කැරකෙන කොට බඹරෙ බලය නැති වෙනවා. මේ සත්‍ය දකින එකයි මේකෙ තියෙන්නෙ. සත්‍යය දකින එක ඇත්තටම කෙන කෙනාගෙ නුවණ අනුවයි වෙන්නෙ. ඒකෙ කොයිතරම් ප්‍රමාණෙකට ද අර තීව්‍රතාව කියන එක තමයි, අර බලය කියන එකතමයි තණ්හාව ක්ෂය වෙනවා කියන්නෙ. රාග, ද්වේෂ, මෝහ කෙලෙස් සංසිඳෙනවා කියන එක. ඒක සිද්ධ වෙන්නෙ තම තමාගෙ නුවණ අනුව. තම තමන්ගෙ ඒකට තියෙන අභ්‍යන්තරයෙන් තියෙන කුසලය අනුව, ඒ කුසලය කියන්නෙ ඕකයි. එතන කුසලෙ ඇත්තටම ඇවිල්ල මෙතන සිහියටයි මේක අහුවෙන්නෙ. මේක ඥානෙට අසුවෙනවා. සිහියට අසුවෙනවා. එතකොට මේක හොඳටම දැනෙනවා අභ්‍යන්තරයට. අභ්‍යන්තරයට දැනෙන එක තමයි මේ සිහිය කියන්නෙ. තව පැත්තකින්. ඒත් හැබැයි විඤ්ඤානයට අයිති එකක් නෙමෙයි මේ කතාව.

විඤ්ඤාණය කෙළින්ම අර, ශබ්ද, වර්ණවලින් හද හද දෙන එකමයි විඤ්ඤාණය. එය හද හද දෙන එක වෙනස් වෙවී දුන්නත්,

විඤ්ඤාණයක්මයි. හැබැයි මේ සිහිය කියන එක එහෙම එකක් නෙමෙයි. හැමදේටම සිහියක් තියෙනවා, මේක දකින එක සිහියක් තියෙනවා. දියවෙන එක සිහියක් තියෙනවා. රැවටෙන එක සිහියක් තියෙනවා. හැමදේටම සිහියක් පවතිනවා. ඒක නිසා තමයි මේක විසඳෙන්නෙ සිහිය හරහාමයි. ඇත්තටම අපි විශාල පරිවර්තනයකට මෙතන ලක්වෙනව. හැබැයි ඔය සිහිය කියන එකත්, මෙච්චර කාලයක් මේ ධර්මය දකින්න කලින් එකතු වෙලා තිබුණෙ අභිසංකරණය පැත්තටම තමයි. ඒ සිහිය කියන එක දෙනවා. අර තව තව ප්‍රණීතවත් කරල රසවත් කරල උපාදානය තව හොඳට ශක්තිමත් කරල තව තව ලෝකෙ ඒ තව තව තදින් ම බැස ගන්න විදිහට තමයි ස්වභාදහම විසින් ඕක හදල තියෙන්නෙ. ඔය නිර්ණය සිද්ධ වෙන්නෙ එහෙමයි.

අපි විසින්ම තමයි ඇත්තටම මේ නිවන් මග නිවන් දකින එක සිද්ධ වෙන්නෙ. මේක අපි, අපි ඒ කියන්නෙ වීර්යයක් අරගෙන කරන්න ඕනි එකක්. පටිසෝතය ඉබේ සිද්ධ වෙන එකක් නෙවෙයි. **ඉබේ සිද්ධ වෙන්නෙ අනුසෝතය**. හැබැයි මේක **අනිත් පැත්තට කරකවන්න ගත්තට පස්සෙ පටිසෝතය, ඉබේ කැරකෙන්න ගන්නව අනිත් පැත්තට**. මේකෙ මූලය තමයි, ආරද්ධ වීර්ය තමයි මෙතන වැදගත් වෙන්නේ මේකෙ මූලය. හැබැයි මෙන්න මෙහෙම දෙයක් තියෙනවා මේකෙ මුල් අවස්ථාවෙ මේ පරිවර්තනය මේ යන ගමන තමන්ට හොඳට සිහියට අසුවෙන්න ඕනි. අභ්‍යන්තරයෙන් සිස්ටම් එකේම 'ඔටෝ මැටිකලි' පටිසෝතයට කැරකෙන එකක් තමන්ට අසුවෙනවා. හැබැයි කිසිම වෙලාවක මේ විඤ්ඤාණ මායාව හැම එකක් උඩම පතිත වෙනවා. ඒක නිසා මායාව හැම තිස්සෙම බලන්නෙම ලෝකය හදන්නම තමයි. භවය හදන එකම තමයි මේ සිස්ටම් එකේ තියෙන්නෙ.

හැබැයි භවය අනිත් පැත්තට කැරකෙන එක සිහියකින් හිටියොත් තමයි, දියවෙලාම යනකම් හිටියොත් තමයි. ඒක ආයෙත් හට නොගන්න බවට දැනෙනකම්ම ඒ සිස්ටම් එක ඇතුළට, හරියටම ඒ මාර්ගය තුළ ගියොත් තමයි මේ දේ සිද්ධ වෙන්නෙ. හැබැයි සෝතාපන්න පැත්තට හැරෙනව කියන්නෙ විශාල දෙයක්. බාහිර ඇත්තක් නෙමෙයි කියල මෙනෙහි වෙන්න ගත්තට පස්සෙ ආයේ බාහිර ඇත්ත වෙන්නෙ නැහැ.

ඒක විශාල පරිවර්තනයක්. ඒක නිසා තමයි බුදුන් වහන්සේ දේශනා කරන්නෙ නිවනට නැමුණක් කොට, ගසක් ගඟට ඇලවී තිබේ ද ඒ ගස ගඟටමයි වැටෙන්නෙ. මහණෙනි මේ නිවනට නැමුණක් කොට පවතින කෙනා නිවනින්ම සැනසීම ලබනවා 'වොස්සග්ග පරිනාම' කියන වචනෙ.

මේක ඇත්තටම මේකෙ විශාල කටයුත්තක් ධර්මය නම් අතිවිශාල පරියායක් දේශනා කරල තියෙනවා. ඉතාම අපි හිතනව මේ යුගයේ මේ දේශනා මාලාවක් තුළින් නිවන් මග විවර වෙනවා. බොහෝ අයට ඒක හමුවෙනවා. හැබැයි අර අභ්‍යන්තර පරිවර්තනයට යන කාලෙ, හැමෝටම යනවා. ඒක නිසා තමයි අපි නිහඬව අවුරුද්දක් දෙකක් ඉන්නව කියල හිතුවේ. මේ හැමෝම වෙනස් වෙලා පරිසරය සුදුසු විදිහට අඩු තරමේ පිරිසක් ගොඩනැගිල ඒ පිරිස අතරින් බලයක් ශක්තියක් ඇතිවෙලා ඒ පිරිස අතරින්ම මේ සමාජයේ තියෙන දෘෂ්ටියට යම්කිසි බලයක් එන්න ඕනි කියල අනිත් අයට සත්‍යය අවධි වෙන්න. ඒ නිසා අපි ටිකක් නිහඬව ඉන්න ඕනි කියන අදහස තමයි අපි ගාව තියෙන්නෙ. මේ ඒකට සුදුසු කාලය එන බව තේරෙනවා. ටිකෙන් ටික ටිකෙන් ටික. ඒත් අපි හිතන විදිහට ඇත්තටම අපේ ඥානයට හසුවෙන දේ නිවැරදි බව හොඳටම තේරෙනවා. දැන් සිද්ධ වීගෙන යන හැම දෙයක් ම ඒ අපි හිතන අපිට දර්ශනය යමක් අපි දකිනවා. අපි දකිනවා ඉදිරියේ යමක්. අන්න ඒ දේ සිද්ධ වේගෙන යනවා. ඇත්තටම බුද්දෝත්පාද කාලය නැවතත් ඒ බුද්ධෝත්පාදය ඇතිවීගෙන යනවා.

ඉතිං මේක අර යමෙක් මේ දහම අවබෝධ කරයි ද, මේ සත්‍ය ලෝකයට හෙළි කරයි ද ඒ අනිත් අයටත් ඒ අභ්‍යන්තරයට පරිවර්තනය වෙන්න කාලයක් අවශ්‍ය වෙනවා. පොඩි කාලයක් හරි. ඒක දැන් සිද්ධ වීගෙන යනවා. ඉතිං මේ දහම අවබෝධ උන අයට ඇත්තටම මේ කෙනෙක් පුද්ගලයෙක් නැහැ. සත්ව පුද්ගල කතාවක් නැහැ. හැමදේම හයක්ම එකම ස්වභාවයක් බවට පත්වෙනවා. සත්‍ය දකින කොට. සත්‍ය දකින ස්වභාවය, ලෝක ස්වභාව වෙනව නම් තමයි වඩා හොඳ මේක බලමු අපි කොයිතරම් දුරට වේවිද කියන එක.

හැබැයි හැම යුගයකම මේ වගේ ලේසි නැහැ මොකද අනුසෝතය තමයි ලෝකෙ කැරකෙන දිශාව. පටිසෝතයට යනව කියන්නෙ මේක

ඇත්තටම ආශ්චර්යයක්. මේක මහා ආශ්චර්යයක්. ඇත්තටම අත්භූත දුර්ලභ, දුර්ලභං සද්ධර්ම ශ්‍රවණං, දුර්ලභං ක්ෂණ සම්පත්තිං, දුර්ලභං පතිරූපදේශවාසෝත කිව්ව වගේ මේ සද්ධර්ම ශ්‍රවණය අති දුර්ලභයි, ඒක නම් මේ හරි ලේසියි ගඟ ගලන අතට යන්න. ඔය ආයතන ටික පිනවගෙන සාමාන්‍ය විදියට යනවා. හැබැයි මේ දහම ඇහුණට පසු ඒක අපි හිතනව ගොඩක් වෙලාවට සත්‍යයට බොහෝ අය, සත්‍යය දැනෙන කෙනා සත්‍යටම තමයි හැරෙන්නෙ. ආයතන පිනවන එක ගැන මොනවද තියෙන දැන් තව ප්‍රශ්න ඒ පැත්තෙන් බැලුවොත් ආයතන සාමාන්‍යයෙන්, අපේ ආයතනවල ස්වභාවය කොහොමත් ඒක දැනෙන ස්වභාවයක් තියෙනවා. ධර්මයෙන් මෙනෙහි වෙන්නම ඕනි ඒ තැන්වලින්.

**මෙහෙ වහන්සඃ** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සඃ** තව ටිකක් එතන ප්‍රශ්න කළත්, ඒ අර උදාහරණ කියල අර මෙහෙනින් වහන්සේ කිව්ව වගේ උදාහරණයක් සහිතව කියන්න කියල.

**මෙහෙ වහන්සඃ** එහෙමයි ආර්යයන් වහන්ස. දැන් මෑණියන් වහන්සේ සෙරෙප්පු පාවිච්චි කරන්නෙ නැතිව උන්වහන්සේ යනවා පෙනෙනකොට දැන් සෙරෙප්පු පාවිච්චි නොකර ඉන්න ඕනි කියල ආවත් ඒකට අකමැති ස්වභාවයක් ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සඃ** ඒක පුරුද්දෙන් එන්නෙ. දැන් සෙරෙප්පු පාවිච්චි නොකර පුරුද්ද ඇති වුණ කෙනාට ඒක සුඛයි කියල දැනෙනවා. ඒක සුඛයක් වගේ දැනෙන්නත් පුළුවන්. හැබැයි සෙරෙප්පු පාවිච්චි කරපු කෙනාට සෙරෙප්පු සුඛයක් වගේ දැනෙනවා. (සැපයක් වගේ.) ඒ කියන්නෙ ඒක තියෙන්නෙ අර කැමැත්තක්, අකමැත්තක්. ඒකෙත් තියෙන්නෙ අර ඇලෙන ගැටෙන ස්වභාවයක්මයි. නැත්නම් ඕක සෙරෙප්පු තිබුණත් එකයි, නැතත් එකයි. ඇලෙන්නෙ ගැටෙන්නේ නැත්නම් ඒකෙ ප්‍රශ්නයක් නැහැ.

**මෙහෙ වහන්සඃ** එහෙමයි ආර්යයන් වහන්ස. සමාවෙන්න ආර්යයන් වහන්ස. එහෙම නෙමෙයි, ඉස්සර මට සෙරෙප්පු නොදා ඉන්න බැහැ.

වැලි පෑගෙන කොට ඒවා මේවා එහෙම තිබුණා. දැන් අර ඒක ඒකත් ඕනි නැහැ වගේ. අන්න එහෙම එකක්. මට සෙරෙප්පු නොදා ඉන්න බැරි තත්ත්වයක් තිබුණා ඒ කාලෙ.

**ආර්යයන් වහන්සෘ** ඔව්, ඒක තමයි අපි අර සෙරෙප්පු කියන එකෙන් අපි අර පුරුද්ද නැති නිසානෙ සෙරෙප්පු පාවිච්චි නොකර ඉන්න බැරි. ඊට පස්සෙ සෙරෙප්පු පාවිච්චි නොකර ඉන්න පුරුදු වුණාම ඒක ගාණක් නෑ නේ. අර එතන තියෙන්නෙ අපේ අර පුරුද්දක්නෙ තියෙන්නෙ. අපි මේ පුරුදු ටිකත් දැන් මේ. භවයක් කියෙන්නෙ දෙයක් කරගන්න එකනෙ. එතකොට දෙයක් කර ගන්නෙ පුරුද්දක් නිසානෙ. ඒකයි සංඥා අභිසංකරණයක් කිව්වේ. දැන් ඔය සෙරෙප්පු කියන එක අර වචනෙ ගත්තොත් සෙරෙප්පු ශබ්දෙන් ගත්තොත් රූපෙන් ගත්තොත් එය සෙරෙප්පුවේ රූපෙ. හැබැයි ඒකටත් එහා ගිය සෙරෙප්පුව කියල දැනෙන එකකුත් තියෙනවානෙ කකුලට දැනෙන එකක් සෙරෙප්පුව කියලා. එතකොට ඒක වෙනම එකක්. එතකොට ඔය ආකාර තුනකින් ඒ කියන්නෙ කාම, රූප, අරූප කියලා. එතකොට අපි කතා කරනවනෙ කාමාශ්‍රව, භවාශ්‍රව, දිට්ටාශ්‍රව. මේ ඔක්කොම මේ කතාවෙ තියෙනවා. අපිට දෙයක් කතා කරන්න ගියොත් සේරම මේකෙ තියෙනවා. බලනකොට ඒ කියන්නෙ හේතුව ඔතන තියෙනවා. දැන් ඒකට තියෙන ඇල්ම ඒකට තියෙන රූප සංඥා ස්වභාවය. ඒකට තියෙන අර දෙයක් වගේ දැනෙන එක. ඔය ඔක්කොම තියෙන්නෙ ඔය කතාවෙ.

ඔය භවය නිකන් හැදෙන්නෙ නැහැ. ඔය අරමුණ භවයක් දෙයක් කියල ගත්තෝ "අජ්ඣෝසාය තිට්ඨති යාරූපේනන්දි - තදූපදානං භවෝ" ඒකයි සෙරෙප්පු කියල දෙයක් කරගෙන ඒ මත්තෙ අපි සෙරෙප්පු දෙයක් කරගෙන. නමුත් සෙරෙප්පු කියල දෙයක් කරගෙන කතා කරන්න ඕනිත් නැහැ. ඒ වුණාට ඕක දෙයක් නෙමෙයි. කවුරුහරි පාවිච්චි කරොත් හිතන්නෙ නැතිව එතනත් ඒක ගාණක් නැහැ. ඔන්න ඔය වගේ දෙයක්. සෙරෙප්පු පාවිච්චි කරනවද නැද්ද කියන එක අදාළ නෑ, මෙතන අදාළ, දෙයක් කර ගත්තද නැද්ද කියන එකයි. එතනයි මිදීම තියෙන්නේ. ඒක හරියටම හරි. තව ඒ වගේ කතා කරන්න බලන්න.

**මෙහෙ. වහන්සඃ** ඒ වගේ ආර්යයන් වහන්ස අර එහෙම දැනෙන ස්වභාවය තියෙනවනෙ. ඒ කියන්නෙ ආයතන පිනවන්න කැමති ස්වභාවය. ඒ වගේ. දැන් අද විටමින් එකක් පූජා කරා. දැන් ඒක හොඳයි කියල ආර්යයන් වහන්ස දැන් මෙතන මෙහෙම අපි දකිනවා.

**ආර්යයන් වහන්සඃ** මෙහෙම දෙයක් තියෙනවා. දැන් හොඳයි කියල හිතෙන එක මනෝ සංඛාරයෙන් එන දෙයක්, හොඳයි කියල හිතන එක. නරකයි කියල හිතන එකත් මනෝ සංඛාරයෙන් එන දෙයක්, ඔය හොඳයි කියල හිතන එක මනෝ සංකාරයෙන් දෙයක් කර ගත්තාම ඒක අපි ඒක දෙයක් කරගෙන ඒකට ඇබ්බැහි වෙනවා. හොඳයි හොඳයිනෙ. හොඳ හින්දා කනවා, දැන් කවුරුහරි කියනවා අපිට කාමරංකා හොඳයි කාමරංකා හොඳයි කියලා හිතලා කාමරංකා කනවා. කාමරංකා කාලා වැඩි වුණොත් ඒකත් අපත්‍ය වෙනවා. ඔන්න ඔය වගේ අපි අර හොඳයි කියලා හිතන එකත් දෙයක් කරගෙන අපි ඒකත් අභිසංකරණය කර ගන්නවා. දැන් අපි දරුවෝ හොඳයි නේද? හොඳ දරුවා මේ දරුවා නරකයි අර මනෝ සංඛාර ගොඩක් අයට මේ පැටලෙනවා. හැබැයි මේ අභිසංකරණය හැම පැත්තෙන් ම එනවා. ආයතන හයෙන්ම එනවා. ඔය ආයතන හයෙන්ම හොඳ දරුවෙක් කියලා දෙයක් කරගෙන නරක දරුවා කියලා දෙයක් කරගෙන දැන් දරුවා දරුවා කියලා දෙයක් කරගෙන මගේ දරුවා නෙමෙයි කියලා. මගේ දරුවා නෙමෙයි කියන එකත් දෙයක් කරගෙන මේක හරි පුදුම කතාවක් නේද?

**මෙහෙ. වහන්සඃ** එහෙමයි ආර්යයන් වහන්ස,

**ආර්යයන් වහන්සඃ** හැම පැත්තෙන්ම එනවා, මේකෙන් ගැලවෙන්න නම් හොඳ අවබෝධයක් තියෙන්න ඕනේ. දැන් ඔය ආයතන හයම ගැන අන්න එතකොට නිදහස්. අන්න දෙයක් කරගෙන නැහැ. සෙරෙප්පු තිබ්බත් එකයි. නැතත් එකයි. දැන් දෙයක් කරගෙන නැහැ. ඇලෙන්නෙත් නැහැ. ගැටෙන්නෙත් නැහැ. අර අන්න අන්න "ඒතං ශාන්තං ඒතං ප්‍රණීතං" අන්න නිවන එතැන. ඒ අරමුණෝ මිදීම. ඒ එන එන අරමුණෙන් මිදීම. "තත්ත තත්ත්‍ර විපස්සති" අන්න එතන එතන දැකල මිදෙනවා. අන්න නිවන් මග. ප්‍රායෝගික පැත්තයි මේ කතා කරන්නෙ. එතකොට

හොඳටම තමන්ට හැම අරමුණකම නිවන අත්දකින්න පුළුවන් විදිහට පේනවා. කෑමක් ගත්තත් එහෙමයි. හැමතැනටම එහෙමයි.

දැන් සුළඟ වුණත් එහෙමයි. මෙතන හොඳට හුළං තියෙනවා. ඔන්න එතනට යනවා. පස්සෙ පුටුවක් ගෙනත් තියාගන්නව. දැන් ඒකත් දෙයක් කරගෙනනෙ. එහෙම කිසිම දෙයක් කරගන්නෙ නැතිව එතන ඉන්න පුළුවන් ඕනි නම්. හරි සරලයි එතන. එතන ඉන්න පුළුවන්. ඕනි නම් හිටිය, නැතිනම් නැහැ. ගාණක් නැහැ එතකොට. හුළං තිබ්බත් එකයි. නැතත් එකයි. මං කියනවා කවුරුහරි කිව්වොත් ඔයා ඔතන හිටියා ඇති කියලා මට හිටියත් එකයි, නැතත් එකයි කියලා හිතාගෙන යනවා. මොකුත් කියන්න යන්න ඕනි නැහැ. ඒක තමන් දෙයක් කරගෙන නැත්නම් තමන්ට අදහසක් නැහැ. මෙතන තමන් දෙයක් කරගෙන නැත්නම් කවුරු මොනවා කිව්වත් කමක් නැහැ. තමන්ට අදහසක් නැහැ. පරණ පුරුද්ද අභිසංකරණයකට කොටු වෙනවා. මොනවහරි කියන්න ගියොත් ඔය වචනෙ ඒකට හේතුවක් වෙනවා. අපි පරණ පුරුද්දට කියවනවා. පරණ පුරුද්දට කියවන කොටත් ඔය ගොඩට වැටෙනවා.

ඔය අභිසංකරණ ගොඩටම වැටෙනවා. ඔය නිකන් කියවන එකත් එච්චර හොඳ දෙයක් නොවෙන්න ඔන්න ඔය නිසා. දන්නෙම නැතිව ඒ අභිසංකරණ ගොඩ ඇතුළෙ ඒක අර නිකන් කියවන්න හිතන සිතුවිලි රටාව තියෙන්නෙ පරණ ක්‍රමේ. අභිසංකරණ ක්‍රමේ තියෙන්නෙ. එතනට වැටෙනව දන්නෙම නැතිව. හරි මේකට දක්ෂතාවක් තියෙන්න ඕනි. ඇත්තටම මෙතන කුසලස්ස උපසම්පදාව තියෙයි. "සබ්බපාපස්ස අකරණං" කියන්නෙ **සිතුවිලි, විඤ්ඤාණ මායාවනෙ** දෙන්නෙ, **දෙයක් කර කර.** හැබැයි **ඒකෙ සත්‍ය දකින එකනෙ කුසලස්ස උපසම්පදා** කියන්නෙ. **එහෙම වුණොත් තමයි චිත්ත දමනය** තියෙන්නෙ. අනෙක සැහැල්ලුවෙන් ඉන්න එකයි චිත්ත දමනය තුළ ඇත්තේ බුද්ධ ස්වභාවය. සියලු බුදුවරුන්ගේ අනුශාසනාව නේද? "සචිත්ත පරියෝ දපනං ඒතං බුද්ධානු සාසනං" අන්න නිවන් මග පේනවා. හොඳට පැහැදිලියි.

"සබ්බ සංඛාර සමථය" කියන්නෙ මේ සියලු සංස්කාර ධර්මයෝ සමතයි. දැන් ඇයි. වචී සංඛාර, කාය සංඛාර, මනෝ සංඛාර, මේ

එකක්වත් දැන් වැඩක් නැහැ. තේරුමක් නැහැ. ඇයි සබ්බ සංඛාර සමතයයි. කියන කොට සියලු සංස්කාර ධම්ම සමතයි කියල දෙයක් හම්බ වෙන්නේ නැහැ. මනෝමයෙන් ආවත් දෙයක් නැහැ. ක්‍රියාවෙන් ආවත් නැහැ. වචන වලත් නැහැ. අන්න සැහැල්ලුයි. දැන් ගිහිල්ලා හොඳට සැතපෙන්න පුළුවන්. හොඳට සීතලේ ගුලිවෙලා නේද?

**මෙහෙ. වහන්සः** එහෙමයි.

**ආර්යයන් වහන්සः** එහෙමයි කියල දෙයකුත් නැහැ. ඒකත් වචනයක් විතරයි. දැන් ඔක්කොටම එහෙමයි එහෙමයි කියන කොට එහෙමයි කියන එකත් දෙයක් කරගෙන එතකොට ඒකත් වචනයක් පමණයි. කියන්න දෙයක් නෑ කිව්වත් දෙයක් වෙනවා. මේක හරිම පුදුම කතාවක්. දෙයක් නැහැ කිව්වත් දෙයක් වෙනවා. මේකේ හරියට වචනත් නැහැ. මේක පුදුම කතාවක්.

**මෙහෙ. වහන්සः** මට වචන නැහැ. වචනවල අර්ථ නැහැ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සः** මේක පොඩ්ඩක් නිවෙන්න ඕන කමක් තියෙනව අභ්‍යන්තරයේ නුවණ පොඩ්ඩක් අපි දියුණු කරන්න ඕනි. අපි හොඳින් මේක නුවණින් දකින්න ඕනි. හැම පැත්තක්ම විශාල පරාසයක් තියෙනවා. අපිට මේ පොඩි දේ දකින්න වුණාට විශාල අවබෝධයකින් තමයි ඔය දේ වෙන්නෙ. දැන් අපි දකිනව මැණික් කම්කරුවෙක් මැණිකක් කපන කොට එයා කපන්නෙ අපි දකින විදිහට දියමන්ති වලට වැඩිය ඊට වැඩිය ඝන එකකින් තමයි කපන්නෙ. විදින්නෙ. මැණික මේ ඔප මට්ටම් කරන්නෙ. ඒ කියන්නෙ මේ යම්කිසි අපි ස්කන්ධ කියල කියනව නම් අපි ඝනකමක් ඒ ඝනකමේ තියෙන විශාලම ඝනකම. අපිට එතනදි භාවිත කරන්න වෙනවා. අන්න ඒ වගේ දෙයක් මේ කතාවෙ තියෙන්නෙ. තව අපි මොනවහරි මැටි ටිකක් මෙහෙම අරගෙන අනල අනල තව ටිකක් ඒක පෝරණුවෙ දාලා පුච්චිලා තවත් ඝන කරලා ගත්තොත් වගේ විශාල පරාසයක් එනවා. ඒ අවබෝධය හරහා තමයි ඒ පුංචි දේ ගැලවිලා යන්නෙ. අපිට තියෙන්නෙ මේ මෙතනම මේ මොහොතෙම මේ ඇත්තටම මේ සත්‍යයට අවධි වෙන එකයි.

බැලූ බැල්මට සරලයි. ඒක ප්‍රායෝගිකවත් එදිනෙදා අත් දකින කොට මිදෙනවා. හැබැයි නැවතත් අභිසංකරණයට එන්නෙ කොහොමද කියල බැලුවොත්. ඒ කියන්නෙ නැවත නැවත මේවා මතු වෙනවනෙ. එතකොට ඉන්නෙ කොහොමද කියල බැලුවොත් අවබෝධයට තාම පත්වෙලා නැහැ කියන එක තේරෙනවා. අර දැනුමෙන් අරගෙන හැම තිස්සෙම ගළපනව කියන යෝගාවචර භූමියේ කතාව තියෙන්නෙ. අර "මනසිකරෝති" කියන තැන තියෙන්නෙ. සවිතක්ක, සවිචාර ස්වභාවය තියෙන්නෙ අර අවබෝධය තව මදි කියන එකයි. ඒ නිසයි ධර්ම ශ්‍රවණය අවශ්‍යයි කියල කියන්නෙ. කොතනක හරි කොහේ හරි තැනක ඒ තියෙන හැම තැනම මේවා සුද්ධ වෙවී සුද්ධ වෙවී ගිහිල්ලා නිතරම අරක අවබෝධයෙන් ම තමන්ගෙ අභ්‍යන්තරයෙම සත්‍යය මෙනෙහි වෙන තැනටම තමන් පත්වෙලා ඒකත් නිතරම අභිසංකරණයෙන් තමන් ගැලවිලා සම්පූර්ණයෙන්ම ආත්ම ස්වභාවය ගිලිහිලා ඒක තමන්ගෙ අර ආසවක්‍ෂයා ඤාණයට අසුවෙලා ක්ෂයවෙන බව, ඒ ඤාණයට හසුවෙලා. අර සුකුම ස්වභාවය තමන්ගෙ ඒ ඤාණයට හසුවෙන්න ඕනි. ශාන්ත ප්‍රණීත සුවය දැනෙන්න ඕනි, ඒ සුකුම ස්වභාවය ශාන්ත ප්‍රණීත සුවය ඒක දියුණුවක් කියල දැනෙන්න, ඒකට කලින් අර හැම දේකම පිනවන ඔය පිනවන ගතිය. තියෙනකම්ම තමයි ඔය ආයතන පිනවන ගතිය තියෙන්නෙ.

ආයතන පිනවන ගතිය නැතිවෙන කොට එනවා නිබ්බිදාවක්. ඒ තුළ එනව කලකිරීමක්. ඒක තුළ එපාවීමක් එනවා. ඒක තුළ එනව ඔය භයතු පට්ඨාන ඤාණය. මේ වගේ මතක එනවා මේ **"නිබ්බිදානු ඥානයක්"**. ඒක තුළ එනවා **මග නොමග පැටලුණු "පටිසංකාර ඤාණය" මතුවෙන තැනක්. තමන්ට එපාවෙන ගතියක් එනවා.** ඔය අභිසංකරණ නිකම්ම කුඩුවෙන්නෙ නැහැ. ඔන්න ඔතනින් තමයි ඒවා අනුසෝතයට යන, ඔය අභිනන්දන ගතිය බිඳ වැටෙන්නෙ. එතකම්ම ඔය මෙහෙනින් වහන්සේලාට ඕක තියෙනවා. ඕක ඔතන **වැරදුණා වගේ දැනෙන ගතියක් එන තැනක් එනවා. අන්න එතන තමයි** මේ ධර්මය ප්‍රතිෂ්ඨාවක් වෙන්න ඕන, **පය ගහල ඉන්නඕනි තැන.**

එතනදි **තමන්ට තේරෙන්න ඕනි මේක දියුණුවක් කියන එක**. අන්න එදාටයි තමන් අර **කරකැවිල පැත්ත මාරු උනා වගේ එකපාරටම**

**තමන්ට අන්න "සංඛාර උපේක්ෂා ඤාණය" මතුවීගෙන එන්නෙ.** අන්න එතනයි. "ඒතං ශාන්තං ඒතං ප්‍රණීතං සද්දිදං සබ්බ සංඛාර සමතෝ" කියන තැනට එන්නෙ. එතකම් ඔය ආයතන පිනවන ගතිය තියෙනවා. එතනට ආපු දවසට මොනව කෑවත් පිනවීමක් නැහැ. කනවා දැනෙනවා. පිනවීම සිද්ධ වෙන්නෙ නැහැ. ඒක කොහොමද උනේ කියන එක තමන්වත් දන්නෙ නැහැ. අභ්‍යන්තර පරිවර්තනය හිතල කරන්න පුළුවන් එකක් නෙමෙයි. ඒක සිද්ධ වෙනවා. ඒක සිද්ධ වෙනකම් තමයි ඔය මග යන්නෙ. ඔය මුල් අවස්ථාවෙ යෝගාවචර භූමිය ඔය ගමන යන්නෙ. ඕක එනව එක තැනකදි.

ඔය ගොඩක් අයට තේරෙන්නෙ නෑ. සකෘදාගාමී භූමිය කිව්වෙ මොකක්ද කියලා මේ සකෘදාගාමී භූමිය තමන්ට දැනෙන්නෙ ඔන්න ඔතනයි. සකෘදාගාමී භූමිය විශේෂත්වය සමාජයෙ කතා කරන්නෙම නැහැ. මේ සමාජයේ ඉන්නෙ අර තාම නිවන් මගට ගිහිල්ල නැහැ. නිවන් මගට ගිය කෙනා දන්නවා සකෘදාගාමී භූමියෙ තියෙන විශේෂත්වය.

ඒකත් කාමරාග පටිඝය කුඩුවෙන තැන දැනෙන "නිබ්බිදාව" "භයතුපට්ඨාන ඤාණය" එතන ඉස්මතු වෙනතැන "පටිසංකාර ඤාණය" මතුවෙන තැන. **එතැනින් එහාටයි අනාගාමී භූමිය තියෙන්නෙ.** ඒක කැඩෙනකම් එන්නෙ නැහැ. එහෙනම් තමන්ට නිබ්බිදාව තාම ඇවිල්ල නැහැ. හැම දෙයකම කලකිරීමක්, හැම දෙයකම කලකිරීමක් කියන්නෙ සම්මුති කලකිරීමක් නෙමෙයි. පෘථග්ජන භූමියෙ කලකිරීම කියන වචනෙත් නෙමෙයි. මේ හැම දේකම අභ්‍යන්තරයෙන්ම මතු වෙනම ගතියක්. පිනවීමක් එන්නෙ නැහැ. **පිනවීමක් එන්නෙම නැති ගතියක් එනවා. පිනවන්නම බැරි ගතියක් එනවා, පිනවන්නම බැරි ගතිය එනකොට මේක වැරදුණාද කියලා කියන තැනටමයි වැටෙන්නෙ. අන්න එතන තමයි මේ පටිසංඛාර ඤාණය.** එතන තමන්ට ඉන්ද්‍රඛීලයක් වගේ දැනුණොත් මේක තමයි මේ ධර්මයේ තියෙන දියුණුම තැන කියල, අන්න **එතනින් තමයි කඩුල්ල පැන්නවගේ අනාගාමී වෙන්නෙ**. **එතකම් අනාගාමී වෙන්නෙ නැහැ** කවදාවත්. මේක රහසක්. මේක ගොඩක් අයට කිව්වට පස්සෙ යන්න කියන්න පුළුවන්කම ලැබෙයි හිතල, නමුත් ඒක හිතල කියන්න එපා කවුරුවත් ෙෙ. අපි නොකියපු තැන් තවතියෙනවා. ඒක

නිසා බොහොම පරිස්සමින් අපි මේව කියන්න යන්නෙ. හැබැයි මේක තමයි මේකෙ තියෙන සකදාගාමී භූමියේ තියෙන සැඟවුණු කරුණ. මෙතනින් කුඩු උනාට පස්සෙ එහා පැත්තෙ ඇත්තටම ප්‍රායෝගික පැත්ත තමන්ගේ අත්දැකීමක් විතරයි. ඒක පිනවීමක් නැහැ. කනව බොනව සේරම කරනවා. මෙයා හිනාවෙවී ඉඳියි. හැබැයි මෙයා විතරයි දන්නෙ එයා පිනවීමක් නැහැ කියලා. කිසි කෙනෙකුට ඒක තේරෙන්නෙ නැහැ.

හැබැයි මේ තුළ ලොකු පරිවර්තනයක් තව පැතිවලින් තියෙනවා. මේක කියන්න ගොඩක් වෙලා යනවා. කාලය ගොඩක් ගෙවී ගියා. නමුත් එතැනින් එහාට තමයි "අරිහත්ත සමාධිය" තියෙන්නෙ. සියල්ලම අර ශාන්ත, ප්‍රණීත, සුවය ඒකත් අත්දකින්න ලැබෙනවා. ඒක අර පිනවන භූමියේ ඉන්නකම් අභිනන්දනය තියෙනකම් ශාන්ත ප්‍රණීත සුවය අභිනන්දනය කරන විදිහට තමයි කවුරු හරි දේශනා කරන්නෙ. ඒ කියන්නෙ එයාට දහම අවබෝධ වෙලා නැහැ. එතකොට මේ ස්වභාවයෙන් පස්සෙ එන ශාන්ත ප්‍රණීත සුවය වෙනස්. අන්න "ඒතං ශාන්තං ඒතං ප්‍රණීතං යදිදං සබ්බ සංඛාර සමථෝ" කිව්වෙ ඔන්න ඕකට තමයි. "සබ්භූපදි පටිනිස්සග්ගෝ විරාගෝ නිරෝධෝ" කිව්වෙ ඔන්න ඔතනයි.

නිවන් මග ප්‍රායෝගික අත්දැකීම ඒ නිබ්බිදාව, විරාගයේ නිරෝධයේ එයයි නිවන. ඒක අත්දකින්නම ඕනි. ඒ අභ්‍යන්තරය පරිවර්තනය වීම සාන්දිට්ඨික ධර්මයක්. තමන්ටමයි සාන්දිට්ඨික වෙන්නෙ, බාහිර කිසි කෙනෙකුට හසුවන්නෙ නැහැ. ඒමයි ශාන්ත ඒමයි ප්‍රණීත "ඒතං ශාන්තං ඒතං ප්‍රණීතං." සබ්බ සංඛාර සමථෝ සබ්භූපදි පටිනිස්සග්ගෝ විරාගෝ නිරෝධෝ නිබ්බාණෝ එයයිනිවන් මග. හොඳමයි අදට මේ ටික ප්‍රමාණවත්. මේ කියන මාතෘකාව යටතේ. එහෙනම් තෙරුවන් සරණයි.

**මෙහෙ. වහන්සඃ** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස. නමස්කාර වේවා.

# තුන් වැනි දේශනය

**ආර්යයන් වහන්සේ :** කියන්න ප්‍රශ්නෙ. ඔබතුමිය කියන්න බලන්න.

**උපාසිකාව:** ඔව් ආර්යයන් වහන්ස. මම දේශනා අහලා ලොකු අවබෝධයකින් තමයි ඉන්නෙ. ඒ කියන්නෙ ඒ කාලය තුළ හරියටම ක්‍රියාවෙන් ආවා ඒ කටයුතු කරගෙන. හැබැයි, ඊයෙ දවසෙ තමයි මේ බාහිර හිස් බව දැනෙන්න ගත්තෙ. ලෝකය හිස් කියන එකනෙ කියවෙන්නෙ. මේ ධර්මය තුළින් කියන එක තමයි දැනගන්න ලැබුණෙ.

**ආර්යයන් වහන්සේ :** නැහැ. නැහැ. එතන මෙහෙමයි. එතන ඔබතුමිය දැන් මුල් අවස්ථාවේ ඉන්න නිසා තමයි ඔහොම මුලින් පොඩි කම්පනයක් එනවා. ඒකට කියනවා භයතු පට්ඨාන ඤාණය වගේම තමයි, ඒ කියන්නෙ මෙතන පොඩි බයක් වගේ ගතියක් දැනෙනව නෙ. ලෝකය ඇත්තක් නෙමෙයි කියල දැනෙන කොට එනවනෙ පොඩි කම්පන ස්වභාවයක්. මේක අපි පොඩ්ඩක් ධර්මය පැත්තෙන් පැහැදිලි කරන්නෙ. දැන් මේ ධර්මය පැත්තෙදි උදයව්‍ය ඤාණය, භය ඤාණ, භයතු පට්ඨාන ඤාණ, මුඤ්චිතු කම්මතා ඤාණය, ආදීනව ඤාණ, නිබ්බිදා ඤාණ, සංඛාර උපේක්ඛා ඤාණය, එතනටයි යන්නෙ, පටිසංකාර ඤාණය හරහා. එතකොට මේ විදර්ශනා සමාධි ගැන තමයි අපි කතා කරන්නෙ. හිතට එන අරමුණෝ සත්‍යය දැකල මිදෙන තැන. ඒ සත්‍යය ඤාණය තුළින් දකිනව නම් ඒ දර්ශන ඤාණය තුළින් දකිනව නම්, ඒ සත්‍යය ඤාණය තුළ අපි අඳුන ගන්නෙ ඒ මේ ලොව ඇති පරම සත්‍යයයි. ඒ පරම සත්‍යය අපි හදා ගත්ත ලොවයි. එහෙනම් ඒක අපි හිතන නිසා මැවෙන ලෝකයක්.

ඒ කියන්නෙ අපි අර නිතරම කියන උපමාව බල්ල පොකුණට එබෙන නිසා පොකුණෙ බල්ලෙක් පේනවා මිසක් ඒ පොකුණෙ බල්ලෙක් ඉන්නවා නෙමෙයි. එහෙනම් අපි **හිතන නිසා ලෝකයක් මවා ගන්නවා මිසක්, තියෙන ලෝකයක් නෙමෙයි.** එහෙනම් මේ බාහිර මොකුත් ගැන අදහසක් නෙමෙයි මෙතන තියෙන්නෙ. මෙතන තියෙන්නෙ අපි **"චිත්තේන නීයති ලෝකෙක" සිතුවිලි ලෝකෙක ජීවත් වෙනවා කියන එකයි.** එහෙනම් අපි මේ මනෝ ලෝකෙකයි මේ ඉන්නෙ. "මනෝ පුබ්බංගමා ධම්මා" එහෙනම් අපි මේ **සිතුවිලි සංඛාර ලෝකෙකයි** මේ අපි ඉන්නේ. **"මනෝ පුබ්බංග මා ධම්මා"** එහෙනම් මේ සංඛාර ලෝකය අපි හඳුනා ගන්න ඕනි. ඒක මනෝමය ලෝකයක්. චේතනා, සංඛාරා අර කියන්නෙ චේතනා. මේ සබ්බ සංඛාර.

ඒ කියන්නෙ අපි "මනෝමයෙන්" මේ ලෝකය කියල හදාගෙන තියෙන්නෙ ප්‍රායෝගිකව බැලුවොත් ශබ්ද, වර්ණ, ගන්ධ, රස, පහස. ශබ්ද කිව්වහම පුටුව කියන්නෙත් ශබ්දයක්. හැබැයි පුටුව කිව්වහම, ඒකට රූප හැඩ තලයකුත් තියෙනවා. මෙන්න මෙතන අපේ අතරමංවීම. ශබ්දය ශබ්දයක් වෙලා නැවතිලා නැහැ. ඒ ශබ්දෙට රූප හැඩතලත් තියෙනවා. ඒ විතරක් නැවතිලා නැහැ. ඒකට උණුසුම, සීතල, තද ගතිය සේරම අපිටමයි දැනෙන්නෙ. මේක දැනෙන්නෙ අපේ ශරීරයට නෙමෙයි සෙන්සස් වලටයි. මේ ශරීර කූඩුවට දැනෙන එකක් නෙමෙයි මේ අවසාන උත්තරේ මේ සෙන්සස්වල දැනෙන තැනක් නෙමෙයි මේ තියෙන්නෙ. මේ තියෙන්නෙ හරියට නිකම් එළියේ විදුලි කොටනවා වගේ. මේ සිත කියන එක. තැනක් නැහැ. නමුත් දැනෙනවා. මේ දැනීම දෙයක් වගේ දැනෙන එකයි, දෙයක් වගේ දැනෙන මේ දැනෙන තැනත් අපිට තියෙනවා. මේකෙ බැස ගැනීමක්. අජ්ජෝසාය කියන එක. එතකොට අපිට නන්දියක් තියෙනවා ඒකට ඇලීමක් ගැටීමක්.

එතකොට ඒක අපි අල්ලා ගැනීමක්. අපිට දෙයක් වගේ දැනෙන ගතියම තමයි මේ විග්‍රහ කරන්නෙ. පුටුව කොහොමද දෙයක් උනේ. අන්තිමට මේකෙ දැන් අපි **'සක්කාය දිට්ඨි' ප්‍රහීන කරනවා, කියන්නෙ තියෙනවා කියන දෘෂ්ටිය බිඳ වැටෙනවා.** ඒක දෘෂ්ටියක් තුළ, ඒ කියන්නෙ මනෝමයෙන් හට ගන්නා එකක්. **ඒකයි මනෝ විඤ්ඤාණයේ දැන ගැනීම කියන්නෙ. එතකොට ඒක බිඳ වැටෙනවා. ඒක බිඳ වැටුණම**

**අපිට මේ ඇත්ත ලෝකෙ පේන්න ගන්නවා.** ඇත්ත ලෝකේ තමයි මේ අපේ ආරෝපණ බන්ධනය කුඩු වෙච්ච තැන තමයි දැනෙන සුඛයක්. හැබැයි පේන්නෙ නැතිව නෙමෙයි වෙනද විදිහටම පේනවා. වෙනද විදිහටම දන්නවා පුටුවක් කියලා. ඒ උනාට 'චිත්ත විමුක්තියක්.' **චිත්ත විමුක්තියක්** සිද්ධ වෙලා තියෙනවා. මෙන්න මෙතනයි සත්‍යය තියෙන තැන.

අපි දකින්න ඕනි පරම සත්‍යය මෙන්න මේ ආධ්‍යාත්මය තුළින්මයි. එතකොට අපිට මතුවෙන්නෙ මෙතන දෙයක් නැහැ කියන අන්තෙකුත් නෙමෙයි. තියෙනවා කියන අන්තෙකුත් නෙමෙයි. අපි මෙච්චර කල් ඇසුරු කරපු චිත්තයේ ස්වභාවය කොහෙවත් හම්බ වෙන්නෙ නැති කමක්. ඒකයි "සම්භූත" වෙනවා කියන්නෙ. **"හේතුං පටිච්ච සම්භූතා හේතු භංගා නිරුජ්ජති"** කිව්වෙ ඔන්න ඔතනයි. ඒක තියෙන එකක් නෙමෙයි කොහෙවත්. එහෙම දෙයක් තියෙනවා කියන්නත් බැහැ, නැහැ කියන්නත් බැහැ. මොකද මේක මෙතන මැවෙන එකක්. මැවීමක්. පණගැන්වීමක්. දෙයක් වීමක් බැස ගැනීමක්. "අජ්ජෝසාය තිට්ඨති යාරූපේ නන්දි-තදූපාදානං?" කියන්නෙ ඔන්න ඔය වචනෙ තේරුම. ඔය ප්‍රායෝගික පැත්ත. දැන් මේක අත්දකින්න ගත්තොත්, **ප්‍රායෝගිකව දැනෙන්න ගත්තොත් විමුක්තියට** පත්වෙනවා. ඒ කියන්නෙ නිදහස් වීමකට ලක්වෙනවා. හරියට නිකම් හිරගෙදර ඇතුළෙ හිටපු කුරුල්ලා, කූඩුවක හිටපු කුරුල්ලා කූඩුව කඩාගෙන එළියට ගියා වගේ වෙනවා. සියලු දේ බිඳ වැටෙනවා. බිත්තර කට්ට කුඩුවෙලා කුකුල් පැටිය එළියට ආව වගේ වෙනවා. ඒ කියන්නෙ දෘෂ්ටි. දේවල් කියල දැනෙන ගති මොකුත් නැති වෙනවා.

දරුව, අම්ම, ගෙවල්, දොරවල්, තමන්ගෙ රූපයපවා කය පවා මොකක්වත් නැහැ. මෙතනදි අදාළ නැති අර නිදහස් වීමකට පත්වෙනවා. මේ නිදහස්වීම නිසාම තමයි උත්තරීතරත්ත්වයට පත්වෙන්නේ. මෙතන තමයි "සුඛය" අමරණීයත්වය. මේක ඇවිල්ල විමුක්තියක තලය කියන්නේ. ඉතිං මේක හිතන තරම් පහසු දෙයක් නෙවෙයි මේ කිව්වට වටහ ගන්න. මෙය සිතුවිලි වලින් ගන්න පුළුවන් දෙයක් නෙමෙයි. මේක අර හිතුවත් අර සිතුවිල්ල ඇතුළෙ තියෙන දෙයක් වගේම තමයි. දැන් හැම සිතුවිල්ලක්ම දෙයක් වෙලයි තියෙන්නෙ. හැබැයි ඒක දෙයක්

නොවන ස්වභාවය ඥාණයට අසුවෙනවා යටින්. හරිම ගැඹුරුයි. මේ කියන එක. මේ චිත්ත ස්වභාවයේ දෙයක් නොවී තියෙන එකයි මෙතන වෙන්නෙ. ඊට යටින් බේස් එකක් තව තියෙනවා. ඒ තමයි සාමාන්‍ය ස්වභාවයක් පවතිනවා. ඒ ස්වභාවය මේකට අයිති නැහැ.

මේ ආරෝපණය කියන එක, ආරෝපණයෙන් නිදහස් වීමක් සිද්ධ වෙනවා. එහෙම නැතිව දැන් අපි පොත කියල ගත්තොත් හරි පුටුව කියල ගත්තොත් හරි පුටුව කියල ගත්ත අර ආත්මීය හැඟීම තිබුණු වටිනාකම තුන් භූමියම බිඳ වැටෙනවා. කාම භූමිය, රූප භූමිය, අරූප භූමිය, මේ තුන් භූමියම මේ අරමුණේ තියෙනවා. මේකෙ වටිනාකම කාම භූමිය රූප සංඥාව. රූප භූමිය, අරූප භූමිය දෙයක් වගේ දැනෙන ගතිය. මේක ඇතුළෙ තියෙනවා ආත්ම ගතියක්. මේකමයි ආත්මය. පුටුවමයි ආත්මය. “රූපං අත්තතෝ” කියන්නේ, රූපං අත්තංවා. අත්තතීවා රූපං කියන්නෙ රූපං අත්තංවා අත්තතී කියල කියන්නෙම රූපයමයි, ආත්මය කියන එකයි. ඒ කියන්නෙ පොතමයි මම කියන්නෙ. පොතෙන් තොර මමෙක් නැහැ. මේක මහගැඹුරු විග්‍රහයක්. මේක මහා බුදු ඇසට හමුවන දෙයක් මේකයි. ඒ ‘බුද්ධ ස්වභාවයට’ අවදිවෙන්නෙ මෙතනින්. මෙතන කිසිම සත්ත්වයෙක් පුද්ගලයෙක් නැහැ. සත්වපුද්ගල කතාවක් නැහැ. ඒ හැම එකම වචන ගොඩක් විතරයි. පුදුම සැහැල්ලුවක් මේ මොහොතෙම නිදහස්වීමක් මහා පුදුමාකාර ධර්මයක් අපිට හමුවෙනවා. මෙතනින් එහා කිසිම කතාවක් නැහැ. අපි මේ ලෝකය කියල හදා ගත්ත ලෝකයක් කොහෙවත් තියෙන එකක් නෙවෙයි. ලෝකය කියල එකක් කොහේවත් නැහැ.

අරමුණ ඇත්ත වීම ලෝකයයි. අරමුණ ඇත්ත නොවීමම, සත්‍යය දැකීමම, එලොවයි මෙලොවයි. **මෙලොව කියන්නෙ අරමුණු සත්‍ය වීම. අරමුණ සත්‍යය දැකල මිදීම එලොවයි.** අරමුණෙන් නිදහස් වීම, අරමුණේ බැස ගත්තෙ නැතිවීම, එලොවයි මෙලොවයි අතර ඇති පරතරය ඒකයි නෙළුම් පතයි දිය බිඳයි කිව්වේ. මේක පරතරයක් නැහැ. ඇත්තවීම මෙලොවයි ඇත්ත නොවීම එලොවයි. මේ දහම කොයිතරම් නිර්මලද? මේ ඉදිරිපත් කිරීම කොපමණ නිර්මලද? දැන් ඔබතුමියට මේක දැනෙන්න ගත්තට මුල් අවස්ථාවේදී මොකුත් කරන්න බැහැ. ඒ දේවල් මේකෙ අවසානෙ නැහැ. මේකෙ අවසානෙ අවබෝධ, අර කණ්ණාඩියේ දෙයක්

නැහැ කියන අවබෝධයම තමයි. කණ්ණාඩියේ දෙයක් නැහැ කියල අවබෝධ වුණා කියල කණ්ණාඩියෙ දෙයක් නැහැ කියල අපිට අවබෝධ උණා කියල ප්‍රශ්නයක් නැහැ. අපි කණ්ණාඩිය ඔහොම තියෙනවා. අපි වැඩ කරනවා. කණ්ණාඩියෙන් ප්‍රයෝජනවත් වෙනවා. මේ විදිහට තමයි **මේ සත්‍යය අවබෝධ උනාම සාමාන්‍ය මිනිස්සු කරන කියන අරව මේවා අපිට කණ්ණාඩිය වගේ.**

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** අපිට දැන් හැමදේම ගින්නක් නැතිව වැඩ කරන්න පුළුවන් කියන එකයි අපි කියන්නෙ. ගින්නක් තියෙනවා කියන්නෙ දෙයක් තියාගෙන කරනවා කියන එකයි. සිතුවිල්ලකම දෙයක් කරගෙන විඳවනව කියන එකයි. හැබැයි ගින්නක් නැතිව වැඩ කරනව කියන්නෙ හැම සිතුවිල්ලක්ම දෙයක් කරගන්නෙ නැතිව අපි කටයුතු කිරීම. මේකයි ආර්ය භූමියේ තියෙන වටිනාකම කමටහන. **මේ කමටහන තමයි අපි කිව්වේ හිටිය කෙනෙකුත් නැහැ. ඉන්න කෙනෙකුත් නැහැ. මැරෙන කෙනෙකුත් නැහැ.** පුදුමයි නේද? හිටිය කෙනෙකුත් නැහැ, ඉන්න කෙනෙකුත් නැහැ, යන කෙනෙකුත් නැහැ. **කොහොමද මේ නිදහස. කොහොමද චේතෝ විමුක්තිය.** කොහොමද මෙහෙනින් වහන්සේ පැහැදිලි කිරීම.

**මෙහෙනින් වහන්සේ :** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** කොයිතරම් වටිනවද නේද? අරහත්වයටමයි පැහැදිලි කිරීම. මෙතුමියට අපි පැහැදිලි කළා සෝතාපන්න මාර්ගයට, සකදාගාමී මාර්ගයට, අනාගාමී මාර්ගයට අරහත්ව මාර්ගයට, හැම තැනකදීම පැහැදිලි කිරීම්වලදී සිද්ධ වෙන්නෙ සැහැල්ලුවක් පමණයි. ඒ සැහැල්ලුව, අවබෝධයට පත් නොවීමයි. යම් හිරයක් තියෙනව නම් වෙන්නෙ. ඔව්. ඇහුණා නේද? මේ කමටහන.

**මෙහෙනින් වහන්සේ:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** කොච්චර වටිනවද නේද මෙහෙනින් වහන්ස.

**මෙහෙනින් වහන්සේ:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** හරි, දැන් ඔබතුමියට ධර්ම කාරණාව ප්‍රායෝගික වෙලා, පොඩ්ඩක් සැනසීමෙන් විවේකය ඇතුව, විවේකය කියන්නෙ ආධ්‍යාත්මික විවේකයක්. මූණකට හෝදල, උයල පිහල, නාල කියල ඒ සේරම, කටයුතු සියල්ලම සැහැල්ලු මනසකින් කෙරෙනවා කියන එකයි, විවේකීව කරනව කියන එකේ තේරුම. විවේකීව කරන කොට කිසිම ආතතියක් නැහැ. දැන් මට අරක කරන්න ඕනි, මේක කරන්න ඕනි කියල ඔය වගේ බන්ධන බලයක් ඇතිවෙන්නෙ නැහැ. මේ අහන ධර්මය නිර්මලව අහන ධර්මය ගැන සිහිය පවත්වනවා නම්. මොකද්ද මේ කියන්නෙ. දෙයක් නැතිව. දෙයක් නැතිව, දැන් අපි උයන එකත් දෙයක් වෙන්නෙ නැහැ. අපි කන එකත් දෙයක් වෙන්නෙ නැහැ. එදිනෙදා කටයුතු හැම එක ම සැහැල්ලුයි. මූණකට සෝදන්න ගියත්, වත්ත පිටියෙ වැඩක් කරන්න ගියත් පුදුම සැහැල්ලුයි. දෙයක් කරගන්නෙ නැතිව කරන එක.

**උපාසිකාව :** ක්‍රියා සිතම සැහැල්ලුයි. වැඩ කරන විට සැහැල්ලුව දැනුණා.

**ආර්යයන් වහන්සේ:** හැබැයි ඔබතුමියගෙ සිතුවිල්ලෙත් දෙයක් තියෙන්න පුළුවන්.

**උපාසිකාව:** ඔව්.

**ආර්යයන් වහන්සේ:** ඔය හිතන ඒවා කියන ඒවා හැම එක ම දෙයක් වෙලයි කියන්නෙ හිතන්නෙ. ඒකටත් අවබෝධයක් තියෙන්න ඕනි. මේ හැමඑකම දෙයක් කර ගෙනකියල තමයි කාටහරි කියන්නෙ කියනඑක. මේක දැනගෙන කියන කොට අපි ඒක ගිනිගන්නෙ නැතිව ඒකත් උපාදානයක් මොකක්වත් නැහැ. හැබැයි අභ්‍යන්තරයෙන් තව හොඳින් ප්‍රගුණ කරන්න ඕනි. ඔබතුමියගෙ විතක්කවල තියෙනවා දෙයක් තියෙන ස්වභාවය. අපිට ඒ හැමදේම අසුවෙනවා. ඉතිං අපි දකිනවා. ඔබතුමිය කොතනද කොහොමද කටයුතු කරන්නෙ කියලා. ඔබතුමිය තව ප්‍රගුණ කරන්න ඕනි. පුහුණු වෙන්න ඕනි. පත්තියන් වෙන්නඕනි. කොහොමත් ඔබතුමිය මේ කතාකරන බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේගේ පැහැදිලි කිරීම හරි නිර්මලයි. ඉදිරිපත් කිරීම අතිවිශිෂ්ටයි. අපි දන්නවා විශාල

පිරිසකට සෙත ශාන්තිය හැදෙනවා. සසර දුකින් මිදෙනවා, ගින්නත් නිවෙනවා, හැමෝම ගින්නෙන් නිවිල කටයුතු කරන්න. මේ බුද්ධෝත්පාද දේශනා හේතු වෙනවා. ඉතින් පුද්ගල ස්වභාවයෙන් ගන්නෙ නැතිව ධර්මතාවය දකිමින් ඒ ධර්මය හඳුනා ගනිමින් තම තමන්ගේ නිදහස්බව, තම තමන්ටම දැනෙනවා නම් කොච්චර සතුටක් ද? ඇත්තටම මේ සත්ත්වයා දුකින් මිදෙනවා නේද? එයමයි විය යුත්තේ.

**එයමයි ශාන්ත. එයමයි ප්‍රණීත. "ඒතං ශාන්තං ඒතං ප්‍රණීතං." "යදිදං සබ්බ සංඛාරා සමථෝ" මේ දහම අවබෝධ වන සැමටම අවසානයේ දැනෙන්නේ මේ ශාන්ත සුවයයි. ඒකයි බුද්ධ වචනයේ අවසානයේ කියන්නේ ඒමයි ශාන්ත "ඒ තං සාන්තං - ඒකං ප්‍රනීතං - යදිදං සබ්බ සංඛාර සමථෝ" සියලු සිතුවිලි සමනය වන තැන "සංඛාර උපේක්ෂාව" කිව්වොත් ඒකමයි සබ්බ සංඛාරසමථය අන්න උපදිගොඩ අතහැරෙන තැන, "සම්භූපදි පටිනිස්සග්ගෝ - විරාගෝ - නිරෝධෝ - නිබ්බාණෝ" ඒ නිවන්මග දැන් හමුවෙලා තියෙන්නේ. විවෘත වෙලා තියෙන්නේ දැන් මෙතන බැබලෙනවා බුද්දෝත්පාද නාලිකාව. එහෙම නේද මෙහෙණින් වහන්ස. මහියංගණේ මෙහෙණින් වහන්සේට දැනෙනවා නේද මේ සුවය. නියම වෙලාවට පැවිදි වෙලා තියෙන්නෙ නේද? දැන් දැනෙනවා නේද? හිතුවේ නැහැ මේ වගේ ආර්යයන් වහන්සේ නමක් ඇවිල්ල අපිව දුකින් මුදවා නිදහස් කරල දෙයි කියලා. හැබැයි පැවිදි වීමම ශ්‍රේෂ්ඨයි කියල දැනෙනවා නේද දැන්.**

**මෙහෙනින් වහන්සේ:** එහෙමයි ආර්යයන් වහන්ස. මට කියන්න වචන නැහැ. ඔබ වහන්සේ දේශනා කරන දේශනා වලට මම පැහැදිලා තියෙන තරම. ඒ බාහිරේ තියෙන දේවල් අල්ලගෙන මොනතරම් දුකක් වින්දද කියල හිතෙනවා දැන් මට. දැන් දැනෙනවා මේ බාහිරේ තියෙන ඒවා අල්ලගෙන ඉන්න තරමටම දුක වැඩියි. ඒවා අත ඇරෙන කොට පුදුමාකාර සැනසීමක් ලැබිල තියෙනවා.

**ආර්යයන් වහන්සේ:** ඔබ සියලු දෙනාම නිවනින් ම සැනසීම ලැබේවා.

**මෙහෙනින් වහන්සේ:** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස

# හතර වැනි දේශනය

**උපාසිකාව:** මට එකපාරටම අවබෝධයකට ආවා හිස් තැන්වලින් බලනවා කියන එක. ඒ කියන්නෙ මම ආහාර පිඟාන බෙදා ගත්තා. ඒ වෙලාවෙ දැන් මෙතන දෙයක් නැහැ කියල ලෝකෙ දිහා හිස් බැල්මකින් බලන්නෙ කියන එක අවබෝධ වුණා.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමිය කොහෙන්ද කතා කරන්නේ

**උපාසිකාව:** මහියංගණෙන් ආර්යයන් වහන්ස. මං එක තැනක හිරවෙලා ඉන්නවා වගේ දැනිල ඔබ වහන්සේට කතා කරා. ඒ වෙලාවෙ ඔබ වහන්සේ කිව්වෙ මේක සිතුවිල්ලක්. මට දැනගන්න ඕනි වෙලා තිබුණෙ වැඩ අත හැරෙනවා ද කියලා. එතනදි ඔබ වහන්සේ කිව්වෙ වෙනදට වැඩිය හොඳින් වැඩ කරන්න පුළුවන් කියලා. ඊට පසුව මා ඒ වෙලාවෙම වැඩ කරන්න පටන් ගත්තා. හිතේ හිරවෙලා ඉන්න ස්වභාවයක් තිබුණ නිසා තමයි මම ඔබ වහන්සේට එදා කතා කරේ. ඒත් එදා ඔබ වහන්සේ වෙහෙසකට පත්වෙලා ඉන්නව කියල දැනගත්තට පස්සෙ ඉතිං මං කට් කරා ෆෝන් එක. ඊට පසුව මා වැඩ ආරම්භ කරල ක්ෂණික හිතේ, අරමුණදිහා බල බලා තමයි හිටියෙ ආර්යයන් වහන්ස. ඉතිං මේ අවබෝධය දැනුණ නිසා එතනදි හුස්ම බිංදුව තමයි පවතින්නේ. ඒ මොහොතේ හුස්ම ගැන තමයි අදහස තියෙන්නෙ. මොකක්ද මේක ආර්යයන් වහන්ස. මම යන මාර්ගය අවසන් උනා ද?

**ආර්යයන් වහන්සේ:** එහෙම අවසන් වෙන්නෙ රාග, ද්වේෂ, මෝහ කෙලෙස් සංසිඳීමට පසුව. රාගක්කයෝ, දේශක්කයෝ, මෝහක්කයෝ නිබ්බානෝ කියන්නෙ "නිබ්බිදන්ති - විරාගන්තී - නිරෝධන්තී

පටිනිස්සගානුපස්සී" මේකෙ නිවන් මග හිතල කවුරුත් නිවන් දකින්නෙ නැහැ.

**උපාසිකාව:** මෙහෙමයි ආර්යයන් වහන්ස. එක් ක්ෂණික හිතේ උදය වැය දකිමින් තමයි හිටියෙ.

**ආර්යයන් වහන්සේ:** ක්ෂණික සිතේ උදය වැය දකිනව කියන්නේ, සවිතක්කං සවිචාරං කියල තමයි කියන්නෙ. මනසිකරෝති. එතකොට මනසිකාරය කියන එක අපි භාවිත කරනවා. හැබැයි ඒක මාර්ගයට විතරයි, ඵල සිත්වලට යන්න බැහැ. එතන මනසිකාරයක් තියෙනවා. මෙනෙහි කරනවා. මේ මෙනෙහි කරන නිසා මිදෙන බවක් අපිට දැනෙනවා.

**උපාසිකාව:** ඔව්. ආර්යයන් වහන්ස මං දැන් කෙනෙකුට මොනවහරි කියන කොට ඒක දැනෙනවා මට. කතා බහ කරන වෙලාවට ඇතුළාන්තයෙන් දැනෙනව. මේ අල්ලගෙන කියන්නෙ නැති බවක්. එහෙම දැනි දැනී තමයි කාලය ගෙව්වෙ. අර භද්දේක රතන සූත්‍රය අහන කාලෙ ඉඳල මං ක්‍රියා සිතේ වැඩ කරේ. ක්‍රියාවලියක් විදිහට හිතේ එහෙම දෙයක් නෑ කියල. පෙබරවාරි මාසෙ ඉඳල තමයි මට "භද්දේකරතන සූත්‍රය" අහන්න හම්බ වුණේ.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමියට තියෙනවා හඳුනා ගන්න තැන් කිහිපයක්.

**උපාසිකාව:** මං දැන් ඔබ වහන්සේගේ දේශනා 4 ඉඳල අහල තියෙනවා. දැනට ගොඩක් දේශනා අහල තියෙනවා. මුහුදු රැල්ල වගේ කියල කියන පොඩි දේශනා ඒ වගේ මං ගිහි ජීවිතේ ගොඩක් දේවල් ගලව ගත්ත බොහෝ දුරට.

**ආර්යයන් වහන්සේ:** තවත් තියෙනවා ඔබතුමියට අහන්න.

**උපාසිකාව:** මොකක්ද කරන්න තියෙන්නෙ මාර්ගයේ යන්න ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** මෙතනදි තියෙනවා ඔබ හිතන එක. ඒ කියන්නේ 'මනසිකාරය කරන එක තියෙනවනෙ, **ධර්මය මෙනෙහි කරන මට්ටම එක අදියරක් විතරයි. ඒක සවිතක්කං සවිචාරං' කියන මට්ටම. මේ නිවන් මග ඊගාව අදියරට යන්න ඕන. ඔය ඉන්ද්‍රිය ධර්ම මට්ටම ඔය තියෙන්නේ. ඕක 'බල ධර්ම' මට්ටමට යන්න ඕන. ඒක 'අවිතක්කං අවිචාරං' කියන තැනට යන්න ඕනි.** 'අවිතක්කං අවිචාරං' කියන තැනක් මේ මාර්ගය තුළ තියෙනවා, නැතිව නෙමෙයි. **මේ මාර්ගයෙම තියෙන දියුණු මට්ටමක් තමයි ඒක, ඵල සිත් කියල අපි කියන්නෙ.** මාර්ග සිත් වෙනයි ඵල සිත් වෙනයි. අපි මෙනෙහි කරන මෙනෙහි කරනකම්ම අපි ඉන්නෙ විහරණය තුළයි. නිස්සරණය තුළයි. එතකොට මේ විහරණය නෙවෙයි සමාපත්තියක් කියන්නේ. මේ හැම තැනකම බාහිර අපි දෙයක් නැහැ කියල මෙනෙහි කරනවනම් අපට බාහිර දෙයක් නැති බවට මෙනෙහි වෙනවා. බාහිර දෙයක් හම්බ වෙන්නෙ නැතිබව අපිට දැනෙනවා. මේක දිගටම මෙනෙහි කරගෙන යනවිට එක්තරා මට්ටමකදී මේක සාමාන්‍ය දෙයක් බවට පත්වෙනවා. එතනදි මෙනෙහිවීම නවතිනවා. ඒකට හේතුව තමයි මෙනෙහි කරන්න දෙයක් නැති වෙනවා.

**උපාසිකාව:** ආර්යයන් වහන්ස දැනට මං මොනවගේ දේශනා ද අහන්න ඕනි?

**ආර්යයන් වහන්සේ:** මේක හොඳට අහන්න. මේක එක්තරා ගැඹුරු මට්ටමක්. මෙහෙම මෙනෙහි කරනකොට මෙනෙහි කරන කොට ඒක ප්‍රායෝගික වෙන්න ගන්නවා. ඒක හැම තැනම පේන්න ගන්නවා. මේක සාමාන්‍යයෙන් ස්වභාවය බවට පත්වෙනවා. **මෙනෙහි කරනවා නෙමෙයි ඉබේ මෙනෙහිවෙනවා. එතකොට මෙනෙහිකරන මට්ටම ගිහිල්ල. සාමාන්‍ය මට්ටමට මිදීමක් බවට පත්වෙලා විමුක්තියක්, චේතෝ විමුක්තිය බවට පත්වෙලා. හැබැයි මේ නිවන් දැකල නෙමෙයි. මේක අවස්ථා 4කදීම සිද්ධ වෙනවා.** එකක් බාහිර ඇත්තක් නොවන ස්වභාවයතුළම ඒක බාහිරට කම්පනය නොවන ස්වභාවයකින්, ඒක දැනෙන්න පටන් ගන්නවා. මෙනෙහි කරනඑක, මෙනෙහිකරන මට්ටම අභිබවා යනවා. එතකොට මෙනෙහි කිරීමෙන් තොරව නිකන් අර අපි කියන්නෙ ධර්මය නිකම් ඕකත් පැත්තකින් තියල සාමාන්‍ය විදිහට වැඩ කරන්න කියලා කියන්නේ ඔන්න

ඕකයි. එතකොට තමන්ට දකින්න ලැබෙනවා **මේ මොකුත් හිතලවත් නෙමෙයි, හැබැයි කිසිම දේකට බැස ගන්නෙ නැති ස්වභාවයක්. අන්න ඒක තමයි 'අවිතක්ක අවිචාරං සමාධි අවස්ථාව එතන, සිහියටයි මේවා අහුවෙන්නෙ.**

ගොඩක් දියුණුයි ඒ කියන තැන. **මේක මෙනෙහි කරන තැනක් නෙමෙයි. ඒක 'අමනසිකරෝති' ඒක මනසිකරොති කියන තැන නෙවෙයි, අවිතක්කං අවිචාරං සමාධිය කිව්වෙ ඕකට තමයි. සමාපත්ති සිත් කියන්නෙ ඕකටයි,** ඒ කියන්නෙ ඵල සිත්, මාර්ග සිත් කියන්නෙ වෙනයි, ඵල සිත් කියන්නෙ වෙනයි. ඒවා මනසිකරෝති සිත් මේ දෙකම ලෝකෝත්තර භූමියේදී හමුවෙනවා. ඒ කියන්නේ අටමහ කුසල්වලදී හමුවෙනවා, මහා කුසල් අට ඇතුළෙදි බාහිර ඇත්ත නොවන තැන. තමන්ගෙ මේ මාර්ග සිතේ, ඒ ස්වභාවය බවට පත්වීම, ඒ වගේම තමයි මාර්ගය මෙතන සකෘදාගාමී කියන්නෙ මිදි මිදී යන එක තමන්ට දැනෙන එක. වෙනම කතා කරන්න ඕනි. කාම රාග පටිඝ මේ සිත ඇතුළෙ ඇලෙන ගැටෙන ස්වභාවයන් ටිකක් තියෙනවා. හිතේ තියාගෙන දුක් විඳිනවා. හිතේ දරුව ඉන්නකම් දුක් විඳිනවා. අන්න ඒ ස්වභාවය. ඒ ස්වභාවය සකෘදාගාමී ස්වභාවය. ඒ ස්වභාවයේ ඒ අවස්ථා දෙකම හමුවෙනවා.

ඒ වගේම අපිට ඊළඟට ප්‍රකටවෙන අවස්ථාව තමයි **මේ හිතෙන් මිදෙන තැන. හිතෙත් දෙයක් නැහැ කියන තැන ශබ්ද වර්ණ කියල** අපි කිව්වෙ. දැන් මේ හැම දෙයක්ම දරුව, කියල පෙර කරපු දේවල් අතීතයේ ඒවා මේ වගේ, **ද්වාර '6' ගැන හොඳ අවබෝධයක් තියෙන්න ඕනි. වර්ණ ශබ්ද රසපහස වගේ ඒවා. සිතුවිලි වලත්, ද්වාරයක් විතරයි. සිතක් ඇතිවෙන්නේනෑ. සිතට හිමිකාරයෙක් නැතිවෙනව.** ඒකත් ද්වාරයක් විතරයි. ගන්ධය දැනෙනවා, පහස දැනෙනවා, වර්ණ පේනවා, ශබ්ද ඇහෙනවා, සිතුවිලි එනව යනව කියන්නේ ද්වාරයක් පමණයි. ඒකටත් හිමිකාරයෙක් නැතිවෙනවා.

මේ හැම තැනකදීම මේ මාර්ගය දියුණු වීගෙන යන කොට මේ බාහිර නෙමෙයි මේ සිතම බව, හැම එකම දැනෙන්නගන්නවා සිතුවිලි පමණයි.

මේ සේරම සිතමයි. 'මනෝ විඤ්ඤාණය' පමණයි. අභ්‍යන්තරයෙන් බාහිරට සම්බන්ධයක් නැතිවෙනවා. ලෝක සංඥාව බිඳ වැටෙන තැනටම එනවා. මේක ශබ්දයක් වර්ණයක් පමණයි කියල මෙනෙහි වෙනවා. ඊට පස්සෙ සිතෙත් දෙයක් නෑනේද? ශබ්ද වර්ණ නේද? හොඳට ආයතන වෙන්වෙලා පේන්න ගන්නවා. මෙතන මේසයක් තියෙනවද පුටුවක් තියෙනවද මෙතන තියෙන්නෙත් සිතුවිල්ලක් විතරනෙ. මේකත් ශබ්දයක් විතරනෙ පුටුව කියන්නේ, ශබ්දයයි වර්ණ කියල ඕක කැඩෙනවා. මේ මාර්ගයේ පිළිවෙලට යන කෙනෙකුට හොඳින් අහුවෙනවා මේ අනාගාමි භූමියේ කථාව, මේ ශබ්ද වර්ණ කියල තමයි පේන්නෙ. ශබ්දයක් පමණයි. වර්ණයක් පමණයි. ශබ්ද, ගන්ධ, රස, වර්ණ, පහස කියල යන ඒවා එකට එකතු වුන දේවල් විදිහට හම්බ වෙන්නෙ නැහැ. දරුව කිව්වත් ශබ්දයක් විතරයි වෙන්නෙ. මේ ශබ්ද වර්ණ විතරයි. ඒක ස්වභාවය. සිතින් මිදෙන තැනට එනවා. එතනත් දෙයක් නැහැ කියන එක තේරෙන්න ගන්නවා. මේ සිත ඇතුලේ සිතන එකතුළත් දෙයක් නැතිබව, එතනත් දෙයක් නැහැනේද? කියල. සිතේ කොහොමත් භෞතික දේවල් හම්බවෙන්නේනෑ නේද කියල. ඒක හැම පැත්තෙන්ම මෙනෙහි වෙන්න ගන්නවා. මේක සිතුවිල්ලක්. මේකෙ තේරුමක් නැහැ.සිතුවිලි කියන්නෙ ශබ්ද වර්ණ එකතු වෙන එක. මෙතන ආත්මයක් කියල දෙයකුත් නැහැ, මේකත් ශබ්ද වර්ණයෙන්මයි හැදිල තියෙන්නෙ කියල ඔන්න ඔය අවබෝධය හොඳට පිරිසිදු වෙන්න ගන්නවා.

ලිහෙන්න ගන්නවා. ඒ තුළ ඇත්තටම තමා නැති වෙනවා. දෙයක් දකින කොට ඒක ශබ්ද වර්ණ වෙන කොට ඒක දෙයක් වෙන්නෙ නැහැ. දෙයක් වෙන්නෙ නැති වෙනකොට ඒක දකින කෙනා නැති වෙනවා. ඇයි දකින්න දෙයක් තිබුණොත්නෙ, කෙනෙක් ඉන්නෙ. දෙයක් නැත්නම් කෙනෙක් නැහැනෙ. අන්න සෘද්ධිමය ස්වභාවයක් දැනෙනවා. ලෝක සංඥාවලින් මිදෙන ස්වභාවයක් මේක අධ්‍යාත්මයෙනුත් මිදෙන ස්වභාවයක් දැනෙන්න ගන්නවා. ඔන්න මේකෙත් තියෙනවා මාර්ග අවස්ථාව වෙනයි, ඵල අවස්ථාව වෙනයි. මෙනෙහි කරනකම්ම තියෙන්නෙ මාර්ග 'සවිතක්කං සවිචාරං' එතකොට ඵල අවස්ථාව කියන්නෙ නිරායාසයෙන්ම මිදීම. අත්දැකීමකට පත්වීම. ඒක තමයි අනාගාමී ඵලයට පත්වීම කියන්නෙ. ඒ කියන්නෙ නිමිති බැස ගන්නෙ නැහැ. අනිමිත්ත වෙනවා.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** එතන තමයි අනාගාමී අවස්ථාව. හැබැයි මේ කතාව තවත් එහාට තියෙනවා. මේකෙන් අරහත් මාර්ග සිත් වලට එනවා. අරහත් මාර්ග සිත්වලට එනව කියන්නෙ තමාටම රාග ද්වේෂ මෝහ කෙලෙස් සංසිඳෙන ස්වභාවය, අභ්‍යන්තරයට සිහිය පැවැත්වීමක් තියෙනව. දැන් කොහොමත් බාහිර කතාවක් නෑ. හැබැයි අභ්‍යන්තරයට සිහිය පවත්වන වෙලාවෙදි හැම දෙයකටම කම්පනය වෙන්නෙ නැහැ. මේකෙ අර කවුරුහරි බැන්නත් එකයි, ගැහුවත් එකයි. මොනවහරි වටින දෙයක් කැඩුණත් එකයි ගාණක් නැහැ. හැබැයි මේ ස්වභාවය මොනවහරි නොකරන ස්වභාවයකුත් නෙවෙයි. මොනවහරි දෙයක් උනොත් දරුව හරි ලෙඩ උනොත් යමු පුතේ බෙහෙත් ගේන්න කියල වෙනද වගේම කරනවා. කම්මැලි කමක් නැතිව. අපි වෙනදට හෙට යමු කිව්වට මේ වෙලාවෙදි යමු දැන්ම කියල කරනවා. ඒ වගේ කම්මැලි ස්වභාවයක් නැතිව දැන් නැවුම් ස්වභාවයක් තියෙනවා. හැබැයි විඳවන්නෙවත් නැහැ. කිසිම විඳවීමක් නැහැ. මෙතනදි අර සැප දුක කියන ඒවත් ගාණක් නැහැ. අමුතුම ස්වභාවයක් මෙතන තියෙනවා. මාර්ග ස්වභාවය වෙනයි. ඒකෙන් මෙනෙහි වෙන ස්වභාවය මාර්ගයමයි.

ඉතිං ඕකෙ රාග ද්වේෂ මෝහ ස්වභාවය කම්පන චංචල ස්වභාවයකුත් දැනෙන්නෙ. අවසානයේදී කම්පනය වෙන කම්පනය නොවන ස්වභාවය, අරමුණුවලට කම්පනය වන ස්වභාවය නොවන ස්වභාවය, දියවන ස්වභාවය සිහියට හසුවෙනවා. ඥනයට අසු වෙනවා. මේක තමයි ආසවක්ඛ්‍යා ඥානය. ඒ ආසවක්ඛ්‍යා ඥානය තමයි මේකෙ දිගටම දිගටම දිගටම අවසානයයේදී කරනව නෙමෙයි මුකුත් දැනෙන එක දිගටම ඒක තමයි අරහත්වයට යනකම්ම ඒක ඥානය (සිහිය) පවතිනවා. තමන් දන්නවා තමාට සාන්දිට්ඨිකයි අරහත්වයට පත්වී නැතිබව.

**උපාසිකාව:** ආර්යයන් වහන්ස මට ගිහි ගෙදර මේක ගැටලුවක් වෙන්නෙ නැද්ද?

**ආර්යයන් වහන්සේ:** ඕක හිතනවා කියන්නෙ ඔබතුමිය තාම ඉන්නෙ විචිකිච්ඡාව තියෙන තැන.

**උපාසිකාව:** ආර්යයන් වහන්ස මං කවදාවත් පොතේ දැනුම හෙව්වෙ නැහැ. මාර්ගය අහුවුණ තැන ඉඳල කටයුතු කරා.

**ආර්යයන් වහන්සේ:** ඔය කියන වචන තියෙනව නේද? ඕවා විතක්ක. ඔය විතක්ක කියන්නෙ ඔය හැම එකක්ම නිමිත්තක්.

# පස් වැනි දේශනය

**උපාසිකා:** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස. මං ඔබ වහන්සේට කලිනුත් කතා කරා. ඔබ වහන්සේ අවිවේකයි කියපු නිසා මට ගන්න බැරි උනා. ආර්යයන් වහන්ස, මට මේ අවස්ථාව ටිකක් දෙන්න පුළුවන්ද ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** හරි කියන්න.

**උපාසිකා:** ආර්යයන් වහන්ස මට පොඩි ගැටලුවක් තියෙනවා අර මොහොතට අවධිය කියන තැන. මම ධර්මය දකිමින් ඉන්න කොට ඒ පත්වෙන අවස්ථාව ද කියල මට චුට්ටක් දැනගන්න ඕනි. ඒකයි ආර්යයන් වහන්ස ගත්තෙ මම.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමිය කොහෙන්ද?

**උපාසිකා:** මම රත්නපුරෙන් ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** මේ අවධිය කියල කියන්නෙ දර්ශනයෙන් මතුවන එකක්.

**උපාසිකා:** එහෙමයි ආර්යයන් වහන්ස. මම ධර්මය දකිමින් ඉන්න කොට නිකම් අමුතු තැනකට වැටුණ මාව. එතන ආර්යයන් වහන්ස ජේනවා. ඔක්කෝම ශබ්ද ඇහෙනවා. හැබැයි එතන හරිම නිහඬයි ආර්යයන් වහන්ස. හරිම නිහඬයි. එතනම ඉන්න පුළුවන්. කිසිම කරදරයක් නැහැ. සතුටක් කියල දෙයකුත් නැහැ. මට එතන මොකක්ද කියල තේරෙන්නෙ නැහැ. මගෙ ඥානය මදි මට ඒක තේරුම් ගන්න

ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඔය ඉන්නෙ අර මායාවෙන් ආපු අපි මොනවහරි අත්දකිනව නම් ඒ විඤ්ඤාණ මායාවනෙ.

**උපාසිකාව:** ඔව්.

**ආර්යයන් වහන්සේ:** අපි මේ කරන්නෙ මෙනෙහි කිරීමක්නෙ. මෙනෙහි කිරීමෙන් තොර දෙයක්. මෙනෙහි කිරීමෙන් තොර දෙයක්නෙ අපි මේ '**අවිතක්ක**' කියල කියන්නෙ. නමුත් මේ සවිතක්ක කියන ස්වභාවය තමයි යෝගාවචර ස්වභාවය. මාර්ගය තුළ ඉන්න ස්වභාවය. දැන් අපි මේක මෙනෙහි කරනවනෙ. මොහොතට අවදිය කියන්නෙ මොකක්ද කියල. අවබෝධයක් නැති නිසානේ. දැන් බැලූ බැල්මට සමහර අය බාහිරින් උඩින් බලල විග්‍රහ කරනවනෙ. අතීත සිත ගිහිල්ල ඉවරයි. අනාගත සිත තාම ඇවිල්ල නැහැ. දැන් මේ මොහොත විතරයි. මේ මොහොතේ සිතත් ඇත්ත නෙමෙයි කියල.

**උපාසිකාව:** මම ආර්යයන් වහන්ස සිත හැදෙන හැටි බලන් ඉන්නවා. හුස්මට සිත ගන්නවා. ඒ හුස්මට හිත අරන් ටිකක් වෙලා.

**ආර්යයන් වහන්සේ:** කොහොමද ඒක කරන්නෙ බලන්න කියන්න.

**උපාසිකාව:** මං ආර්යයන් වහන්ස පැහැදිලි තැනක ඉන්නෙ. බාහිර පරිසරය දිහා බලන් තමයි මම ඉන්නෙ. දැන් ගස් කොළන් තමයි ගොඩක් පේන්නෙ. ඉතිං ඒ වෙලාවෙ ඔන්න මං දැන් බලාගෙන ඉන්නවා. එතකොට දැන් සිතවල් හැදෙන හැටිත් මට පේනවා. එතකොට අර අමුතු ස්වභාවයකට හිත පත්වෙනවා. ඒ කියන්නෙ ඔක්කෝම පේනවා. පරිසරයේ සියුම් ශබ්ද පවා ඇසෙනවා. ඒ වෙලාවට හරිම නිහඬයි. මං ඉන්නෙ ඇස් දෙක ඇරගෙන. භාවනායෝගීව නෙවෙයි ඉන්නෙ. මට ඉඳගෙන ඒ අවස්ථාවට පත්වෙන්න පුළුවන්. රෑට නිදා ගන්න ගිය විට ඒ අවස්ථාවට පත් වෙන්න පුළුවන්. ආර්යයන් වහන්ස මට රෑට නින්ද ගියත් ඇහැරිලා වගේ ගතියක් දැනෙනවා. ඒක අර හීනය තුළ

හීනය කියල ඔබවහන්සේ කිව්වෙ ඒක ද දන්නෙත් නැහැ. හැබැයි මට අවදියෙන් හිටිය වගේ දැනෙනවා.

**ආර්යයන් වහන්සේ:** ඒ අවදියෙන් ඉන්න එක හීනය තුළ හීන නෙමෙයි.

**උපාසිකාව:** මට දැනෙන්නෙ ඇහැරිලා වගේ දැනෙන්නෙ. හැබැයි හොඳට නින්ද ගිහිල්ලා. මට එහෙම ගතියක් තියෙනවා ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඒ කියන එක හරි. ඒක අවිධිමත් ස්වභාවයක්. දැන් ඔබතුමිය මේ වෙනකොට ධර්ම දේශනා කීයක් විතර අහල තියෙනවද?

**උපාසිකාව:** 500කට විතර කිට්ටු වෙන්න අහල තියෙනවා.

**ආර්යයන් වහන්සේ:** ඒක තුළ දැන් දැනුමෙනුත් එනවනෙ. මේ විඤ්ඤාණ මායාව කියලා. මේ අඹ ගහ තියෙනව. කොස් ගහ තියෙනවා. හැබැයි මේ හැම දෙයකින්ම මිදුණ ස්වභාවයක් දැන් තමන් ධර්මය තුළ අහනවනෙ.

**උපාසිකාව:** ඔව්. ආර්යයන් වහන්ස මට මේ අඹ ගහ කියල....?

**ආර්යයන් වහන්සේ:** දැන් මේ අඹ ගහ කියල අපිට පේනව වගේම, නං අපිට හිතෙනවනෙ ඒ හැම දේකින්ම මිදුනු ස්වභාවයක් තියෙනවා කියලා. අරමුණු වෙනවනෙ මනසිකාර කෙරෙනවනෙ. අහපු ධර්මය මෙනෙහි වෙනවනෙ ඒ මොහොතේ අහපු ධර්මයට වැඩ කරනවනෙ මෙහෙම මිදුණ ස්වභාවයෙක් ගැන, යම්කිසි අරමුණක් සකස්වෙනව නේද? ඇතුළාන්තයෙන්ම.

**උපාසිකාව:** පස්සෙ මං ඔබ වහන්සේගේ දේශනා කීපයක් නැවත ශ්‍රවණය කරා. ඒක ආවට පසුව. මුල් දේශනා. ඒත් මේක මෙතනද කියල මට දැනෙන්නෙ නැහැ. කොහොම හරි අමුතු තැනක් ඒක. නිශ්ශබ්දයි කියන්නත් බැහැ. මට පරිසරයේ ඔක්කොම ඇහෙනවා පේනවනෙ සියුම් ශබ්ද පවා ඇසෙන හරි සියුම් තැනක්. හරිම ශාන්තයි.

**ආර්යයන් වහන්සේ:** මොකක්ද ඔය තැනක් කියන්නෙ?

**උපාසිකාව:** දැන් ඒක තැනක් තියන්නෙ තැනකට නෙමෙයි. ඒක සාමාන්‍යය ස්වරූපයෙන් වෙනස් ස්වභාවයක් අර ඝෝෂාකාරී ස්වභාවයෙන් මිදුණු තැනක්.

**ආර්යයන් වහන්සේ:** නිවන් මග මොකක්ද?

**උපාසිකාව:** නිවන් මග කියන්නේ ආර්යයන් වහන්ස මට දැනෙන විදිහට කෙලෙස් සංසිඳෙන මගනෙ.

**ආර්යයන් වහන්සේ:** ඔව්. රාග, ද්වේෂ, මෝහ කෙලෙස් ප්‍රහානය වීමනෙ.

**උපාසිකාව:** අනික ආර්යයන් වහන්ස මගේ වෙනසක් තියෙන බව පැහැදිලියි. මම මීට මාස ගාණකට කලින් හිටියට වැඩිය වෙනසක් පැහැදිලියි.

**ආර්යයන් වහන්සේ:** ඔය ඔක්කොම හරි. ඔබතුමිය ගුරුවරියක් නේද? ඔබතුමියගෙ ගම් පළාත කොහෙද?

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස. මම රත්නපුර කුරුවිට ආර්යයන් වහන්ස. මම මීට කලින් ඔබ වහන්සේට කතා කරා. එතකොට මං මොකුත්ම ධර්මය ගැන දන්නෙ නැහැ.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමිය මේ කියන ධර්මය හොඳට අහල තියෙනවා. හොඳට තේරෙනවා. දැනුමට ඔක්කොම දාන්න. හැබැයි ප්‍රායෝගිකව හොයන්න යන එක වැරදියි.

**උපාසිකාව:** මං හෙව්වෙ නැහැ ආර්යයන් වහන්ස. ඔබ වහන්සේ එතනදි කියනවනෙ අර හිත දකින්න කියලා. එතකොට ඔන්න දැන් ශබ්දයක් ඇහෙනවා. ටිං ටිං ගාලා එතකොටම ලේනා කියලා දැනෙනවා ශබ්දේ. එතකොට තමයි අර අමුතු පැහැදිලිවීමක් වෙලා මේ තැනට වැටෙන්නෙ.

**ආර්යයන් වහන්සේ:** ඕක මනෝ විකාරෙකට අහුවෙලා කියල හිතෙන්නෙ නැද්ද?

**උපාසිකාව:** ඒක තමයි ආර්යයන් වහන්ස. මම මේක ඉක්මනටම ඔබ වහන්සේට කිව්වෙ.

**ආර්යයන් වහන්සේ:** කියපු එක හොඳයි. කියපු එක හොඳයි. හොඳයි, මම ඔබතුමියට මොකුත් එහෙම නරකක් කියනවා නෙමෙයි. එක තැනක තියෙනවා හරි සියුම් කෝණයක්. ඒ කියන කෝණය බොහොම සියුම්. මේ දහමෙ කොහොමත් විජ්ජා මැජික් නැහැ. පළමුවෙනි එක. එතකොට ඔය හැමදේම තියෙනවා. හැබැයි අවිධිමත් ස්වභාවයක්. මිදුණ ස්වභාවයක් දැනෙනවා කියන එක අර ඇත්තටම දැන් ධර්මය තුළ අවබෝධයක් අභ්‍යන්තරයෙන් මතුවෙනවනෙ. අභ්‍යන්තරයෙන් මතුවෙනවනේ මේ දරුව කියල නොදැනෙන ස්වභාවයක් සිහියට හසුවෙනවනේ.

**උපාසිකාව:** මේ බාහිර දේවල් ගැන ඇල්ම අඩුවෙන බව දැනෙනවා ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** අන්න ඒ දැනෙන ස්වභාවය තමයි අවධිය. මේක හොඳට අහගන්න. කලබල වෙන්න එපා. දැන් දැනෙන ස්වභාවය තියෙනවා නේද දරුව කියල, ගෙවල් කියල. ඒ ඒක තමයි අවධිය. වෙන අවධියක් නැහැ.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** දැන් ඔය සිතින් මොනාහරි හෙව්වොත් ඒක මනෝ විකාරයක් වෙනවා.

**උපාසිකාව:** මායාවට අහුවෙලා නේද ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඒකම මායාවක් වෙනවා. ඒක සිතුවිල්ලක්. අවදිය කියන්නේ දැනෙනවනේ සිහියට ඥානෙට අසුවෙනවනෙ, අගයක් නැති ස්වභාවයක්. ටික ටික දරුව කියල මහත්තයා කියල ගෙවල් කියල අගය දියවීගෙන යන ස්වභාවයක් දැනෙනවනෙ. ඒත් එක්කම සැහැල්ලුවක් දැනෙනවනෙ.

**උපාසිකාවඃ** එහෙමයි ආර්යයන් වහන්ස. මට හිතෙනවා මං දැනුයි ජීවත් වෙන්නෙ කියල.

**ආර්යයන් වහන්සේඃ** එතැනින් එහා මේ පොල් ගහ තියෙනවා. අඹ ගහ තියෙනවා කියල පේනව කියලා හිතනවනෙ, මේක ඇවිල්ල ආටිපිෂල් ඕපපාතිකව ගත්තඑක මේක ඔර්ජිනල් අවධිය නෙමෙයි. මේ අර අහපු ධර්මය ඵලයට එනවිට අසුවන දෙයක්. ඒ කියන්නෙ දැන් හිතනවමෙහෙම දෙයක් තියෙනවා කියල, හිතල හොයන එක. දැන් මේ අඹ ගහ නා ගහ තියෙනවා. මේ මොකුත් නැති එකක් කියල හිතුවොත්, ඒක විඤ්ඤාණ මායාව. ඒක අවධිය වගේ තමයි පේන්නෙ. ඒක විඤ්ඤාණ මායාව. එහෙම එකක් නෙමෙයි සැබෑම අවධිය. සැබෑම අවධිය කියන්නෙ, දැන් දරුව කියල ගෙදර කියල අගයක් එනවනෙ. ඒ අගය දියවීගෙන යන ස්වභාවය තමයි අවධිය කියන්නෙ. අරක නෙමෙයි. අරක ඇවිල්ල දර්ශනය හොයන එකනෙ, තියෙනවා කියන එක. හැබැයි මෙතනත් තියෙනවා ඔන්න ඕකම. මෙතන වටිනාකමත් දියවීගෙන යන ස්වභාවයක් දැනෙනවා දරුව කියල ගෙවල් කියල, තමන්ගෙ රූපෙට, ඔය ශබ්දය කියල, දැන් අපි කතා කරන වචනවල, සිතුවිලිවල, දෙයක් කියල, නැති බව. මේ කිසිම දේකට කම්පනය වෙන්නෙ නැහැ. අකොප්පා චේතෝවිමුක්තිය කියන එක අකම්පිතයි.

අන්න එතන තමයි බැස ගන්නෙ නැති ස්වභාවය. අර බැස ගන්නෙ නැති නිසානෙ අගයක් පෙන්නන් නැත්තේ. ඒ අගයක් නැති බව ඥානෙට හසුවෙන එක තමයි. ආසවක්ඛයා ඥානය. ආස්‍රව කෙලෙස් ක්ෂයවෙන ඥානය, අන්න එතන මතුවෙනවා අවධියක්. අර අගය නැතිවෙන කොටම ඇති වෙන අවධියක්, ඒක තව තව දියුණුවෙනවා. විචරිතෝ විජධීතෝ එතකොට අගය නැතිවෙලා නැතිවෙලා කිසිම දේක අගයක් නැති අවධියක් මතුවෙනවා. අන්න එතනයි තියෙන්නෙ 'රාග ක්ඛයෝ ද්වේශක්ඛයෝ මෝහක්ඛයෝ නිබ්බානෝ' කියන රාග, ද්වේෂ, මෝහ කෙලෙස් සංසිඳෙන අර කිසිම දේකට නොඇලෙන 'නිබ්බිදන්ති විරාගන්ති.' කිසිම ඇල්මක් නැහැ. විරාගයට යනවා. නිබ්බිදාවට යනවා අන්න නිරෝධෙට යනව අන්න එතනයි අවධිය තියෙන්නෙ. මේ හැමදේම

අවසානයට යනකොට අර හැම එකම මිදුන ස්වභාවයක් තමයි දැනෙන්නෙ. තියෙනවා, පේනවා, දැනෙනව උනාට අගයක් නැහැ. ඕකයි ඔය විග්‍රහ කරන්නෙ. දැන් ඕක කවුරුහරි පිටින් හෙව්වොත් අඹගහ තියෙනවා. ඒක නැති උනා වෙන ගහක් දැක්කා. ඒක නැති උනා කියල හෙව්වොත් ඒක වෙනින් කතාවක්.

**උපාසිකාව:** ඒක විඤ්ඤාණ මායාවට අසුවීම නේද ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඔව්. විඤ්ඤාණ මායාවට අසුවීම. ඒක හීනයක්.

**උපාසිකාව:** හැබැයි ආර්යයන් වහන්ස මට මෙහෙම එකක් තියෙනවා. මං හරියට කතා කරනවා. මං ගුරුවරියක් වීම නිසා නිතරම අපි කතා කරනවනෙ. දැන් හැබැයි මට ඉස්සර වගේ වැඩිය කතා කරන්න හිතෙන්නෙ නැහැ. මං පැත්තකට වෙලා ඉන්නවා.

**ආර්යයන් වහන්සේ:** අන්න ඒ තත්ත්වෙට සිහිය පවත්වා ගන්න. අවධිය එතකොට සිහියට අසුවෙනවා. ඒක තමයි දියුණුව.

**උපාසිකාව:** ඒක තමයි මට ලොකුවටම දැනෙන්නෙ.

**ආර්යයන් වහන්සේ:** විතක්ක විචාර සංසිඳෙනවා. ප්‍රීතිසුඛ ඒකාග්‍රතා කියන මග  විදර්ශනා සමාධිවලත් එනවා. ඒක තමයි අවධිය. ඒ අවධිය එන්නෙ අර අගයක් නැතිවෙන අවස්ථාවෙදි.

**උපාසිකාව:** මට දැන් කා එක්කවත් දොඩමළු වෙන්න යන්න හිතෙන්නෙ නැහැ ආර්යයන් වහන්ස. පැත්තකට වෙලා ඉන්නවා.

**ආර්යයන් වහන්සේ:** දෙතිස් කතාවලට එච්චර යන්නෙ නැහැ. හරයක් නැති නිසා. හැබැයි අභ්‍යන්තර ප්‍රඥාවක් එනවා අවධිවෙලා, තාම ඔබතුමිය මාර්ග සිත්වලනෙ ඉන්නෙ. ඵල සිතේ ස්වභාවය ඔයිට වැඩිය ගොඩක් වෙනස්. මාර්ග සිත් ඵල සිත් කියල දෙකක් තියෙනවනෙ. දියුණු අවස්ථාවක් එනව ඕකෙ ටික දුරක් යනකොට. ඒ කියන්නෙ මේ මිදුණ ස්වභාවයක හිටිය උනාට සාමාන්‍ය විදිහට ඔක්කොමත් එක්ක බැහැල වැඩ කරන්න පුළුවන් වෙනවා.

**උපාසිකාව:** මට අර කතාව අඩු වුන බව හොඳටම දැනෙනවා ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඒ ඔබතුමියගෙ විතක්ක වැඩිය තිබුණු නිසා. හැබැයි දැන් අවසානෙදි මොකුත් තියාගන්නවත් හිතෙන්නෙ නැහැ නේද?

**උපාසිකාව:** හැබැයි ආර්යයන් වහන්ස ඇල්මැරුණු ස්වභාවය නම් එනව. ආර්යයන් වහන්ස දැන්.

**ආර්යයන් වහන්සේ:** ඒක එන්නෙ ඔය මැද හරියෙදි තමයි. ඒ නිබ්බිදාව එනවා. වැරදියි කියල සැක, සංකාවකුත් එනවා. 'පටිසංඛාර ඥාණය' කියන්නේ ඒකයි. මොකද මේ කිසිම දේක හරයක් නැති වෙනවනෙ නන්දිය නැතිවෙනවනෙ ඇලීම නැති වෙනවනේ.

**උපාසිකාව:** කිසිම දේකට කැමැත්තක් නැහැ ආර්යයන් වහන්ස. වෙනද වගේ නැහැ. මට සැහැල්ලු බවක් දැනෙනවා. එතකොට ආර්යයන් වහන්ස නින්ද ගියත් අවදියෙන් වගේ දැනෙන්නෙ ඇයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඒ අවිධිමත් ස්වභාවය. කිසිම දේකට කම්පනය නොවන ස්වභාවය. ඒ ස්වභාවය දිගටම වගේ තියෙන එක? හැබැයි නින්ද යනව. යන්නෙ නැතිව නෙමෙයි. ගැඹුරු නින්දට යනවිට ඒක දැනෙන්නෙත් නැහැ. අඩ නින්දෙ තමයි ඒ ස්වභාවය තියෙන්නෙ.

**උපාසිකාව:** එක දවසක් මට හොඳටම දැනුණා. දැන් මගේ ප්‍රතික්‍රියාවක් නැහැ කියල හිතෙනවා.

**ආර්යයන් වහන්සේ:** ඔය ටික තියෙන්නෙ මැද හරියෙදි ඔතන තමයි. **රැවටෙන කාලයක් එනවා මැද හරියෙදි.**

**උපාසිකාව:** කාලයක් ආර්යයන් වහන්ස මට කම්මැලි ගතියක් තිබුණා. ඔබ වහන්සේගේ දේශනා අහනකොට මට ඇහුණා.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමිය තාම මැද ඉන්නෙ. අදියර 4කට

එනවනෙ. **සෝතාපන්න බාහිරින් මිදෙණ තැනක් එනවා. අනාගාමී භූමියෙන් එනවා, සකෘදාගාමී භූමියෙන් එනවා.** ඔබතුමියට තමයි සාන්දිට්ඨික වෙන්නෙ. ඔබතුමිය තමයි දන්නෙ බාහිර අරමුණුවලට කොච්චර දුරට බැසගෙන තියෙනවද කියල.

**උපාසිකාව:** මට මේ දහමට හිත හැදෙන එකටත් ගොඩක් කල් ගියා ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** නෑ. නෑ. මම අහන ප්‍රශ්නෙට උත්තර දෙන්න. ඔය එන්නෙ විතක්ක. ඒ කියන්නෙ බාහිරට කොච්චර දුරට දැනෙනවාද, තාම බාහිර දැනෙනවද කියන ස්වභාවය.

**උපාසිකාව:** බාහිර කිසිවක් නැහැ කියල දැනෙනවා.

**ආර්යයන් වහන්සේ:** මේ කියන්නෙ සිතුවිලිත් නෙමෙයි. දැනුමත් නෙමෙයි. ඒවා මනසිකාර. එකක්වත් විඤ්ඤාණ මායාව නෙමෙයි මේ කියන්නෙ. "සබ්බ පාපස්ස අකරණං" නෙමෙයි මේ කියන්නෙ. ඒවා සිතුවිලිනෙ. ඔබතුමිය හොඳින් පිරිසිදුවට නිර්මලව ගලපා ගන්න ඕනි මේ දහම. එහෙට මෙහෙට දුවන කොට අපි දන්නවා තම සෘජු රේඛාව අඳුරන්නෙ නැහැ කියලා. මේ සෘජු රේඛාව මොකක්ද මෙතන බාහිරට සිහියක් තියෙන්න ඕනි. මේ සිත තාම බාහිර ලෝක සංඥාවල බැස ගන්නව.

**උපාසිකාව:** බැස ගන්නව ආර්යයන් වහන්ස. මම ඉන්නව හොඳටම දැනෙනව මට.

**ආර්යයන් වහන්සේ:** ඉතිං මම නැති වෙන්න රහත් වෙන්න ඕනි නෙ.

**උපාසිකාව:** එහෙමයි.

**ආර්යයන් වහන්සේ:** මේ කියන්නෙ ඒක නෙමෙයි. ඒ කියන්නෙ ඉන්න තැන හඳුන ගන්න එක. ඒ කියන්නෙ බාහිරට නිතරම ඇලෙනවා නම් බාහිරත් එක්ක නිතරම ගැටෙනව නම් නැතිනම් ඒකෙන් මිදුණ ස්වභාවයක් ද. අන්න එතනට සිහිය තියෙන්න ඕනි. 'ආසවක්ඛයා ඥානය' හොඳින්

තියෙන්න ඕනි දියුණුවෙන්න. ඔය ලාහෙට ගෙම්බො අල්ලනව වගේ නෙමෙයි අනුපිළිවෙළින් හොඳින් සිහියෙන් නුවණින් පුරුදු වෙන්න ඕනි. ඒ කියන්නෙ ටිකෙන් ටික ටිකෙන් ටික බාහිරත් එක්ක තියෙන, ඒ කම්පන ස්වභාවය, දියවීගෙන යන ස්වභාවය අසුවෙන්න ඕනි. මේ දරුව කියල වෙනද වගේ යන්නෙ නැහැ. ගිනි ගන්නෙ නැහැ.

**උපාසිකාව:** නැහැ ආර්යයන් වහන්ස. මං වෙනදට පුතාට නිතරම කෝල් කරනවා. දැන් කොතනද ඉන්නෙ. දැන් කොතනද ඉන්නෙ කියලා. මොකද කරන්නෙ. දැන් ලෙක්චර්ස්ද කියලා. දැන් ඒවා නැහැ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඒ වගේම තියෙන්න ඕනි අර අභ්‍යන්තරයට සිහියට මේව අසුවෙන්න ඕනි සිහියට තියෙන්නෙ ඕනි හොඳ, තමන්ට සාන්දිට්ඨික වෙන්න ඕනි. තමන් හොඳින් මේක හඳුන ගන්න ඕනි. අර 'නිස්සරණ' කියන්නෙ. අපි බාහිර දෙයක් වගේ දැනෙන ස්වභාවය කොයිතරම් දුරට මිදිල තියෙනවද කියල. මේ සිතම බව දැනෙන ඒක වෙනම එකක්. ඒක හොඳින් මෙනෙහි කරල තියෙන්න ඕනි.

**උපාසිකාව:** ඔව්. ඒක සිහි කරනව ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** හිතන එක වෙනයි. දැනෙන එක වෙනයි. මේ හැම එකම අපි කතා කරන්නෙ සිතන එකෙන් නෙමෙයි. දැනෙන එකෙන් කතා කරන්නෙ.

**උපාසිකාව:** මට හිතෙන්නෙ මං තාම ඉන්නෙ හිතන තැන කියලා ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඒ විතක්කවල තියෙන්නෙ. ඒ විතක්කවල හිතන ගතිය තියෙනවා. දැනෙන ගතිය හොඳින් බලන්න ඕනි. කල්පනාවෙන් සිහියක් තියෙන්න ඕනි. හිතන බවකුත් තියෙන්න ඕනි. ඒක දැනගෙන තියෙන්නඕන සිහියට හසුවෙන්න ඕනි. ඒ වගේම දැනෙන ස්වභාවය අනුව තමයි තීරණය කරගන්නඕන කොතනද ඉන්නෙ කියලා.

**උපාසිකාව:** ඇත්තටම මට හිතෙනවා මට ඥානය මදි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** නෑ. නෑ. ඔය මොනවත් නෙවෙයි, ඔය එක එක අන්තවලට රිංගනවා ඔබතුමිය. ඔබතුමිය කලබල වැඩියි. ඒ කියන්නෙ ඔබතුමිය අන්තවලට රිංගන්න ඕනි නැහැ.

**උපාසිකාව:** එහෙමයි.

**ආර්යයන් වහන්සේ:** ඒ කියන්නෙ මේ ස්වභාවය සිහියට නුවණට හසුවෙනව කියන එකයි. මෙතන හොඳින් සිහියෙන් නුවණින් අරමුණු කරල නැහැ ඔබතුමිය. එච්චරයි තියෙන්නෙ. අපි දකින විදිහ. ඔබතුමිය එහෙට මෙහෙට ගිහින් තම මාර්ගය ඍජුව හඳුනාගෙන නැහැ. අර දේශනා ඇහුවට, **හරියටම අර හීන්නූලෙන් මේක හසුකරගන්න ඕනි. එතකොට අර සිහියට අසුවෙනවා අර බාහිරින් මිදි මිදී යන ගමන. ඒ වගේම මේ සිතම බව, මේ හැම එකක්ම සිතම බව, මෙනෙහි වෙන්නත් ඕනිනෙ.**

**උපාසිකාව:** ඔව්. ආර්යයන් වහන්ස. මෙනෙහි වෙන්න ඕනි.

**ආර්යයන් වහන්සේ:** කලබල වෙන්න එපා. එහෙට මෙහෙට දුවනවා නම් ඔබේ සිත...

**උපාසිකාව:** මට කොහොමත් ස්වාභාවික ජීවිතේ කලබල ගතිය තියෙනවා ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමිය සිහිය දියුණු කරන කමටහනකුත් තියා ගන්න. ඉරියව්වට හැම මොහොතෙම සිහිය පවත්වා ගන්න.

**උපාසිකාව:** මට ටිකක් අර හුස්මට හිත ගන්න එක තමයි ආර්යයන් වහන්ස මම විවේකීව ඉන්න කොටත් මං කරන්නෙ.

**ආර්යයන් වහන්සේ:** සමථ කමටහන කරන්න. ඔය ඉස්සරහ තියෙන කොස් ගහක් දිහා බලාගෙන හිටියත් සමථ කමටහන තමයි.

පොල් ගහක් දිහා බලාගෙන සිත වෙන කොහේවත් යන්නෙ නැතිනම් ඇස් දෙක පියාගෙන ඒ අරමුණට ඒකාග්‍ර වෙනවා. බුදු පිළිමයක් දිහා බලාගෙන බුද්ධානුස්සතිය වැඩුවත් ඇස් දෙක පියාගෙන ඉන්න කොට ඒ පිළිමය පේනව, එතකොට බුද්ධානුස්සති වැඩෙනවා. ඒ විදිහට ඕනෑම අරමුණකට සිහිය පවත්ව ගන්න පුළුවන්. එතකොට ඒක චිත්ත ඒකාග්‍රතාවකට එනවා. ඒ විදිහට ඒක සිහිය දියුණු වෙන්න බලපානවා. හැබැයි අභ්‍යන්තර අවිඩිමත් ස්වභාවයක් එතකොට මතුවෙනවා. ඒ කියන්නෙ සාමාන්‍යයෙන් අර 'විදර්ශනා විපස්සනා ඛණික සමාධි' කියන කොට, අර අරමුණු වලට බැස ගන්න ස්වභාවයට අර සිහියක් තියෙන එක තමයි මෙතන වැදගත් වෙන්නෙ.

සිහිය කියන එකට, සිහියට මොකුත් කරන්නෙ නැහැ. ඔය හැම දේකටම සිහියක් තමයි පවතින්නෙ. **හැබැයි අර මිදෙන ස්වභාවය එනකොට සිහියට හසුවෙනවා. ඒ වගේම බාහිරද ඉන්නෙ, සිතේ ද ඉන්නෙ, සිතුවිලි ද කියල හඳුනනවද, ඒක මෙනෙහි කළාද කියල හැමතැනම ඒක සිහියට හසුවෙනවා.** හැබැයි ඒ මග තමන් හඳුන ගන්න ඕනි. එතකොට එතන මනසිකරෝති කියන කොට අරමුණුවලට බැස ගන්නවා නම් පොඩ්ඩක් මෙනෙහි වෙන්න ඕනි මේක සිතුවිලි නේද කියලා. ඒක ඔබතුමියගෙන් වෙනව. ඔබතුමියගේ සිහිය තමයි දියුණු කගන්න ඕනි.

ඔබතුමියට 'යථාභූත ඤාණය' තියෙනවා, ඔබතුමියට යෝනිසෝමනසිකාරයත්, මෙතන හැබැයි තව හොඳින් සිහිය පොඩ්ඩක් ආව නම් හරි. ඒ අඩුපාඩු ටික හදා ගත්ත නම් හොඳටම ප්‍රකටවෙලා ඒ අවිඩිමත් ස්වභාවය අභ්‍යන්තරයෙන්ම මතුවෙනවා. එතකොට ඔබතුමියට දැනෙනවා බාහිර දෙයක් නැති බව. ලෝක සංඥාවල මිදෙන ස්වභාවයක්. එතකොට සුගතිපරායනවන බවක් දැනෙනවා. **මේ සෝතාපන්න කියන්නෙ, බාහිර දෙයක් නොවන ස්වභාවයනෙ. සමාපත්ති සුවය කියනඑක හසුවෙනවා. එතකොට සිතම බව දැනෙනවා. සිතෙත් දෙයක් නැති බව අනාගාමී භූමිය.** හැබැයි ඒක එක මොහොතෙන් සිහිවෙන්නත් පුළුවන් සිහිකරන්නත් පුළුවන්. බැස ගන්න අරමුණු වලදි සිත දකින කොට මෙතන දෙයක් නැති බව ඕන්නම් දකින්නත් පුළුවන්. ගැටලුවක් නැහැ හැබැයි තමන්ට සිහියක් තියෙන්න ඕනි තමන්

තාම බාහිර ලෝක සංඥාවල බැස ගෙන ද නැද්ද කියලා. දැන් ශබ්ද වර්ණවල දෙයක් නැහැනෙ.

**උපාසිකාව:** දැන් දෙයක් නැති බව හිතනවා නේද ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඔව් හිතනවා. ඒක අභ්‍යන්තරයට තව දැනෙන්නත් ඕනි. එහෙනම් ඒ ශබ්ද වර්ණ කියල දැනෙන්නෙ නැත්නම් බැසගන් නැත්නම් මෙනෙහි කරන්නත් ඕනි. ඔන්න ඔතන පොඩ්ඩක් ගළපගන්නයි ඕනි. අර සිහියට හසුවෙනව කියන එක හිතනව කියන එක මොකක්ද කියන එක. හිතට දැනෙන්නත් ඕනි.

**උපාසිකාව:** මට හිතෙන්නෙ අර සිහියට සිතුවිල්ල තව පොඩ්ඩක් අඳුර ගන්න ඕනි. බැරි ගතියක් තියෙනවා.

**ආර්යයන් වහන්සේ:** ඒක තමයි කල්‍යාණ මිත්‍රයාගේ පණිවුඩය තුළ ඕක හැදෙනවා.

**උපාසිකාව:** ඒක තමයි මම ඔබ වහන්සේට කතා කරන්නම ඕනි කියල හිතුවෙ.

**ආර්යයන් වහන්සේ:** සිහියට තමයි එන්න ඕනි. අරව වැඩක් නැහැ. ඒක සිතුවිල්ලෙන් හිතුවට කමක් නැහැ. හිත බැස ගන්නවා නම් හිතුවොත් ඒක මිදෙනවා. හැබැයි හැම තැනම සිහියකුත් තියෙන්න ඕනි. හැබැයි ඊට පස්සෙ ඒක මෙනෙහි කිරීමක් නැතිවම සිත මිදුණු ස්වභාවයක් දැනෙන්න ඕනි. ටිකෙන් ටික යනකොට. අන්න එතන 'අවිතක්ක අවිචාර' ඒක තමයි සමාපත්ති අවස්ථාව. අතන මාර්ග අවස්ථාව. මාර්ග සිත් ඵල සිත් කිව්වෙ. දැන් මාර්ග සිත් හැම තිස්සෙම මෙනෙහි කරන බව හිතනවා කියන එක. දැන් ඔබතුමිය යන්නෙ මාර්ග සිත්වල. ඔබතුමිය තාම ඵල සිත් තාම හඳුනගෙන නැහැ.

**උපාසිකාව:** එතකොට ආර්යයන් වහන්ස දැන් මම මේ මගට වැටිලද තියෙන්නෙ.

**ආර්යයන් වහන්සේ:** ඔව්. වැටිල තියෙන්නෙ. මාර්ගයේ ඉන්නේ.

**උපාසිකාව:** හොඳයි මට අන්න ඒක දැනගන්නි ඕනි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඉතින් ඔබතුමිය 'ඵල සිත' කොහොමද දකින්නෙ කියන එක දැනගන්න ඕනි නෙ.

**උපාසිකාව:** එහෙමයි.

**ආර්යයන් වහන්සේ:** දැන් 'සවිතක්ක සවිචාරයිනෙ' ඔය කියන මාර්ග සිත්වල ස්වභාවය. අපි හිතමු මනසිකරෝති, මෙනෙහි කරනවා, හිතනවා. නමුත් දැන් එතන නෙවෙයි හිතන තැනට නෙමෙයි, අභ්‍යන්තරයේ දැනෙන තැනට සිහිය පවත්වනවා. එතකොට හිතනවා නෙමෙයි තමන්ට වෙන දේට සිහියක් තියෙනවා. බැස ගෙනද, අන්න බැස ගත්ත බවට සිහියයි. බැස ගත්ත නම් අන්න ඒක මෙනෙහි කරනවා. බැස ගත්ත බවට සිහියයි. හැබැයි බැසගෙන නැත්නම් අන්න තමන්ට මෙනෙහි කිරීමක් නැතිවම මිදුනු නැති බවට සිහියයි. **"අවිතක්කං අවිචාරං සමාධි" මෙනෙහි කිරීමක් නැතිවම සිහියයි මිදුණ බවට.** දැන් මිදිල තියෙන අරමුණ මෙනෙහි කරන්න අවශ්‍යතාවක් නැහැ. **හැම එකම හිත හිත මෙනෙහි කරන්න ගියොත් උපාදානය වෙනවා.** ඒක තේරුමක් නැහැ. බැස ගන්නෙ නැතිව ඒව **බැස ගන්න ස්වභාවයක් එනවා. ආයෙ සිතන්න ගියහම. ඔරුව පෙරළෙනව කිව්වෙ** ඕකම තමයි.

**උපාසිකාව:** මට හැබැයි දැනෙනව ආර්යයන් වහන්ස අර වෙනද තරම් සිතුවිලි වැල්වල මං යන්නෙ නැති බව දැනෙනවා.

**ආර්යයන් වහන්සේ:** ඒක සිහියට හසුවෙනවා. ඒ සිහිය තමයි දියුණු කරගන්න ඕන. ඔබතුමිය පටලව ගන්න එපා. ඒවත් හිතන්න යනව ඔබතුමිය. දැනෙන ඒව කාටවත් කියන්න අවශ්‍යතාවකුත් නැහැ. ඒවා හිතන්න යන්න එපා. දැන් ඒවා හිතුවහම ඒවත් සිතුවිලි වෙනවා. දැන් මේ දැනෙන ස්වභාවය දැනෙන එකක්. එච්චරයි. වැඩක් නැහැනෙ ඒව කාටවත්. ඔබතුමියගෙ **ආධ්‍යාත්මික දියුණු වන දැනෙන ස්වභාවය. ඕක කියන්න ඕනි නැහැ කාටවත්. අන්න එතකොට ඔබතුමියගෙ ආධ්‍යාත්මික නිහඬතාව තුළ තව දියුණු වෙනවා. දැන් තමන්ට දැනෙන එකනෙ දියුණු කරගෙන යන්නෙ.** එතකොට අන්න නිවන් මග පාර එක හම්බ වෙලා තියෙනවා.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස. මං කලින් කතා කරද්දි මං මේ මගක අහල පහළකවත් හිටියෙ නැති බව මට හොඳින් දැනුණා.

**ආර්යයන් වහන්සේ:** නැහැ දැන් හොඳයි. දැන් අර හිතන එක වැඩියි ඔබතුමිය. තාම හිතන තැන අර පොඩ්ඩක් හඳුන ගන්න ඕනි. ඒක අඩු කරල, සිහියට තව ටිකක් අවධානය වැඩි කර ගන්න. දැන් හිතන පැත්තටනෙ බර වැඩියෙන්.

**උපාසිකාව:** ඔව්. මට දැනෙනවා ඒක.

**ආර්යයන් වහන්සේ: දැන් සිහියට හසුවෙන එකත් හිතන්න යනවනෙ. එතකොට හිතන පැත්තටනෙ වැඩි. ඒකයි වෙන්නෙ.**

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** මිදෙන බවට සිහියක් තියෙනවා. හැබැයි ඒක හිතන්න යනවා.

**උපාසිකාව:** ඔව් ආර්යයන් වහන්ස. මිදුණා මිදුණා කියල හිතනවා.

**ආර්යයන් වහන්සේ:** ඒකට කලබල වෙන්න එපා. ඒකයි කියන්නෙ අර හුරේ.. හුරේ කියල පොඩි ළමයෙක් උඩ පැන්නත් ඒ වගේ.

**උපාසිකාව:** සතුටක් දැනෙනවා ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඒ බොලඳ තැනට යන්න එපා. මේක ඇවිල්ල ආධ්‍යාත්මික ගමනක් නෙ. ඔව් ඒක නිසා නිහඬ වෙන්න ඕනි. **"ඛන්තී පරමං තපෝ"** අනික එතනට එන්න ඕනි. **"ඛන්තී පරමං තපෝ" ඒක තපස, ඒ නිහඬව ඉන්න එක. කාටවත් කියන්න යන්නෙ නැහැ. ආධ්‍යාත්මික දියුණුව. එතකොට ඒක තව තව දියුණු වෙනවා.** ඇයි යෝගාවචර භූමියේනෙ තාම ඉන්නෙ. එතකොට එනව අර සමාපත්ති අවස්ථාවට. එතකොට තමන්ටම සිහියට අසු වෙනවා දැන් බාහිරින් තමන් මිදිල කියලා. ඒ සමහර අය අපිට කතා කරන කොටම කියනවා ආර්යයන් වහන්ස බාහිරින් අපි ගොඩක් මිදිල ඉන්නෙ කියලා. ඒක

සිහියට හසුවෙනව කියලා. ඒ කියන්නෙ එයා හඳුන ගත්ත මොකක්ද වෙන්න ඕනි කියලා.

**උපාසිකාව:** ඒක මං හඳුනගෙන නැති බව තමයි මට දැනෙන්නෙ. මිදිල ඇති නමුත් මිදිල ඉන්න බවට මට සිහියක් නැහැ.

**ආර්යයන් වහන්සේ:** හොඳින් සිහිය දියුණු කරගන්න ඒ පැත්තෙන්, එතකොට ඕක හරි යනවා යෝනියෝ මනසිකාරයෙන්. හිතේ දියුණුව.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** එතකොට ඒකෙම තියෙනව හිතෙත් දෙයක් නැති බවට. ඊගාවට මිදෙන එකත් සිහියට හසුවෙනවා. තාම ගමන ඉවර නැහැ. පටන් ගත්ත විතරයි. සෝතාපන්න සිත තමයි අපි කියන්නෙ ඔය. අනාගාමී භූමිය, දැන් හිතෙනුත් මිදිල දැන් අර අවිධිමත් ස්භාවය අන්න එවිටයි එන්නෙ.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස. එතකොට මේ අවධිමත් ගතිය නිරන්තරයෙන්ම තියෙනවා තැනක හිතේ...

**ආර්යයන් වහන්සේ:** එතනට තාම ඔබතුමිය ගියෙ නැහැ. ඔබතුමිය මෙන්න මෙතනයි ඉන්නෙ. බාහිරත් හිතන ස්වභාවය තුළ ඉන්නෙ. එතැනින් ගිලිහිලා ඔබතුමියට සිහියට හසුවෙන පැත්තෙන් දියුණු වෙන්න ඕනි. එතකොට ඔබතුමියට සිහියට හසුවෙනවා, මේ බාහිර දැන් ගැටුමක් නැහැ, බාහිරට යන්නෙ නැති බවක්. ඒ වුණාට සිතේ තාම තියෙන බවක්. හැබැයි අන්න හිතෙත් මිදුණ ස්වභාවය මතුවෙනකොට එතකොට අන්න හිත පිහිටන්න තැනක් නැතිවෙලා, අන්න අවධිය මතු වෙන්න පටන් ගන්නවා. එතනයි මතුවෙන්නෙ.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** හරි. එකපාරටම කලබල වෙලා මේ එළියෙන් හොයන්න ගියාට වැඩක් නැහැ. එතකොට ඒ අවදියත් එළියෙන් හොයනවා.

**උපාසිකාව:** දැන් මට තේරෙනවා අවධිය සිහියෙන් හොයපු බව.

**ආර්යයන් වහන්සේ:** ඔව්. දැන් තේරුණා නේද අවධියත් එළියෙන් හොයල කියලා. මේ නුවණ නැහැ ගොඩක් අයට මේ අභිඤ්ඤා ඥානය.

**උපාසිකාව:** මම මටම බැන ගන්නවා. පද පරමද කොහෙද කියලා.

**ආර්යයන් වහන්සේ:** නැහැ නැහැ. ආයෙ අතනට ගියානෙ. ඔය එක එක අන්තවලට යන්න එපා කිව්වනෙ. අපි මුල ඉඳලා. ඔබතුමිය ටක් ගාලා අන්තෙකට රිංගන්න යනවා. ඒකට කියන්නෙ අපි නම් පණ්ඩිතකම කියලා. පද පරම නෙමෙයි. පණ්ඩිතයට ඒදණ්ඩෙ යන්න බැහැ කියන එක අහල තියෙනවනෙ. මේක ඇවිල්ල වෙනින් කතාවක් නෙ. ඔබතුමිය එකපාරටම එල වලට යන්න යනවා. අන්තෙට යන්න හදනවා. මට බැහැ අනම් මනම්. ඕව වැඩක් නැහැ. ඒව පැත්තකට දාන්න. ඒවා මනසිකාර ඔය විතක්ක. එතකොට අර කොලිට් එක නැහැනෙ. නිකම් පිස්සෙක් දොඩවනව වගේනෙ. ඒව පැත්තකට දාල, ඔබතුමිය අර කියන්නෙ අපි කියන්නේ ගුණාත්මක හරාත්මකව මාර්ගයට එන්න. එතකොට ඔබතුමියට දැනෙනවා නේද මේ සසර ඕඝය පිරිසිදුවට, මේ කල්‍යාණ මිත්‍රයා පෙන්නල දෙනව කියලා. එතකොට ඔබතුමියට අරව වැඩක් නැහැ කියල තේරෙනවනෙ. කාටවත් කියන්න යන්නත් එපා. තමන්ට කියාගන්නත් එපා. වෙන කෙනෙකුට කියන්නත් එපා.

**උපාසිකාව:** නැහැ. නැහැ. මං කාටවත් කියන්නෙ නැහැ.

**ආර්යයන් වහන්සේ:** ඔය වගේ ආයෙ කතා කරන්න පුරුදු වෙන්නත් එපා. මොකද ඒවා අභිසංකරණයක්නෙ. සංඥා අභිසංකරණයක්නෙ. ඔය වගේ ඒවා පුරුද්දට නැවත නැවත කියනව කියන්නෙ අභිසංකරණයක් නිසයි කියන්නෙ. ඒවත් අතහැර ගන්න. ඒවත් මේ විඤ්ඤාණ මායාවමයි තියෙන්නෙ.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** හොඳයි එහෙනම් තේරුණා නේද? ඔබතුමියට හොඳ ගමනක් තියෙනවා. හොඳ දියුණුවක් කරා යයි. තෙරුවන් සරණයි.

**උපාසිකාව:** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස.

# හය වැනි දේශනය

**උපාසකඃ** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස. ඇත්තටම අපි ගිහි ජීවිතේ තුළ මේ ප්‍රතිපදාව යන කොටයි, පැවිදි ජීවිතේ තුළ මේ ප්‍රතිපදාව යන කොටයි, ඇත්තටම ලොකු වෙනසක් තියෙනවා නේද ආර්යයන් වහන්ස. සාමාන්‍යයෙන් අපි අර සත්‍ය දැකල සිතෙන් එන බාහිර දේවල් එක්ක අපි ගැටෙන්නෙ නැතිව, දැන් ඔබ වහන්සේගේ දේශනා එහෙම අහල අහල ඒ අවස්ථාවට එනකොට අපිට දිගින් දිගටම අර ළඟ ළඟම ඒ අවස්ථාව අපිට ලැබිල තියෙන්නෙ. ගිහි ජීවිතය තුළ. බාහිර දේවල් එක්ක ගැටීම් එනවා. ඒත් එක්කම අපිට කල්පනා වෙනවා. සාමාන්‍යයෙන් අපි කියමුකො. දැන් පැවිදි ජීවිතය තුළ දේශනාවක් අහල ප්‍රතිපදාවක් ඇහුවොත් එහෙම ඒකත් එක්ක අපිට සෑහෙන දවසක් ඉන්න පුළුවන්. මොකද බාහිර තියෙන පරිසරයත් එක්ක සමාජයත් එක්ක තියෙන ගැටීම් සහ සම්බන්ධයන් ගොඩක් දුරට අඩු නිසා.

අපිට අර ප්‍රතිපදාව කියන එක ඇත්තටම සමහරක් වෙලාවට හොඳ අවස්ථාවක් වැඩිපුර අවස්ථාවක් ලැබෙන්න පුළුවන් ගිහි ජීවිතේ ඉන්න කොට. ඇත්තටම අර ප්‍රායෝගිකව පුහුණු වෙන්න. නමුත් අර අපිට තාම පුහුණුවක් නැතිකම නිසා මූලික ආරම්භයේ ඉන්න හින්ද අර ප්‍රතිපදාව දිගටම රැඳිල ඉඳීමේදී අර ගැටලු සහගත තත්ත්වයක් මතු වෙනවා. ඒකට අපිට අර ප්‍රතිපදාව දිගින් දිගටම කරන්න පුරුදු කරන එක තමයි තියෙන්නෙ නේද ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේඃ** නැහැ. ඒ අදහස සම්පූර්ණ වැරදියි... මේක තියෙන්නෙ, දර්ශනය සමාජෙට ගිලිහිලා තියෙන්නෙ. දර්ශන අවබෝධය

ඇති වෙනකොට ඔය අදහස වෙනස් වෙනවා. බුද්ධ දර්ශනය මේ සමාජයෙන්ම ගිලිහිලා තියෙන්නෙ. මිනිස්සු සිතුවිලි වලින් හිතනව ගිහි ජීවිතය මෙහෙමයි පැවිදි ජීවිතය මෙහෙමයි කියල... නමුත් පැවිදි ජීවිතය තුළ ඉන්න කොට තියෙන ප්‍රශ්නෙ තමයි, එතන කෙලෙස් පේන්නෙ නැති වෙනවා. කෙලෙස් පේන්නෙ නැති උනාම ඇත්තටම රැවටීමකට තමයි ලක් වෙන්නෙ. එතනින් හිරවීම් ගොඩක් තමයි තියෙන්නෙ.

හැබැයි **ගිහි ජීවිතය තුළ** හොඳට විනිවිද කෙලෙස් පේන්න ගන්නවා. එතකොට **හොඳටම දැනෙනව** තමන් තවම දියුණු නැහැ කියලා. නොදියුණු ස්වභාවය. හැබැයි පැවිදි ජීවිතය තුළ සිත සැඟවගිය කල්හි කුමක් කරමු ද කියන තැනට වැටෙනවා. භික්ෂූන් වහන්සේලා සමාධිය තුළ ගොඩක් අතරමං වෙලා ඉන්නවනේ. ඒ ඔන්න ඔය නිසා තමයි. ඒ අය හිතාගෙන ඉන්නව භාවනා කරල නිවන් දකින්න පුළුවන් කියලා. ඒ අය භාවනාවෙ හිරවෙලා ඉන්නෙ. අපිට පේන්නෙ නැහැ නිවන් දකිනවා. අපිට පෙන්නෙ හිරවෙලා ඉන්නව කියලා. හැබැයි ගිහියන් ඊට වැඩිය දියුණුයි කියල අපිට පේනවා. මොකද ගිහි ජීවිතේ කෙලෙස් පේනවා. කෙලෙස් පේන කොට ගිහියන් දන්නව දියුණු නැහැ කියලා. ඒක නිසා **ගිහියන්ට හිත හොඳට පේන නිසාම සිත පිරිසිදු වෙනවා.** ගිහියන්ගෙ ගොඩක් වෙලාවට අද දියුණුවක් පේනවා. භික්ෂූන් වහන්සේලාට වැඩිය.

අපිට ඒක හොඳට කියන්න පුළුවන්. මොකද අපිට සාකච්ඡාවලට ගොඩක් ගිහියන් කතා කරන කොට අපිට පේනවා, භික්ෂූන් වහන්සේලා කතා කරන කොට තේරෙනවා. හැබැයි භික්ෂූන් වහන්සේලා පිළිගන්නවා ගිහියන් ගොඩක් දියුණුයි කියලා. හැබැයි බුදුන් වහන්සේ දේශනා කරන ධර්මය තුළ භික්ෂූන් වහන්සේලාට සිව්පසේ තියෙන නිසා, අර "සුඛා පටිපදා ඛිප්පා අභිඤ්ඤා" කියන එක තියෙනවා. **හැබැයි බුදුරජාණන් වහන්සේ කියනව ගිහියන්ටත් "සුක්ඛා පටිපදා - ඛිප්පා අභිඤ්ඤා" තියෙනව කියලා. "ඛිප්ප අභිඤ්ඤා" කියන එක දෙපැත්තටම තියෙනවා කියලා.** අර 'දුක්ඛා පටිපදා' කියන්නේ ගිහියට සිව්පසය නැති නිසා 'දුක්ඛා පටිපදා' තුළ තමයි ඉන්නේ. භික්ෂුව 'සුඛා පටිපදා' තුළ ඉන්නේ.

හැබැයි ගන්ධා අභිඤ්ඤා කියන එක භික්ෂුව තුළත් තියනවා. ගන්ධා අභිඤ්ඤා කියන එක ගිහියටත් තියෙනවා. මෙතන ප්‍රතිපදාව තුළ තමයි වෙනස තියෙන්නෙ. සිව්පසේ තියෙන නිසා ඒක පහසුවක්. භික්ෂූන්ට සිව්පසය තියෙනවා කියන තැන. නමුත් භික්ෂුවකට ආධ්‍යාත්මිකව දියුණු වෙන්න ඒක නෙමෙයි බලපාන්නෙ. **අධ්‍යාත්මිකව දියුණු වෙන්න බලපාන්නෙ අර බුද්ධ දර්ශනය කියන එක.**

අද ගොඩක් වෙලාවට දර්ශනය කියන එක, නූතන යුගයේ භික්ෂූන් වහන්සේලාට දර්ශන අවබෝධය අඩුයි. හිරවෙලා ඉන්නෙ සමාජය තුළ. අර විසුද්ධි මාර්ගයේ තමයි ගොඩක් යන්නෙ. විසුද්ධි මාර්ගය කියන්නේ, බුදුහාමුදුරුවො ගිය මග යන්නෙ. මේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරාට පස්සෙ මගඵලලාභීන් අඩු වෙලාගියා. හැබැයි ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන්න කලින් මගඵලලාභීන් වැඩියි. ඒකෙන් අපිට තව දෙයක් තේරෙනවා. අද ලියවෙලා තියෙන පොත්වල "බුද්ධ දර්ශනය" නැහැ. ඒක නිසා අපි පොත්වලින් පෙන්වන කාරණා නෙවෙයි මේ ඇතුළාන්තයේ තියෙන්නෙ. මෙය ඇතුළේ ටිකක් ගැඹුරු කාරණාවක් තියෙනවා. ඇත්තටම මේ යුගයේ ධර්මය අවබෝධ කරනවා කියන එක දැන් නම් මේ බුද්ධෝත්පාද නාලිකාව විශාල කටයුත්තක් කරලා තියෙන බව පේනවා.

***උපාසකඃ*** ඒක තමයි ආර්යයන් වහන්ස. ඒක පැහැදිලියි.

**ආර්යයන් වහන්සේඃ** ඔබතුමා කියපු එකේ තියෙනවා, ඔබතුමාටත් නොවැටහෙන කාරණාවක්. ඔබතුමා කියපු ඒ විතක්කවල තියෙනවා ඔබතුමාටත් නොවැටහෙනවා කියලා, මේ දර්ශනය තුළ. දැන් අපේ ආයතන හය තියෙනවනේ. මේ දර්ශනය තුළ මතුවෙනව ස්වභාවයක්, ආයතන හය මිදුණු ස්වභාවයක්, ඔන්න ඕක හසුවුණාට පස්සේ ඇත්තටම ගිහි ජීවිතේ ගැටළුවක් නෑ. මේ සාමාන්‍යයෙන් බැලු බැල්මට පේන දේ නෙමෙයි, දර්ශනය තුළ තියෙන්නේ. දැන් අපි ගත්තොත් මෙහෙමයි තමන්ගේ මේ දිවට දැනෙන රස, එහෙම නැත්නම් නාසයට දැනෙන ගන්ධය, කනට ඇහෙන ශබ්දය. සිතට එන සිතුවිලි, ඇසට පෙනෙන වර්ණය. මේ එකකටවත් අයිති නැති මිදුණ ස්වභාවයක්, අවධිමත් ස්වභාවයක් මතුවෙන්න ගන්නව දර්ශනය තුළ. ඒක මොකුත් කරල

නෙමෙයි එන්නෙ. සද්ධර්මයේ ශ්‍රවණය තුළ තමයි එන්නෙ. අවබෝධය ඇති වෙනකොට දර්ශන අවබෝධය තුළින් තමයි එන්නෙ. ඒක හැබැයි අපිටත් මුලින් වැටහිලා තිබුණෙ නැහැ. අපිට තිබුණ ඔබතුමාට තියෙන වගේ ප්‍රශ්නෙ. අපි හිතුව ඔබතුමාට තියෙන ප්‍රශ්නෙ නිසා තමයි ආරණ්‍ය වලට ගොඩක් ගියෙ. අපි හිතුවා ආරාමෙ තුළයි මේක පහසු කියලා. හැබැයි ඒක එහෙම නෙමෙයි වුණේ.

ඒ කියන්නෙ දර්ශනය අවබෝධ කර ගන්න බැරි උනා ආරාමෙදි. ඒකට හේතුව බුදුන් වහන්සේ දේශනා කළ බුද්ධ වචනය හොයා ගන්න අපිට තුම්මුල්ලෙ තියෙන බෞද්ධ සංස්කෘත මධ්‍යස්ථානයට යන්න උනා. ඒකෙ තියෙන සූත්‍ර හොයන්න උනා. එක පැත්තකින් අපිට මේක හොඳ විමර්ශනයක් කරන්න සිද්ධ වුණා. ඒ විමර්ශනය ආරාමෙ ඇතුළෙ කර ගන්න බැරිවුණා. හැබැයි ඒ විමර්ශනය මේක ඇතුළෙ යුද්ධයක් වගේ කළා. මේ ගිහියන් අතරට එකකොට අපි විශාල අවබෝධයකට පත් වුණා. ඇත්තටම ආරාමෙදි උනේ එකතැන පල්වෙලා හිටපු එක. සති ගණන් ඉන්නව එකම තැන. දන්නෙත් නැහැ ඉන්නෙ සමාධියේ කියලා. හුස්ම දිහා බල බල. නමුත් ගිහියන් අතරට ආවට පස්සෙ විශාල යුද්ධයක් තියෙනවා.

ඇත්තටම බුදුන් වහන්සේ දේශනා කළ බුද්ධ වචනය අවබෝධ වෙන්න වෙන්න, ඒ කියන්නෙ ඇත්තටම මේකෙ විශාල ගැඹුරක් තියෙනවා, **දෙයක් නැහැ කියන එකේ. ඇසට පේන වර්ණය තුළ දෙයක් නැහැ. කනට ඇසෙන ශබ්දය තුළ දෙයක් නැහැ, දෙයක් නැහැ කියන්නෙ, අපි කිව්වොත් දැන් දිවට රස දැනෙනවා. අන්නාසි කියලත් දන්නව. මනෝ විඤ්ඤාණයෙන් දන්නව. දැනුම නැති වෙන්නෙ නැහැ. හැබැයි අන්නාසි කියල දන්නව, අන්නාසි රසත් දැනෙනව, ඒක හැබැයි දෙයක් වගේ දැනෙන්නෙ නැහැ. ඔන්න ඕක තමයි මේකෙ තියෙන ගැඹුරුම පර්යාය. ආයතන හයම එහෙමයි.** මේ අපි කතාබහ කරනවා. අපි වැඩ කරනවා. හැබැයි එතන මම නැහැ. එතන කෙනෙක් නැහැ. දෙයක් කියල දැනෙන්නෙ නැතිකම. මේක උරගාල උරගාල මේක ඔපමට්ටම් කරල මැණික වගේ ගත්තට පස්සෙ ඇත්තටම ඔය කියන ප්‍රශ්නෙ නැහැ. මෙතන තියෙනවා පොඩි රහසක්. දැන් අපි දේශනා කරන ධර්මය තුළ

ඔබතුමා හොඳින් මෙනෙහි කළොත් සිහියට අසුවෙනව. සිහියට අසුවෙන හැටිත් කියනවා. ඒක ප්‍රායෝගිකව ඒක හසුවෙන ආකාරය කියනවා.

ඇත්තටම දැන් එදිනෙදා වැඩ කරන විට එක එක දේවල් සිද්ධ වෙනවනෙ. ඒවා හොඳට සිහිය අවදිවෙලා පේනවා මේ එකකවත් අයිති නැහැ කියලා. ඔන්න ඕක තමයි ආරාමෙදි වෙන්නෑ ඔබතුමාට ඕනි නම් ආරාමෙකට ගිහින් අත්හදා බලන්න පුළුවන්. ඒ ස්වභාවය තුළ හිරවෙන හැටි, සිත සැඟව යන හැටිත්, මෙතනදි මේක අසුවෙන හැටි පේන හැටිත්. මේක දියුණු වෙන්න ගොඩක්ම අපිට උපකාර වුණේ අපිට ඒක කියන්න සිද්ධ වෙනව. ආරාමෙට වැඩිය මෙහෙ හොඳයි කියල. ඒ කියන්නෙ ආරාමෙට වැඩිය අපිට උපකාරී වුණේ මේ ඇත්තටම කිව්වොත් එහෙම මේ "ගේය සිත" මේ විසිරෙන සිත.

**අවිද්‍යාව තියෙන තැනයි නිවනත් තියෙන්නෙ** කියල අපිට බුදුහාමුදුරුවො දේශනා කරනවා. ඔය භික්ෂුවක් ඇවිත් බුදුරජාණන් වහන්සේට කියනවා ස්වාමීනි, ගිහිජනයාගෙන් වෙන්ව ආරාමෙ හුදකලාවේ වාසය කරමි කියලා. එවිට බුදුන් වහන්සේ කියනවා එහෙමත් හුදකලාවක් තියෙනව මහණෙනි. නමුත් "ඉද භික්ඛවේ භික්ඛු" "මේ සාසනේ හුදකලාව" කියන්නෙ ඒකට නෙමෙයි මහණෙනි. බුදුන් වහන්සේ අර හුදකලාව කියනවා. මෙහෙම මේ දිවට රස දැනෙනවා. ඒක අන්නාසි කියල දන්නව. හැබැයි ඒක දෙයක් කියල දැනෙන්නෙ නැති තැන අර "භද්දේක රත්නය" තියෙන්නෙ. ඒක තමයි අල්ලන්න ඕනි, සියුම්ම තැන. අර උදෑසන හිමිදිරි පාන්දර තණ අග දිය බිඳක දේදුන්නක් දකිත් ද, ඒ ඊටම අදාළ වූ කෝණයකින් දකින්න ඕනි කියල. අර තියෙනවා අතිසියුම් කෝණයක් තියෙනවා මෙතන. **හැබැයි මේක දකින්න පුළුවන් වෙන්නෙ සිත විසිරෙන කොටමයි, මේක සිත සැඟව ගියාම පේන්නෙ නැහැ.** අපි මේ දෙපැත්ත පෙන්නන්නෙ ආරාමෙ පෙන්වන්නේ සිත සැඟව යනවා කියලා. මේ පැත්ත පෙන්නන්නේ සිත විසිරෙනව කියලා. හැබැයි සිත විසිරෙන තැන හොඳට පේන්න ගන්නවා. අපි මේ දෙකම හොඳට කරන හින්ද කරල තියෙන හින්ද හොඳට බැට කාපු හින්ද හොඳට දන්නවා. අපි හිතුවෙ මුල් යුගයෙ ආරාමෙන් මේක වෙන්නෙ කියලා. ඒ නිසා අපි ආරාමෙට වෙලා හිටියා. නමුත් එතනදි ඒක එන්නෙ නැහැ.

හැබැයි ආයෙමත් අනිත් පැත්තට වෙනකොට, අර සිත හැම පැත්තටම මෙහෙයවෙනකොට, හොඳට සිතිවිලි එනඒවා, යන ඒවා පේනවා. අර "ඛණික සමාධිය" කියන එක හොඳට අත්දකින්න ලැබෙනවා. "ඛණික සමාධියක්" උපදින්න නම් සිත විසිරෙන තැනක් තියෙන්නෙ ඕනි. **ඒ සිත විසිරෙන තැනක විසිරෙන්නෙ නැති ස්වභාවයයි ඛණික සමාධිය කියන්නෙ.** නමුත් මේ ඇත්ත සිත සැඟව යනවා. ඇත්තටම මේ යුගයේ මේ දර්ශනය, මේ දර්ශනයත් එක්කයි මේ අභියෝගය තියෙන්නෙ. මේකෙ තියෙන සියුම්ම කෝණෙ තමයි, ඔන්න ඔය කියන එක වචනෙ තුළ තියෙන. අපි මේ කියන්නෙ මේ අන්නාසි කියල දන්නව දිවට රසත් දැනෙනවා. හැබැයි ඒක දෙයක් වගේ දැනෙන්නෙ නැහැ කියන එක.

ඕක ආයතන හයටම වෙනවා. දැන් ගඳත් දැනෙනවා. පිච්ච මල් කියලා මලේ සුවඳක් ආඝ්‍රාණය වෙනවා. එතකොට "සෙන්සර් එක" වැඩ කරනවා. පිච්ච මලේ සුවඳ කියල, පිච්ච මල කියන එකත් මනෝද්වාරයෙන් එනව. පිච්ච මල කියන එකත් එනව, හැබැයි ඒක **දෙයක් වගේ දැනෙන්නෙ නැහැ. මිදීමක් දැනෙනවා. මෙන්න මේක තමයි "අනිමිත්ත සමාධිය."** මේ සමාධිය තමයි අද අහිමිවෙලා තියෙන්නෙ. අපි කොච්චර දුරට මේ පොත් ලියා ගත්තත් අපිට ග්‍රන්ථ තුළින් වුණේ අපිට මේක අහිමි වෙච්ච එකයි. මෙතනම තමයි අපේ සසර ඕඝයේ මිදීම තියෙන්නෙ. අද බොහෝ අයට ප්‍රත්‍යක්ෂ වෙලා තියෙනවා, ප්‍රත්‍යක්ෂ වීගෙන එනව එක එක මට්ටම් වලින්. ඒ කියන මහා දියුණුව. ඒ මහා දියුණුව තුළ කිසිම තැනක, ගින්නක් තුළ ගින්නක් නැතිව ඉන්න හැකියාව ලැබෙනවා. දෙයක් කියල දැනෙන ස්වභාවය ටික ටික පත්වෙන ස්වභාවය මතයි එන්නෙ. ඒ අර අවබෝධය එනව දර්ශන ඥානය තුළින්.

බාහිරත් දෙයක් නැහැ සිතෙත් දෙයක් නැහැ, තැනින් තමයි එන්නෙ. එතනින් එනව, සිත පිහිටන්න තැනක් නැති වෙනව. හැබැයි දෙයක් නැහැ කියල කියන තැන තමයි මේකෙ ගැඹුරුම. දෙයක් කියන එක මොකක්ද කියල මේ "සබ්බ සංඛාර" කියන්නෙ දෙයක් කියල දැනෙනව නම්, එතන අවිද්‍යාව. එතන සංඛාර තියෙනව. හැබැයි දෙයක් කියල දැනෙන්නෙ නැත්නම් අන්න එතන තියෙනවා මිදීම. අර 'ඒතං' ඒක බැස ගත්ත. අර 'නන්දියටත්, ඒතං' කියල කියන්නෙ අර අජ්ජෝසාය

'තිට්ඨති' කියන්නත් මෙතන තියෙන්නෙ ඕනි දෙයක් කියන එක. එහෙම උනොත් තමයි නන්දියක් තියෙන්නෙ. උපාදානයක් තියෙන්නෙ, භවය තියෙන භවය කියන්නේ දෙයක් කියන එක. දෙයක් කියන්නෙ මෙහෙමයි මෙතන හරිම සියුම් වෙන්න ඕනි. මෙහෙම ගමු. දැන් අන්නාසි කියල දන්නව. හැබැයි අන්නාසි දෙයක් වෙන්නෙ නැහැ. හැබැයි මේක යට තවත් රහසක් තියෙනවා, ඉතාම ගැඹුරුයි. ඒ කියන්නෙ **අන්නාසි කියල දෙයක් හම්බ වෙන්නෙ නැහැ. නමුත් දේකුත් තියෙනවා. ඒ කියන්නෙ ක්‍රියා සිත.** අන්නාසි කියල දෙයක් හම්බ වෙන්නෙ නැහැ. හැබැයි දෙයක් තියෙනවා.

දෙයක් නැහැ කිව්වේ, අන්නාසි කියල දෙයක් නැහැ කියන එක. මේක හරිම ගැඹුරුයි. ඔතන ඔය රූපයයි, අරූපයයි කාම භූමියයි කියන තුන් භූමියම ජය ගන්න එක තමයි වෙන්නෙ. දැන් ඔබතුමා බලන්න අපි දැන් විග්‍රහ කරන හැම දෙයක්ම තියෙන්නෙ ඇත්තම කිව්වොත් එහෙම මේ විපස්සනා 'ඛණික සමාධියෙ.' ඒකයි බුදුන් වහන්සේ **'යංහී යංහී තත්‍ර තත්‍ර විපස්සතී.'** මේක භාවනාව තුළ නෙවෙයි තියෙන්නෙ කිව්වෙ ඒකයි. මේක භාවනාව තුළ තියෙනව නම් ආරාමෙ ලේසියි. නමුත් මේක භාවනාව තුළ නෙමෙයි තියෙන්නෙ.

ඒකයි බුදුන් වහන්සේ පස්වග තවුසන්ව අතහැරල, "පටිච්ච සමුප්පාදය" මෙනෙහි කිරීම තුළ අවබෝධ කළා කියල අපිත් කියන්නෙ. ඒකයි බුදුන් වහන්සේ කියන්නේ, අන්න කොණ්ඩඤ්ඤට වැටහුණා කියන්නෙ. මේක සද්ධර්මය ශ්‍රවණය තුළ සිද්ධ වෙනව. කල්‍යාණ මිත්‍රයාගෙන් අහල දැන ගත්තත් ඒක සිද්ධ වෙනවා. නුවණින් විමසුවත් සිද්ධ වෙනවා කිව්වෙ ඒකයි. "ධම්මට්ඨිති ඥානය" තුළ. එහෙම නැතිව මේ හිතට එන අරමුණ ජේනවා කිව්වට, එයා නිකම් අර සිතුවිලිවල විඤ්ඤාණය තමයි දැක දැක ඉන්නෙ. අර ඇත්ත ජේන්නෙ නැහැ. අර විඤ්ඤාණයට එහා ගිය අවධිය "කුසලස්ස උපසම්පදා" කියන එක අසුවෙන්නෙ නැහැ. එතන තමයි භික්ෂුව ඉන්නේ. එතන කෙලෙස් සංසිඳෙන්නෙ. ඒක දැක්කොත් පමණයි, නැත්නම් කෙලෙස් මගමයි ඉන්න්, හරි ගැඹුරුයි. මට දැන් ඔබතුමා කියන්න ඔබතුමා ගාල්ලෙද?

**උපාසකः** කළුතර ආර්යයන් වහන්ස.... ආර්යයන් වහන්ස අර එන පොඩි පොඩි තැන්වලට අපිට උත්තර තියෙනවා. නමුත් එවෙලෙට එවෙලෙට එන ප්‍රශ්න වලට ඔබ වහන්සේගේ ධර්මය මම ගළපනවා.

**ආර්යයන් වහන්සේः** හැබැයි ගිහි වතේ සිටින ආර්යයන් වහන්සේලා කියන තැනත් ඕවට උත්තර තියෙනවා. සමහර ඒ ඒ දේශනාවල තියෙනවා. දැන් අභිඤ්ඤා දේශනාවලත් ගැඹුරට යනකොට, ගැඹුරු තැන් තියනව කතා කරන කොට. කොහොමත් අපි නිවන පෙන්වන හින්ද ගැඹුරු තැන්වලදි යන්තං හරි කතා කරනවා. දැන් "අලමරිය ඤාණ දර්ශන" දේශනාව, නැත්නම් "උපක්ලේශ" දේශනා, නැත්නම් "සූත්‍රවල" ගත්තොත් ගොඩාක් ගැඹුරින් කියන්නෙ. ඉතාම ගැඹුරුයි. මොකද " අවිතක්ක සමාධි", "සවිතක්ක සමාධි" පෙන්නන කොට පර්යායත් එක්ක පෙන්වන්නෙ, එතකොට පොතේ තියන ඒවත් ගලපල අරගෙන පෙන්වන්න පුළුවන් මොකද බුදුන් වහන්සේ දේශනා කරලා තියෙනවා. ඇත්තටම ඒ අත්දැකීම එහෙම කොහෙවත් තියෙන එකක් නෙමෙයි. දැන් පොතකින් දකින්න පුළුවන් එකක් නෙමෙයි. දැන් ලුණු රස අත් දකින එක. ඒක පොතකින් කියන්න බැහැ කවදාවත්. ඒක අත්දකින්නට ඕනි, අත්විඳින්නම ඕනි. අත්දැකීමක් වෙන්න එපැයි, ලුණු රස කාලම බලන්න එපායැ.

අන්න, ඒ වගේ මෙතනත් තියෙනවා. ඒකම තමයි කියන්න වෙන්නෙ. ඒ කියන්නෙ මේක අත්දැකීමක් ලැබෙන්නම ඕනි. අත්විඳින්නම ඕනි එකක්. මේ නිවන කියන එක. හැබැයි නිවන කියන එක අත්විඳින්නම ලැබෙන එකක්, ඒ කියනතැන ඒක අත්දකින්න ලැබෙනව, හොඳින් නුවණින් බැලුවොත් හිමින් නුවණින් විමර්ශනය කළොත්. ඉතාම භාග්‍යයක් මේ ඇහෙන එකත් ගොඩක් අයට. සෑහෙන උරච්චි කරල උරච්චි කරල උරගාල ගත්ත එකක්. අපි එක පාර මෙහෙම අරන් පෙන්නන්න යනව. හැමෝටම මේ බලන්න කියලා. එතකොට මේක හරි ලේසියෙන් එයාට පේනවා. නමුත් අපි දන්නව මේක කොයිතරම් අමාරුවෙන්ද අර කළු ගලක් අර පොඩ්ඩ පොඩ්ඩ පිහදාල පිහදාල අර දිය කරනව වගේ තමයි අරක අපි ගන්නෙ. මුලින් ඒක ගන්නෙ.

මේක මේ තරම් ගැඹුරකට යනව කියල. මේ ගැඹුරුයි කියන්න හේතුව තමයි මේක, ක්‍රියාවලිය මතු වෙනවා. ක්‍රියා සිත මතුවෙනවා. මේ ක්‍රියා සිත මතුවෙලා, එතනත් දෙයක් වගේ දැනෙන එකක් එනවා. ඒක මොකක්ද කියල එකක් නැහැ. හැබැයි ඊට උඩින් තියෙනව අර පොත කියල දෙයක් නැහැ කියලා. එහෙම දෙයකුත් දැනෙනවා. මේක අවස්ථා දෙකක දැනීමකට ලක්වෙනවා. ඒ කියන්නෙ **උඩින් තියෙන එක තමයි සබ්බ සංඛාර සමථය වෙන්නෙ. යටින් තියෙන ක්‍රියා සිත පවතිනව දිගටම.** ඒකෙදි භාෂාවක් නැහැ. මේක වෝල් වෙන්න පුළුවන්. බිත්තිය වෙන්න පුළුවන්. දෙමළෙන් තව එකක් කියන්න පුළුවන්. මේ ශබ්ද වචන ටික ඔක්කොම දෙයක් වගේ පෙන්වනවා. හැබැයි යටින් ඒ ශබ්ද වලට අයිති නැති දේකුත් දැනෙනවා. ඔන්න ඕක තමයි කියන්න ගියේ ක්‍රියාවලිය. ක්‍රියා සිත මතුවෙනවා. "ප්‍රභාෂ්වර සිත අවදි වෙනව" අර ටික දිය වෙන්න ඕන. ඉතාම ගැඹුරුයි. පොත කියල දෙයක් නැහැ කියන එක වෙනයි, හැබැයි එතන දෙයක් තියෙනව කියන එක වෙනයි. තේරුණා නේද?

**උපාසක:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඉතාම ලොකු ගැඹුරක් තියෙනව නේද? ඔය එක කෑල්ල කෑල්ල හරි අල්ල ගන්න එක වටිනවා.

**උපාසක:** එහෙමයි ආර්යයන් වහන්ස. අනිත් එක ආර්යයන් වහන්ස තව චුට්ටක් මට පැහැදිලි කරගන්න ඕනි. මේක අහන අයටත් වැදගත් වෙනව. මම පොඩි ක්‍රමයක් කියන්නම් ආර්යයන් වහන්ස. මේක හරිද වැරදිද කියල මට කියල දෙනවද ආර්යයන් වහන්ස. දැන් හිත කියන්නෙ එතන එතනම හට ගන්න දෙයක්. දැන් මං හිතන්නෙ, හිත කියන්නෙ ශරීරයෙන් පිට හට ගන්නව කියලනෙ. දැන් අපි හිතන්නෙ මං බලනවා දැන් මේ හිත තියෙන්නෙ කොහෙද කියලා. ඔන්න මං දැන් හිතනවා අන්නාසි, එතකොට අන්නාසි කියලා හිතනකොට අන්නාසි පේනවා. මට අන්නාසි මැවෙනවනෙ. පිච්ච මල කිව්වහම මට පිච්ච මල මැවෙනවා. පොත කිව්වොත් පොත මැවෙනවා. එතකොට මම උත්සාහ කරනවා ඒ ඒ රූප මැව්ච්ච තැන කොතනද? සාමාන්‍යයෙන් ඒ හිත ඉදිරියට බහිමින් පිටට යන අවස්ථාවක් දැනෙනව නේද?

**ආර්යයන් වහන්සේ:** නැහැ. මෙන්න මෙහෙමයි. ආත්මය කියන්නෙ අරමුණමයි. වෙන ආත්ම කතාවක් නැහැ. ආරම්මණ තමයි ආත්මය. දැන් ඔබතුමාගෙ හිත කොතනද තියෙන්නෙ. එතන තමයි ආත්මය. දැන් මේක පොත නම් පොත තමයි ආත්මය. **පොත තියෙනව නම් "ඒතං මම" "පොත තියෙනව නම් මාත් ඉන්නවා" ඒතෝ හමස්මිං, මේ මගේ. "ඒතං එ මේසෝ අත්තා" මේ මගේ ආත්මය.** එතකොට මේ දැන් "ඒතං මම, ඒතෝ හමස්මි. එමේසෝ අත්තා. "මම, මගේ, මගේ ආත්මය" එතකොට **ඒකම තමයි මේ, ආත්මය දිගටම. දිගටම යන්නෙ ඒකමයි.**

**උපාසක:** අරකෙ මොකක්ද තියෙන වරද ආර්යයන් වහන්ස?

**ආර්යයන් වහන්සේ:** දැන් මෙතන අරමුණ කියන්නෙ, දෙයක් කියල ගන්න එකමනෙ වෙන්නෙ. නිවන් දැකල නම් ආර්ය භූමියෙනෙ ඉන්නේ. අපි ඉන්නෙ යෝගාවචර භූමියෙනෙ. එතකොට අරමුණ කියන්නෙ දෙයක් කියල ගත්ත එකමනෙ. "ඒතං" කියන්නෙ දෙයක් කියන එකමනෙ. එතකොට ඒතං මම, "ඒතං හමස්මිං එමේසෝ අත්තා" කියන්නෙ, "අත්තා" කියන්නෙ ආත්මය කියන එක. එතකොට ඒක තියෙනව නම් ආත්මය තියනව කියන එකමයි. එතකොට බුද්ධ වචනයත් ඒකමයිනේ. අරමුණමයි ආත්මය කියන්නෙ. අරමුණ දෙයක් කියල ගන්න එකමයි. "අජ්ඣෝසාය තිට්ඨති යාරූපේ නන්දි - තදූප දානං භවෝ" කියන්නේ, භවය කියන්නේ අරමුණමයි. මේ ධර්මයේ තියෙන්නේ අරමුණමයි. "ක්‍ෂණ සම්පත්තිය" උඩයි.

**උපාසක:** දැන් මලක් කියල අරමුණක් හිතන්නත් බැහැ. එහෙම එන්නත් බැහැ නේද?

**ආර්යයන් වහන්සේ:** නැහැ. එහෙම එනව. නවත්තන්න බැහැ. මොකද පෘථග්ජන භූමියේ ඉඳල ඒක අවබෝධ කරගෙන, ඒක අවබෝධ වුනා කියන්නෙ මොකුත් එන්නෙ නැහැ කියන එක නෙමෙයි. වෙනද විදියටම පේනවා. දැන් කණ්ණාඩියේ දෙයක් නැහැ කියල අපිට අවබෝධයි. ඒ කියන්නෙ වෙනද විදිහටම දන්නවා. මේ පොත කියල දන්නව. මේක අන්නාසි කියල දන්නව. සේරම දැනුම ඒකමයි. නමුත්

අවබෝධය කියන්නෙ එහෙම දෙයක් නැති බවට තියෙන අවබෝධය. දැන් අවබෝධය ඇවිල්ල කණ්ණාඩියෙ දෙයක් නැහැ කියල අවබෝධ වුනා කියල, කණ්ණාඩියෙන් පේන එක නතර වෙන්නෙ නැහැනෙ.

අපි ඔක්කොම පේනව. නමුත් අපිට අවබෝධයක් තියෙනව ඇතුළෙ එහෙම දෙයක් නැති බව. ඒ වගේම සේරම වෙනද විදිහට පේනව උනාට මෙතන දෙයක් නැති බවට අවබෝධයක් එනවා. ඒ අවබෝධය තමයි අර මිදීම තුළ අර එකකටවත් අයිති නැති ඇලෙන්නෙ නැති බැස ගන්නෙ නැති අවිධිමත් ස්වභාවයක් මතුවෙනව කියන්නෙ. ඒකයි මොහොතට අවධිය කිව්වෙ. ඒ මොහොතට අවධිය කියන එක තුන් කාලයක් නෙමෙයි කියල අපි කිව්වනෙ. මේ අතීත අනාගත වර්තමානය කියල කතා කළාට ඒක තුන් කාලයක් නෙමෙයි. මේක දෙයක් කියල ගත්තෙ නැති තැනයි, මොහොතට අවධිය එන්නෙ.

බාහිර ඇත්ත වෙලා තියෙනකම්, කොහොමත් තුන් කාලය තියෙනවා. අතීතෙත් තියෙන්නෙ පුළුවන්, වර්තමානයෙත් තියෙන්න පුළුවන්, අනාගතේ තියෙන්න පුළුවන්. **එතකොට දෙයක් කියල තියෙනකම්ම තුන් කාලය තියෙනවා. ඔය අතීතය, වර්තමානය, අනාගතය තියෙනවා දෙයක් කියල ගන්නකම්ම. හැබැයි දෙයක් කියල ගන්නෙ නැති තැන එතනමයි මේ මුළු ධර්මයම තියෙන්නෙ. භවයත් එතනමයි තියෙන්නෙ. භව නිරෝධෙත් එතනමයි.** "භවය" කියන්නෙ, දෙයක් කියල ගත්ත එකමයි. භව නිරෝධය කියන්නෙ දෙයක් කියල ගත්තෙ නැහැ කියන එක එතනමයි. තුන් කාලයෙන් මිදීමක් තියෙන්නෙ. ඒ සියල්ලම ඇත්තටම එකම මොහොතෙ එක අරමුණේ තියෙන්නෙ. අරමුණේ ආත්මය තියෙන්නෙ. පොත තියෙනව නම් මාත් ඉන්නව කිව්වෙ ඒකමයි. "ඒතං" මම, "ඒතෝ හමස්මිං එමේසෝ අත්තා" මම මගේ මගේ ආත්මය. ඒ කියන්නෙ දෙයක් කියල දැනෙන එකයි මෙතන තියෙන්නෙ. පොත කියල දෙයක් තියෙනව කියල දැනෙන එකයි ආත්මය කියන්නෙ.

***උපාසක:*** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** හැබැයි පොත කියල දෙයක් නැති වුණාට අර පුංචි දරුවට වගේ ප්‍රභාෂ්වර සිතේත් තියෙනව සාසවීය ස්වභාවය.

ඒ කියන්නෙ මෙතන අර පොත කියල දෙයක් නැහැ, නමුත් දෙයක් තියෙනවා. ඉතාම ගැඹුරුයි. ඒ කියන්නෙ ක්‍රියා සිත මතුවෙනව කියන එක. ක්‍රියාවලිය තියෙනවා. නමුත් අර පොත මේසේ ඇඳ කියන ඒවා නැහැ. ඒවා හමුවෙන්නෙ නැහැ. හැබැයි පොත නැති වෙන්නෙත් නැහැ. වෙනද විදිහටම පේනවා. ඉතාම ගැඹුරුයි නේද? මේක පොත කියලත් දන්නව පොත නැතිවෙන්නෙත් නැහැ. හැබැයි පොත කියල දෙයක් නැති වෙනවා. හැබැයි ඒත් දේකුත් තියෙනවා. ඒක පොත කියල කියන්න බැහැ. ඒකයි කියන්නෙ. හරි ගැඹුරුයි නේද? තුන් පැත්තකට කැරකෙනව නේද බලන කොට.

**උපාසකः** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේः** එතකොට හොඳටම තේරෙනවා නේද හොඳට "සුචි සුද්ධ" වෙලා එනව නේද? හරිම ආශ්චර්යයි නේද? ඇත්තටම මෙතන ඔක්කොම ප්‍රශ්නෙ විසඳෙනව. ඉංග්‍රීසි භාෂාවෙන් බුක් කියනවා. සිංහලෙන් පොත කියනව. ඔක්කොම භාෂාව බොරුවක් වෙනව. එහෙම වෙන්න බැහැනෙ. එහෙනම් එකක් වෙන්න එපායැ. එහෙමනම් පොත කියල නැති වෙන එක එහෙමයි. එතකොට බුක් කියල දෙයකුත් නැති වෙනවා. එතකොට ඇත්තට එනවා. ඇත්තටනෙ අපි එන්න ඕනි. එතකොට රැවටීමක් නෙ මේ අපි දාගත්ත ඒවනෙ. මේ ශබ්ද ටික. ශබ්ද ටික නැතිවෙන්න ඕනි. එතකොට පොත කියල දෙයකුත් අපිට දැනෙනවනෙ. මේක තමයි සංඛාරා. පොත කියල දෙයක් අපි භුක්ති විඳිනවා. හැබැයි මෙතන පොත කියල දෙයක් නැති වුණාට දෙයකුත් තියෙනවා.

අන්න යටින් එනවා. දැන් 'බුක්' කියල දෙයක් නැති වුණාට, දෙයක් තියෙනවා. ඒ ඔක්කොම සමානයි, පුංචි දරුවට තිබ්ච්ච එක "ප්‍රභාෂ්වර සිත." අන්න දැන් මතුවුණා. එතකොට සිත, සිතුවිල්ල දැක්ක පොත කියල දෙයක් නැහැ. හැබැයි පොත නැති වෙන්නෙ නැහැ. පොත කියල තියෙනව. මෙතන ඇත්තටම සමහර අය හිතනවනෙ පොත නැති වෙනව කියල. එහෙම දෙයක් නෑ පොත නැති වෙන්නෙ නැහැ. රහතන් වහන්සේ දන්නව මේක පොත කියල. හැබැයි පොත කියල දෙයක් නැති බව

දැනෙන එක වෙනයි. හැබැයි දෙයකුත් තියෙනවා කියන එක වෙනයි, ගැඹුරුයි නේද? පටලැවෙනවද දන්නෙත් නැහැ කියන ඒවා.

**උපාසක:** නැහැ, ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඒක ගොඩක් වටිනව නේද ඔය කියන තැන.

**උපාසක:** ඒක තමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** තුන් භූමියම මේ අරමුණෝ තියෙනවා. ඒකයි "ත්‍රෛයිලෝකනාථ" කියන්නෙ. මෙතන තමයි බුදුවීම තියෙන්නෙ. පටිච්ච සමුප්පාද අවබෝධය කියන්නෙත් මෙන්න මේකම තමයි. මේක ගැන ගොඩක් විග්‍රහ කරල තියෙනවා. අරමුණෝම තමයි සියල්ලම තියෙන්නෙ කියන එක. එතකොට මේ දෙයක් කියල, දැන් පොත කියල අන්න වටිනාකම කාම භූමිය. එතකොට රූප සංඥාව, රූප භූමිය. පොත කියල දෙයක් තියන එක, අන්න අරූප භූමිය. මේ පොත තියෙනව නම් තුන් භූමියම. එතකොට 'කාම භූමිය' තියෙනව නම් 'රූප භූමිය, අරූප භූමියත් එක්කමයි 'කාම භූමියත්' තියෙන්නෙ. එතකොට වටිනාකමක්, පොත කියල වටිනාකමක් එක්ක පොත කියල රූපෙකුත් තියෙන්න ඕනි, පොත කියල දෙයකුත් තියෙන්නෙ ඕනි. **එතකොට කාම භූමිය තියෙන කොට තුන් භූමියම තියෙනවා. හැබැයි පොතේ වටිනාකමත් නැති වෙන්න පුළුවන්. රූප භූමිය අරූප භූමිය තියෙන්න පුළුවන්. හැබැයි පොත කියල වටිනාකමක් නැති වෙන්න පුළුවන්. පොත කියන රූපෙත් නැති වෙන්න පුළුවන්, හැබැයි පොත කියල දෙයක් දැනෙන්නත් පුළුවන්. අන්න අරූපය.** අන්න තුන් භූමියම ජය ගත්ත. පොත කියල දෙයකුත් නැහැ. පොත කියල වටිනාකමක් නැහැ, තුන් භූමියම මිදිල හැබැයි පොත කියල දෙයක් නැති උනාට දෙයකුත් තියෙනවා. අන්න ක්‍රියා සිතේ ස්වභාවය තුන් භූමියම ජයගෙන මේ 'බුද්ධ ස්වභාවයට' අවධි වෙනවා.

**උපාසක:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** මෙතන ක්‍රියා සිත මතුවෙනවා. අන්න ඒක තමයි "කිරිය සිත්" කියල පෙන්නුවේ. ඥාන සම්ප්‍රයුක්ත කුසලසිත් කියන

එකට. ඒ කියන්නෙ මේකට කර්මයක් පනවන්න බැහැ. මේ අවබෝධය එනකොට කර්ම භූමිය බිඳ වැටිල හේතුඵල දහමට එනවා. මජ්ඣිම සූත්‍රයට එනවා, අන්තවලින් මිදිලා. ඉතිං ඔහොම කියන්න ගියොත් සූත්‍ර පැත්තනෙ. එහෙම නෙමෙයි මේ ප්‍රායෝගික අත්දැකීම් නෙ. පොත කියල දෙයක් දැනෙන්නෙ නැහැ. පොත කියල දේකුත් නැහැ.

***උපාසකඃ*** ඒක හරියටම හරි ආර්යයන් වහන්ස. අර පොඩි දරුවෙකුට දැනෙන සිතුවිල්ලම තමයි.

**ආර්යයන් වහන්සේඃ** ඔව්. **ඒකම තමයි අන්තිමට ඉතුරු වෙන්නෙ. ඉපදිච්ච තැනටම ගිහින් නතර වෙනවා. බලනකොට අර අලව ගත්ත කොහොල්ලෑ ටික සේරම ගලව ගත්ත ස්වභාවයක් එනවා නේද?** ඔය ශබ්ද ටිකයි අරව මේව සේරම ශුද්ධ කරල දාල ආයෙ පොඩි දරුව වගේ හිනා වෙවී ඉන්න එකක් එන්නෙ නේද? ගාණකුත් නැහැ එතකොට. පොඩි දරුවෙක් හිනාවෙවී ඉන්නෙ ගාණක්වත් නැතිව, ඒ වගේ තමයි මේ සේරම.

***උපාසකඃ*** මෙතන ගහක් තියෙනවා. මලක් තියෙනවා. පාටකුත් තියෙනවා. හැබැයි දෙයක් නැහැ නේද ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේඃ** ඔව්. හැබැයි අවබෝධයෙන් මිදිලා. "සංඛිතේ නිබ්බිදාය." ඔන්න ඕකයි අවබෝධ කරනව කියන්නෙ. අවබෝධ කළ ධර්මය. දැන් හොඳට තේරුණා නේද? අපි එහෙම නම් පස්සෙ කතා කරමු නේද? හොඳමයි. ඔබතුමාගෙ ප්‍රශ්නෙ විසඳුණා කියල හිතනවා. තව ටිකක් නුවණින් බලන්න. හොඳ කමටහනක් නේද? තෙරුවන් සරණයි.

***උපාසකඃ*** එහෙමයි ආර්යයන් වහන්ස. තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස.

# හත් වැනි දේශනය

**උපාසිකාව:** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** තෙරුවන් සරණයි.

**උපාසිකාව:** ආර්යයන් වහන්ස මගේ කකුලෙ අමාරුවක් තියෙනවා. මං ඒක බලනවානෙ ආර්යයන් වහන්ස. කකුලේ තෙල් ගාන කොට මං බලනවා මේ බෝතලේ තද ගතිය බලනවා. කකුලෙ තෙල් ගාන කොට එකින් එකට බලනවා. තෙල් ගෑවෙන විදිහ. එතකොට අතට දැනෙන ස්පර්ශයට හංකඩේට දැනෙන කාය ප්‍රසාදය එහෙම බලනවා. ආයෙ බලනවා සිත් හට ගන්නා හැටි. සිත් නම් කොච්චර හට ගෙන නැති වෙනවද කියල බලනවා. සිත පිට දුවනවා. එතකොට මට දැනෙනවා. මං එක වැඩක් කරාට මගේ සිතට සිතුවිලි ගලාගෙන එනව එනවා නේද? අර ඔබ වහන්සේ කියන්නෙ ප්‍රවාහයක් වගේ එනව නේද කියල.

පස්සෙ මට හිතෙනවා මෙතන කවුරුවත් නැතිව නේද තෙල් ගාන්නෙ කියල. අර අන්න එහෙම හිතෙනවා. එහෙම බලනවා ආර්යයන් වහන්ස. පිඟාන අල්ලන කොට තද ගතිය එහෙම බලනවා. මං තේ එකක් බොන කොට ඒකෙ රස්නය සීතල බලනවා. ඒක දිවට දැනෙන බව. ඒකෙ කිරිය සිතක් නේද කියල බලනවා, ආයෙ මං කැමති අකමැති දේවල් බලනවා. සීනි මදි නම් කියල එහෙම බලනව. තව දොරක් අරින්න වහන්න හිතන එක බලනව. එතකොට දොර වැහෙන විට ඇසෙන ශබ්දය බලනව. මං බලනව මට ඒ ශබ්දය ඇසුණෙ කනට නේද කියල. අන්න ඒ විදිහට බලනවා ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඔව්. ආයතන වෙනම දකින එකක් එතන තියෙනවා.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස. මම දැන් දොර වැහුණොත් හයියෙන් සුළඟට හරි මං ඒක බලනවා. සෝත විඤ්ඤාණය, කණේ සිතක් නේද මට ඇති වුණේ කියල. එතකොට ඒ අතර තව මොනවහරි කරන කොට එහෙම නැත්නම් අතීත මතක එනකොට, අතීත මතකයන් මේ දැන් මේ මොහොතෙ නේද සිතන්නෙ. මොකක්ද මේ සිතන්නෙ එහෙමත් කියල හිතනවා. ඒ වගේ, සිත කියපුවා බලන ඒවා, එතකොට ඒවත් හිතෙනවා. සිත අතීතයටත් යනවා. එතකොට මේ සිත අතීතයට ගියා නේද මෙතන මම කියල කෙනෙක් නැහැ නේද කියලත් සිතනවා.

**ආර්යයන් වහන්සේ:** අම්මා ධර්මය ශ්‍රවණය කරන කොට අම්මට ඇහුණා අපි දේශනා කරනවා මේ ආයතන හයම ද්වාර හයක් පමණක් නේද කියල මේක ද්වාර හයක් නම්, දිවට රස දැනෙනවා. ඒ අන්නාසි රස බවත් දන්නවා.

**උපාසිකාව:** එහෙමයි.

**ආර්යයන් වහන්සේ:** ඒක බැස ගන්නෙ නැහැ කියන එක අති සියුම් තැනක්. ඒ කියන්නෙ දිවට රස දැනෙනවා. ඒක "රොබෝ" වගේ. ඒක ක්‍රියා ස්කන්ධ මට්ටමක් ඒක. ඒ කියන්නේ එතන සත්වයෙක්, පුද්ගලයෙක්, ආත්මයක් නෙමෙයි කියල, මේක ආයතන මට්ටම පමණයි කියල. එතකොට සෙන්සර් එකේ ස්වභාවය තමයි ඒ ප්‍රසාද වීමේ ස්වභාවය. දිවට රස දැනෙනවා. එතකොට අපිට දැනුම නැතිවෙලා නෙමෙයි. රහතන් වහන්සේලා මන්දබුද්ධික වෙන්නෙ නැහැනෙ. රහතන් වහන්සේලා දන්නවා මේ අන්නාසි රස කියලත් දන්නවා, එතකොට රහතන් වහන්සේට සියලු රස දැනෙනවා, සුවඳ දැනෙනවා. ශබ්දය ඇසෙනවා. වර්ණ පේනවා, ස්පර්ශ දැනෙනවා. රහතන් වහන්සේට මනෝ ද්වාරයෙන් එන සිතුවිලිත් ඇති වෙනවා. රහතන් වහන්සේ අන්ධවෙලා නැහැ. බීරි වෙලා නැහැ. වෙනද විදිහටම පේනවා. එතකොට අපි දැනගන්න ඕනි මේ රහතන් වහන්සේලාගේ ස්වභාවය කුමක්ද කියලා. මොකක්ද මේ වෙනස කියලා.

**උපාසිකාවः** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේः** ඇත්තටම රහතන් වහන්සේලාගේ ස්වභාවයේ වෙනස තමයි, පෘථග්ජන මනුස්සයකුගේ ස්වභාවය තමයි අන්නාසි රස කියල දන්නවා. මේ රස නිසා බන්ධනයකට කොටු වෙනවා. ඒක විඳීමකට ලක් වෙනවා. ඒක බැස ගැනීමත් දෙයක් වගේ දැනෙන ගතියක් එනවා. ඒක පෘථග්ජන ස්වභාවය. හැබැයි රහතන් වහන්සේට ඔන්න ඔය ස්වභාවය නැහැ. අර අන්නාසි කියල ඒක විඳවන්නෙ නැහැ. ඒක විඳින ගතිය නැහැ. ඒක දෙයක් වෙලා නැහැ. මෙතන දෙයක් කියල දැනෙන එක තමයි අපිට වචනයෙන් සන්නිවේදනය කරන්න වෙන්නෙ. දෙයක් කියල දැනෙනවා කියන විදිහට, හැබැයි ඒක අභ්‍යන්තරේට දෙයක් කියල දැනෙන දැනීමයි නැතිවෙලා තියෙන්නෙ. දැනීමක් ගැන අපි කතා කරා. මේ සාන්දිට්ඨික ධර්මයක් කතා කරන්නේ. එහෙනම් දිවට දැනෙන රස දෙයක් වෙන්නෙ නැහැ. ඒක අන්නාසි රස කියල දන්නවා. හැබැයි ඒක දෙයක් වගේ දැනෙන්නෙ නැහැ කියන එක, අති ගැඹුරුයි. දැනුම නැතිවෙලා නෙමෙයි අන්නාසි කියල දන්නවා. හැබැයි දෙයක් කියල දැනෙන්නෙ නැහැ. විඳවන්නෙ නැහැ. අන්න එතන ආත්මයක් නැහැ. සත්වයෙක් පුද්ගලයෙක් නැහැ. මෙතන තියෙන්නෙ ක්‍රියාවලියක් විතරයි.

නාසයට දැනෙන සුවඳ, **පිච්චමලේ සුවඳ කියල දන්නවා. සුවඳත් දැනෙනවා. පිච්ච මලේ සුවඳ කියල දැනුමෙන් මනෝ විඤ්ඤාණයෙන් එනවා. හැබැයි ඒක දෙයක් කියල විඳවන්නෙ නැහැ. ඡන්ද රාගය දුරු වෙනවා. වර්ණ පටිසංවේදී - වර්ණ රාගන පටිසංවේදී, ගන්ධ පටිසංවේදී - ගන්ධ රාගන පටිසංවේදී, රස පටිසංවේදී - රස රාගන පටිසංවේදී මේ රාග සංවේදී කියන්නෙ, රාගයක් තියෙන්න දෙයක් තියෙන්න ඕනි.** මේකෙ තේරුම මේ වචනෙ නැති වෙන්නෙ නැහැ. පිච්ච මල කියන වචනෙ නැති වෙන්නේ නෑ. හැබැයි වචනෙ දෙයක් කියන එක දැනෙන්නෙ නැහැ. දෙයක් කියන්නෙ ශබ්දයක් විතරයි. ඔන්න ඔතන තමයි අම්මේ මේ ගමන තියෙන්නෙ. මේ නිවන් මගේ රහස තියෙන්නෙ ඔතනයි. ඔතන මේ අලමරිය ඥාන දර්ශනය තියෙන්නෙ ඔතනයි. 'අනිමිත්ත සමාධිය' තියෙන්නෙ ඔන්න ඔතන. අනිමිත්තයි, ඒ කියන්නෙ නිමිති නැතිව නෙමෙයි. එහෙනම් කියනව මේ නිමිති නෑ කියල. එහෙම

කියන්නෙ නැහැ. නිමිති නිරෝධය එහෙම කියන්නෙත් නැහැ. "සංඥා නිරෝධය" දැන් සංඥාව නැති වෙන්නෙ නැහැ. සංඥා අභ්‍යන්තර නැහැ දැන්. ඒ කියන්නෙ සංඥාව තියෙනව කියන්නෙ පිච්ච මල කියල දන්නවා. මේ රස අන්නාසි රස කියල දන්නවා. ඒත් මෙතන මේ දැන ගැනීම "ජානතෝ පස්සතෝ" කියන්නෙ අති ගැඹුරු දෙයක්. මේක තමයි මේ නිවන් මග තියෙන යමෙකුට තියෙනව නම් රහසක් කියල මෙතන තමයි රහස තියෙන්නෙ.

ආයතන නිරෝධයක් තමයි නිවන කියන්නෙ. ආයතන නිරෝධයට යන්න බැරි වෙන්නෙ ගොඩක් අයට මේ සියුම් තැන පේන්නෙ නැහැ. බුදුන් වහන්සේ ඊටම අදාළ කෝණයක් පෙන්වනවා. මේක දැකිය යුතු කෝණය අති සියුම්. ඒ කියන්නෙ දිවට රස දැනෙනව. ඒත් ඒ අන්නාසි කියල දන්නවා. හැබැයි අන්නාසි කියල අපිට දැනෙනව මේක, අන්නාසි කියලත් දන්නවා, හැබැයි මේක දෙයක් කියල දැනෙන්නෙ නැහැ. භවයක් එන්නෙ නැහැ. භවය කියන්නෙ දෙයක් කියන එකයි. ඒකයි "සබ්බ සංඛාරා" කියන්නෙ. දෙයක් කියන එකයි.

අපිට තාම දෙයක් කියන එක මේ සමාජෙට අලුත්. මේ කියන එක තේරෙන්නෙ නැහැ. හැබැයි මෙතනමයි තියෙන්නෙ නිවීම. දෙයක් නැත්නම් ගින්නක් නැහැ. දෙයක් තිබ්බොත් රාග ද්වේෂ මෝහ සිතේ හට ගන්නවා. දෙයක් තිබ්බොත් කර්මයක් තියෙනවා. දෙයක් නැත්නම් කර්මයක් නැහැ. කර්ම භූමියත් අහෝසි. ඇත්තටම හේතු ඵල දහම තුළ දෙයක් හමුවෙන්නේ නැහැ. "හේතුං පටිච්ච සම්භූතා හේතු භංගා නිරුජ්ජති" කියන්නෙ ඔන්න ඔය නිසයි. මෙතන දෙයක් හට ගන්නෙ නැහැ. ශබ්ද, වර්ණ වලින් එන කිසිම තැනක දෙයක් නැහැ. මේ සිත්මයි, අපි ඇසුරු කරන්නෙ. මේ සිත් තමයි බාහිර කියල අපිට බලගැන්විලා එන්නෙ. උණුසුම සීතල තද ගතිය මේ ශුද්ධාෂ්ටකේ කියන්නෙත් මෙන්න මේ ප්‍රසාද ටිකම තමයි. නමුත් ඒක අපිට දෙයක් කියල දෙනවා. නමුත් අපිට දෙයක් ඇත්තෙ නැහැ. මේක ටිකක් නුවනින් දැන් බලන්න.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** රස දැනෙන කොට මේ රසයෙ දෙයක් තියෙනවද බලන්න. **රස දැනෙන එක හරි. ඒක අති සියුම්. හැබැයි දෙයක් නැතිව ඒක පරිහරණය කරන්න පුළුවන් වෙනව නම් ඒ නිරාමිස සුවයක්. එතනයි ක්‍රියා සිත. එතනයි රහතන් වහන්සේගේ ස්වභාවය. එතනයි "අනිමිත්ත සමාධිය" තියෙන්නෙ. එතනයි "අලමරිය ඥාන දර්ශනය" තියෙන්නෙ. එතනයි "විදර්ශනා සමාධිය" තියෙන්නෙ. දෙයක් නැති තැන. "සබ්බ සංඛාර විමුක්තිය" තියෙන්නෙ එතනයි. "නාම රූප පරිච්ඡේද ඥානය" තියෙන්නෙ එතනයි. එය අනිමිත්තයි. ශූන්‍යතයි, අනියතයි. මේ තමයි නිවන. මේ නිවන හැම සිතකම තියෙනවා.** අපිට දකින්න බැරිවෙලා තියෙනවා. හැබැයි මේක හරි සරලයි. භාහිය තාපසතුමාට මේක තේරුණා. "දිට්ඨේ දිට්ඨ මත්තං භවිස්සති." "සුතේ සුතමත්තං භවිස්සති." "මුතේ මුතමත්තං භවිස්සති." කිව්වෙ විඤ්ඤාතේ - විඤ්ඤාතමත්තං" මෙන්න මේ කතාවට තමයි.

ආයතන හයේම "නිරෝධයක්" තියෙනවා. ඒ නිරෝධය අත් දකින්න. හැබැයි මේ මොහොත දකින්න. කල්‍යාණ මිත්‍රයාගේ පණිවිඩය ඒකයි. ඒ තුළ ගින්නක් නැහැ. දුකක් නැහැ. හැම මොහොතෙම මිදිලා පුදුම ශාන්ත සුවයක් දැනෙනවා. ඒමයි ශාන්ත. ඒමයි ප්‍රණීත. "ඒතං ශාන්තං ඒතං ප්‍රණීතං යදිදං සබ්බ සංඛාරං සමථෝ මේ සියලු සිතුවිලි සමනය වෙන තැන කියන්නෙ "සබ්බ සංඛාර සමථය" වෙනව කියන්නෙ දෙයක් නැති බවයි. මේකයි ගැඹුරු විග්‍රහය. මේක අපි විසින්ම ප්‍රත්‍යක්ෂ කරගත් ධර්මයක්. බුදුන් වහන්සේ ලෝකෙට හෙළි කරපු ඒ පණිවිඩේ අපි ඒ පණිවුඩේ දැක්කා. අපි ඒ පණිවුඩේ පාද ගත්තා. අපිට ඒ පණිවිඩේ තුළින් ඒ සත්‍යය මතු වුණා. අපිට ඒක ප්‍රත්‍යක්ෂයි. අපි දෙයක් නැතිව අද වාසය කරනවා. කෙනෙක් දෙයක් ඇතිව කටයුතු කරන එකත් අපි දෙයක් නැතිව කටයුතු කරන එකත්, අතර අහසට පොළොව වගේ වෙනසක් තියෙනවා.

***උපාසිකාව:*** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** අම්මට දෙන්න ඕනි පණිවුඩය අම්ම අපිට පොත් පරිත්‍යාග කරා. අම්ම අපිට පොත් පරිත්‍යාග කරල කිව්ව මේ

ආර්යයන් වහන්ස ධර්මය තමයි වැදගත් කියලා. මේ පරිත්‍යාගය නිවන් අවබෝධ වෙන්න හේතු වෙන්න ඕනි කියල තමයි අම්ම කිව්වෙ. අපි අම්මට කියන්නෙත් ඒකමයි. අම්ම රත්මලානෙ අම්ම. අපි එහෙමයි කතා කරන්නෙ. අම්ම අපිට ත්‍රිපිටක පොත් වහන්සේලා පූජා කළේ අම්මට ධර්මය අවබෝධ වෙන්න කියලා. අපිට බලෙන් ඒක දෙන්නත් බැහැ. අපිට එහෙම ලේසියෙන් දෙන්න බැහැ. අම්ම ඒක ගන්නත් ඕනි. අම්මට ඕනිකම තියෙනවා. අම්ම ගොඩක් දක්ෂයි.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස. අද පාන්දර හතරෙ ඉඳල දේශනා අහනවා.

**ආර්යයන් වහන්සේ:** අම්ම බොහොම නිහතමානීව බොහොම හික්මීමෙන් "ඛන්තී පරමං තපෝ" කියන විදිහට අම්මට කරන්න පුළුවන්. අම්මට නිවන අත්දකින්න පුළුවන් නම්, ඒ අම්මෙ නිවනේ අත්දැකීමයි.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස. ආර්යයන් වහන්ස මට දෙයක් කියල දෙන්න. ස්කන්ධයේ උදයවැය දකිනව කිව්වහම හැම තැනකදීම ස්කන්ධය බලන්න පුළුවන් නෙ.

**ආර්යයන් වහන්සේ:** අම්ම එහෙම මෙනෙහි කළොත් ඒක මනසිකාරයක් කියල දැනගෙන ඉන්න ඕනි. මේක සිහියට අසු වෙනවා. මෙනෙහි කරන එකත් සිහියට අසුවෙනවා. මේක **මෙනෙහි නොකරන වෙලාවටත් අම්මට නිරායාසයෙන්ම මිදෙන ස්වභාවයක් දැනෙනව** නම්, එතන තමයි අම්මෙ **සමාපත්ති සුවය.**

**උපාසිකාව:** එහෙමයි.

**ආර්යයන් වහන්සේ:** අපි දැන් මාර්ග සිත් කියන ඒව වෙනයි, ඵල සිත් කියන ඒව වෙනයි කියල පෙන්වනවනෙ. සවිතක්ක සවිචාරං කියල මාර්ග සිත් පෙන්වනවනෙ. "අවිතක්ක අවිචාරං" කියල ඵල සිත් පෙන්නනවනෙ. අම්ම කොහොමත් ඉන්නෙ සෝතාපන්න මාර්ගයේ. සිත දකිමින් මේ මග යනවා. අම්මට හැබැයි සෝතාපන්න ඵලයට පත්වෙන්න ලැබෙන්නෙ කවදහරි, අම්ම ඔය මෙනෙහි කරන එකත් පැත්තකින් තියල

අම්මගෙ සිත දිහාවට සිහිය පවත්වන්න. අම්මට මිදෙන ස්වභාවයක්, දෙයක් වගේ නොදැනෙන ස්වභාවයක් ගිනි ගත්තෙ නැති ස්වභාවයක් දැනෙන හැම මොහොතකම "තන්ත්‍ර තන්ත්‍ර විපස්සතී" අම්ම එතන නිවන අත්දකිනවා. අපි නිවන උඩින් පැනල යනවා. අපි ඊගාවට විසිරෙන සිතට රැවටෙනවා. අපි හිතනවා සිත හැම තිස්සෙම විසිරිලා කියල. නැහැ, අම්මෙ අපි හැම තිස්සෙම නිවන උඩින් පැන පැන යනවා. ඒකයි ඇත්ත කතාව.

අපි ඒකයි කිව්වෙ බැස ගත්ත සිත මෙනෙහි කරන්න. මේක සිහියට පවත්තලා බලන්න. නුවණට හසුවෙයි, විශාල ප්‍රමාණයක් බැස ගන්නෙ නැති බව. **නිවන් දකින සිත් බොහොමයක් නිවන් නොදකින සිත් ටිකයි තියෙන්නෙ.** අපි ඒ නිවන් නොදකින සිත්වලට, අවිද්‍යාව නිසා මේක නොදන්නකම නිසා සේරම වහල දාල. අපි හිතනවා ඔක්කොම උපාදානය වෙලා කියලා. රැවටෙන්න එපා අම්මෙ. අම්ම යෝගාවචර භූමියේ ඉන්නෙ. අම්ම සිත හොඳින් පිරිසිදුව දැක ගත්තොත් අන්න බැස ගන්න සිත් මිදුණොත් අම්ම සියල්ලෙන් මිදෙනවා.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** අම්මගෙ රාග, ද්වේෂ, මෝහ කෙලෙස් සංසිඳෙන බව. ඒක ස්වභාවයෙන්ම සිද්ධ වෙන එකක්. අපි හිතල කරන එකක් නෙවෙයි. අම්මට, එහෙම තමයි මේ "පංචවිධ ආනිශංස" කියල බුදුන් වහන්සේ දේශනා කළේ.

**උපාසිකාව:** එහෙමයි.

**ආර්යයන් වහන්සේ:** මේ මග යන යෝගාවචර භූමිය තුළ මේ සත්වයන්ගේ විසුද්ධිය තියෙනවා. සත්වයා සත්‍යය දැන ගන්නවා. "ශෝක පරිදේව සමතික්ඛමාය" "දුක්ඛ දෝමනස්ස අත්තගමාය - ඥායස්ස අධිගමාය නිබ්බානස්ස සච්චකිරියාය. මේ පංචවිධ ආනිසංස මෙතන තියෙනවා. අම්ම සියලු දුකෙන් මිදෙනව. අම්ම දුගතියකට වැටෙන්නෙ නැහැ. අම්මාගෙ "සප්ත විසුද්ධිය" ඒ කියන්නෙ ආත්ම දෘෂ්ටිය ගිලිහිලා යනවා. දැන් මෙතන සතෙක් පුද්ගලයෙක් නැති බවක්

දැනෙනවා. ඒ “ඥානස්ස අධිගමාය” කිව්වෙ. ඔය සේරගෙන්ම මිදුණ අවදියක් අම්මට හම්බ වෙනවා. එයයි නිවනේ අත්දැකීම.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** අම්ම නිවන් දකිනව අම්මෙ. අම්මගෙ හිතේ පොඩ්ඩක් විසිරෙන ගතියක් තියෙනවා. ටිකක් කලබල ගතියක් තියෙනවා. අම්මගෙ දැන් මේ මොහොතෙ රට යන සංඥාව සකස් වෙනවා. එතකොට යනවා කියන සංඥාව නිතරම එනවා. ඒකත් පැත්තකින් තියන්න යන වෙලාවට යයි.

**උපාසිකාව:** මම එහෙම නම් නැහැ ආර්යයන් වහන්ස. මට දරුව එන්න කියන නිසා තමයි මම යන්නෙ. නැත්නම් මට යන්න කිසිම කලබලයක් නැහැ. ආසාවක් නැහැ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** හොඳයි, හොඳයි කොහේ හිටියත් කමක් නැහැ අම්මෙ. මේ උපදේශය පිළිපදින්න. මේ කමටහන මේ ලෝකයේ තියෙන වටිනාම කර්මස්ථානය. අම්ම මේ ධර්මය අහන්න. මේ අන්තිමට දුන්න කමටහන මේ තමයි වටිනාම කර්මස්ථානය. **මේ තමයි කර්මය සකස්වන ස්ථානය. මේ තමයි කර්මස්ථානය.** අම්මට මේ කර්මස්ථානයෙන් මිදෙන්න මේක හේතුවෙනවා. මේක නිවනටම හේතු වෙනවා.

**උපාසිකාව:** මං කොහේ හිටියත් ධර්මය තියෙනවනෙ. මම ධර්මයත් එක්ක තමයි ඉන්නෙ කියන එක මට තියෙනවනෙ..

**ආර්යයන් වහන්සේ:** අම්ම ධර්මයත් එක්ක ඉන්නව කියන්නෙ දිවට රස දැනෙනවා. ඒක අන්නාසි රස බවත් දන්නව. හැබැයි ඒක දෙයක් කරගන්නෙ නැහැ කියන තැනටයි එන්න ඕනි. එතනයි ධර්මය දකිනව කියන්නෙ. ධර්මතාව කියන්නෙ පොතක තියෙන දෙයක්වත් දැනුමක්වත් නෙවෙයි. **මේ අත්දැකීම තුළ දෙයක් නැතිව ඉන්න එකයි ධර්මය දකිනව කියන්නෙ. අන්න කුසලස්ස උපසම්පදාව කියන්නෙ ඕකටයි.**

**උපාසිකාව:** එහෙමයි.

**ආර්යයන් වහන්සේ:** ඔන්න ඔතනයි "සචිත්ත පරියෝ දපනං" කියන එක සිද්ධ වෙන්නෙ. එහෙනම් **"සබ්බ පාපස්ස අකරණං" මේ සියලුම සිතුවිලි වලින් අම්ම මිදෙනවා.** සියලුම ඒ රූපාරම්මණ වලින් අම්ම ගැලවෙනවා. එහෙනම් කුසලස්ස උපසම්පදා. ඒ කියන්නෙ **දිවට රස දැනෙනවා. ඒ අන්නාසි රස බවත් දන්නව. හැබැයි ඒක දෙයක් කරගන්නෙ නැතිව අන්න අම්ම කටයුතු කරන්න දක්ෂ වෙනවා. ඕකයි කුසලස්ස උපසම්පදා කියන්නෙ ඒකට තියෙන කුසල දක්ෂතාව.** අන්න "සචිත්ත පරියෝදපනං" මේ "බුද්ධ ස්වභාවය" මතුවෙන්නෙ අන්න ඒ ස්වභාවය තුළයි. රාග, ද්වේෂ, මෝහ කෙලෙස් සංසිඳෙන්නෙ ඒ ස්වභාවය තුළයි, ඒ ක්ෂීණාස්‍රව ස්වභාවයට දියවීගෙන යනව. එයයි ආර්යඅෂ්ඨාංගික මාර්ගයේ ඇරඹුම. මේ මොහොත දකින එක. මෙයයි මොහොත. මේ මොහොතට තුන් කාලයක් නැහැ. මේ මොහොත ධර්මය තුළින් මතුවෙනවා. **දෙයක් දැනෙන්නෙ නැති හැම සිතකම දෙයක් දැනෙන්නෙ නැතිනම් ඒ අවධිමත් ස්වභාවයයි. එයයි අවධිය. එයයි බුද්ධක්ෂණය. ඒ අවධිමත් ස්වභාවයයි. ඒ අධිගමනයයි. ඤායස්ස අධිගමනය** කිව්වෙ ඒකටයි. අම්මට දැන් වැටහුණා නේද?

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස. ගොඩක් වෙලාවලදී සමහර වෙලාවට කවුද මේක කරේ කියල. එතන කෙනෙක් නැහැ නේද කියල අවබෝධය ගොඩාක්ම තියෙනවා. මම ගමනක් ගිහින් දිග කූඩයක් බිම ඇන ඇන ආවා. පොඩ්ඩක් ළඟකට වහී කියලා. මං බලනවා කවුද මේක ඇන අන යන්නෙ කොහේ ඉඳල කොහේටද යන්නෙ කියල එහෙම සිතුවිල්ලක් ආවා. දැන් මම හිතල නෙමෙයි නේද කකුල උස්සලා තියන්නේ. මං හිතල නෙමෙයිනෙ කූඩේ ඇනල තියෙන්නේ. මං එතන ඉඳල මෙතනට ඇවිත් නේද? එහෙම ඒ වගේ දේවල් දකිනවා. මේ කෙනෙක් යන ගමනක් නේද කියල එහෙම ඒවා දකිනවා.

**ආර්යයන් වහන්සේ:** බොහොම හොඳයි ඒක. අත්දැකීම් ප්‍රායෝගිකව එන අත්දැකීම්වල ධර්මය දකිනව නම් අම්මට දියුණුවක් වෙනවනෙ. මේ ආත්මයේදීම නිවන් දකින බව අපිට තේරෙනවා. කලබල නොවී පොඩ්ඩක් කොතන හිටියත් ඒක ගැටලුවක් නැහැ. ආධ්‍යාත්මිකව අපිට දැන් පේනවනෙ.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස. කොහේ හිටියත් ධර්මය දැකගන්න පුළුවන්.

**ආර්යයන් වහන්සේ:** ඔව්. ඒකෙ ගැටලුවක් නැහැ. සමහර වෙලාවට ලොකු අවබෝධයකට පත්වෙලා ඉන්නෙ අපේ රටේ අය නෙමෙයි. අපිට කතා කරන අයගෙන් වැඩි කොටසක් පිටරටින් එන්නෙ. ඒකට හේතුව ඒ අයට නිදහස තියෙනව. ඒ අය බොහොම වේගයෙන් මේක දිහා බලනවා. ඒ අයට ගොඩක් වෙලාවට මනසට, ඒකට බොහොම නිදහස ගන්න හැකියාව ලැබිල තියෙනවා. ලංකාවෙ ගොඩක් මිනිස්සුන්ට ප්‍රශ්න වැඩියි. දැනුම ගොඩක් වැඩියි. ඒක නිසා අර මොහොත, හැම තිස්සෙම පනිනව එහෙට මෙහෙට. ඒගොල්ලන්ගෙ දැනුමට බලන කොට, විචිකිච්ඡාව ඇවිල්ලා එක එක හේතු. ඒ නිසා අපි දේශනා කරන දේ සමහර වෙලාවට ප්‍රායෝගික නැති නිසා අත්දකින්නෙ නැති නිසා. ඒක විශ්වාසයක් කරගෙන ඉන්න කොට, ඕනම වෙලාවක බිමට කඩා වැටෙනවා. ඒක තමයි අත හැරෙන එක. ඇත්තටම ධර්මයත් අත හැරෙනවා. මේ අය කතා කරන්නෙ දෘෂ්ටියට රැවටෙන එක ගැන. මේ සත්‍යය වැහෙන්නෙ හේතුව දෘෂ්ටි ගතවීම. ඉතිං අම්මට නම් මේ කියපු කාරණාව වැටහෙන්නත් ඕනි දෙයක් නැති බව. මේක **ධර්මය තුළ තියෙන වටිනාම වචනය තමයි දෙයක් නැති බව.**

**උපාසිකාව:** ආර්යයන් වහන්ස සමාවෙන්න එතකොට ආර්යයන් වහන්ස දැන් දෙයක් නැහැ කියල කියන එකමනෙ පොත නැහැ කියල කියන්නෙ. ඔබ වහන්සේ හැම එකටම පොත කියල ගත්තට අපිට ඕනිම එකක් ආදේශ කරන්න පුළුවන් නේද? ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ගැටලුවක් තියෙනවා. මේ කියන වචනෙ. පොත කියල දන්නවා පොත කියල රූප සංඥාවක් එනව. පොත කියල දන්නවා. දැනුමක් තියෙනවා. හැබැයි ඒක දෙයක් වගේ දැනෙන්නෙ නැහැ.

**උපාසිකාව:** ඒක හැම එකටම ආදේශ කරන්න පුළුවන්ද? ඔබ වහන්සේ අර එක නමක්නෙ පොතක් කියල. පොත කියල කිව්වට අපිට ඒකට කියන්න පුළුවන්නෙ ඕනෙම භාණ්ඩෙක නමක්. කියන්න පුළුවන් නෙ ඒ වෙනුවට.

**ආර්යයන් වහන්සේ:** ඔව්. දැන් අපේ සිතුවිල්ල, ආරම්මණය තමයි දෙයක් කරගන්නව කියන්නෙ. අපි හිතමුකො සිතුවිල්ලක් එනව කියල. සිතුවිල්ල දෙයක් කරගෙන, අනේ අපේ පුතා නෙ කියල දෙයක් කරගෙන අඬනව නම් වැලපෙනවා නම්, එතකොට දෙයක් තියෙන හින්දනෙ එයාට එහෙම වෙන්නෙ. දැන් සිතුවිල්ලෙන් එනව, ගොඩක් ද්වාර වලින්. මනෝද්වාරයෙන් ගොඩක් අරමුණු එනවා. ඒ සිතුවිල්ල දෙයක් වෙනව ඊට පස්සේ ඔය ආදරය, කරුණාව, දයාවත් දෙයක් වෙලා එන්නෙ. එතකොට අනේ පව් ඒ සතා කියල, දෙයක් කරගෙන බලන කොට, මේ පැත්තෙ ආත්මයක් තියෙනවා ඒ හැම දේකම. දෙයක් තියෙන හැම තැනකම මමත් ඉන්නවා. "ඒතං-මම-ඒසෝ හමස්මිං - එමේසෝ අත්තා. හැබැයි දෙයක් නැත්නම්, එහෙනම් "නේතං මම" - මමත් නැහැ, "නේතෝ හමස්මිං" - මගේ කියල දෙයක් නැහැ. "නමේසෝ අත්තා" මගේ ආත්මෙ කියල දෙයකුත් නැහැ. දෙයක් කරගන්නවද නැද්ද කියන තැනයි, තියෙන්නෙ ආත්මෙ.

**උපාසිකාව:** එහෙමයි. අපි හිතන දෙයක් නෙමෙයි, බාහිර තියෙන්නෙ කියන එක නේද ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** අපිට දෙයක් වගේ සිහියට අසුවෙන ගතියක් සිහියට අසුවෙනවා. ඒක කියන්න බැහැ බාහිරද මෙහෙද කියන එක. ඒකට අන්තයක් නැහැ. දෙයක් වගේ දැනෙනව නම් බාහිරම කියල තමයි අපි ගැට ගහල තියෙන්නෙ. "අන්තෝ ජටා බහි ජටා" වෙන්නෙ ඔන්න ඔය නිසයි. එන්නෙ මෙහෙන් උනාට ගැට ගහන්නෙ බාහිර කියලමයි. ඒකට "අන්තෝ ජටා බහි ජටා" කියල කියන්නෙ. දෙයක් තිබ්බොත් තමයි ගැට ගහන්නත් දෙයක් තියෙන්න ඕනි.

**උපාසිකාව:** එහෙමයි.

**ආර්යයන් වහන්සේ:** දෙයක් වගේ හැම තිස්සෙම අපි ඇසුරු කරන්නේ චිත්තයක්ම තමයි. "චිත්තේන නීයති ලෝකෝ" දැන් ශබ්ද වර්ණනෙ මෙතන ස්පාක් වෙන්නෙ. ශබ්ද වර්ණ හා දැනීම් ටිකයි. එතකොට දිට්ඨ, සුත, මුත දෙයක් වගේ දැනෙන්නෙ ශබ්දෙක වර්ණෙක කොහොමද, අන්න එතන දැනෙනවා. මේකේ අපි මායාවකට කොටුවෙලා

ඉන්නවා ඔන්න ඔතනින්. දෙයක් වගේ දැනෙන මායාවක අපි අසුවෙලා ඉන්නවා. කරන්ට් එකකට කොටුවෙලා ඉන්නවා. අර යම්කිසි නන්දියකට ආරෝපණ බලයකට කොටුවෙලා ඉන්නවා. දෙයක්වගේ දැනෙන, හැම තිස්සෙම දෙයක්, ඇවිදින කොට, වටපිට බලන කොට, කතා කරන කොට දෙයක් හිතන කොටත් දෙයක් කොහෙද ඔය දේ තියෙන්නෙ. එහෙම දෙයක් නැහැ.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** මේක හරි ගැඹුරුයි. මේ දේශනයම ඇහුවත් ඇති නිවන් දකින්න. මේකම සිය පාරක් ඇහුවත් නිවන් දකිනවා. මොකද ආයතන හයේම මෙතනමයි තියෙන්නෙ රහස පෙන්වන තැන. සිත දකිනවා කියන්නෙ ඔය දෙයක් නැති බව දකින එක තමයි. එතකොට මමත් නැහැ. ආත්මෙත් නැහැ. කොයිම වෙලාවකවත් ආත්මය නැති වෙන්නෙ නැහැ. දෙයක් තියෙනවා නම් මොකද දෙයක් තියෙනව නම් මමත් ඉන්නවා. වටිනාකමත් තියෙනව දෙයක් තියෙනව නම්.

දෙයක් තියෙනවා නම් කතා කරන්න දෙයක් නැහැ. මම ඇවිල්ල ඉවරයි. දෙයක් තියෙනව නම් මම ඉන්නව කියල හිතන්න ඕනි නැහැ. මම තමයි මේ කියන්නෙ. දෙයක් තියෙන්නේ කාටද මට. "ඒතං මම" කොහොමත් ඉන්නවා. ඒකයි අජ්ජෝසාය තිට්ඨති කිව්වෙ. දෙයක් කරගත්තම එක තමයි අජ්ජෝසාය තිට්ඨති කිව්වෙ. "යාරූපේ නන්දි. එතකොට " නන්දිය" තියෙනව. උපාදානෙත් තියෙනවා. "තදුපාදානං" අන්න භවයක් තියෙනවා. දෙයක් තියන එකමයි භවය කියන්නෙ. "තදූපාදානං භවෝ" එහෙම වුණොත් ජාති, ජරා මරණ කර්මය තියෙනවා. ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව තියෙනවා.

ඒ කියන්නෙ දෘෂ්ටි ගතයි. ඒ කියන්නෙ බාහිර ඇත්ත කරන හැම දෙයක්ම දෘෂ්ටියක්. සම්මා දිට්ඨිය නැහැ. සම්මා දිට්ඨිය තියෙන්නෙ දෙයක් නැති, අන්න ආධ්‍යාත්මිකව දැනෙනව මේ දෙයක් නැති බව. මේක ආධ්‍යාත්මික දියුණුවක්. මේක ධම්මචක්ඛුයට අසුවෙන්නෙ. "මසැසට" පේන දෙයකුත් නොවේ. මේක අභ්‍යන්තරයේ සිහියට අසුවෙනවා. කිසිම තැනක දෙයක් නැහැ නේද කියල. ඒකයි අපි පෙන්වන්නෙ හිත තිබහයි

කිව්වට හිතට වතුර බොන්න බැහැ නේද කියල. දැන් තිබහයි කිව්වෙ කවුද? තිබහයි කියල දෙයක් තියෙනවද? අන්න සිතුවිල්ල දෙයක් වෙලා. තිබහ දෙයක් වෙලා. අන්තිමට කටට දානවා. බඩට යනවා. එළියට යනවා. දැන් හිත වතුර බිව්වෙ නැහැනෙ. එතකොට **මම වතුර බොනව කියන්නෙ හිත වතුර බොනවා කියන එක. දැන් ක්‍රියාවලිය තමයි කටට වතුර දාන එකයි, බඩට යන එකයි, එළියට යන එකයි. දැන් ක්‍රියාවලිය වෙනයි. මම වෙනයි.**

දැන් සිත හිතනවා. තිබහ දෙයක් කරගෙන දැන් මෙතන දෙයක් තියෙනවද නැහැ. ඒකයි ඇත්ත කතාව. මම බත් කනව කිව්වට මට බත් කන්නත් බැහැ. කටට දානවා, බඩට යනවා, එළියට යනවා. මම ඇවිදිනව කිව්වට මට ඇවිදින්නත් බැහැ. **මම කණ්ණාඩියෙන් මම දිහා බලනවා කිව්වට මට මාව බලන්නත් බැහැ. ඇයි ඒ. ඒකත් චිත්තයක් විතරයි.** වතුර තිබහයි කියන්නෙ මායාවක්. දෘෂ්ටි දෙයක් වගේ දැනෙනවා. දුක දෙයක් වගේ දැනෙනව. තිබහ දෙයක් වගේ දැනෙනවා. බඩගින්න දෙයක් වගේ දැනෙනවා. හැබැයි සිතුවිල්ලක්. ඊට පස්සෙ කෑව කියල හිතනවා. නැහැ කියලත් හිතනවා. නැති බවත් දෙයක් කරගෙන. තියෙන බවත් දෙයක් කරගෙන. මේක මහ පුදුම කතාවක් නේද?

***උපාසිකාව:*** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** මෙතනමයි නිවන් මග තියෙන්නෙ. වෙන කොහෙවත් නෙමෙයි. මෙතනින්මයි ගැලවෙන්නෙ. මෙතනමයි "ඛණික විපස්සනා ඛණික සමාධිය" තියෙන්නෙ. මෙතනමයි ඛණික විපස්සනා ඛණික සමාධිය තියෙන්නෙ. වෙන කොහේවත් නැහැ. මෙතනමයි විපස්සනාව තියෙන්නෙ. මෙතනමයි විදර්ශනාව තියෙන්නෙ.

**මේක ගැඹුරෙන් දකින එක විදර්ශනාව. මේක සිහියට අසුවෙනවා. සිහියට අසුවෙන එක අන්ත විපස්සනාව.** දෙකම එකට තියෙනවා. විදර්ශනාවයි විපස්සනාවයි. මේක නිවනට උපනිෂ්ශ්‍රයයි. සමත පුබ්බංග මා ධම්මා කිව්වත් විපස්සනා ඛණික සමාධියෙන් නිවන් දකින්නෙ. විදර්ශනා පුබ්බංගමා ධම්මා කිවවත් විපස්සනා ඛනික සමාධියෙන් නිවන් දකින්නේ "විපස්සනා ඛණික සමාධිය" කියන්නෙ මේ දෙයක් නැති

බව දැනෙන සමාධිය. එයයි. අනිමිත්ත සමාධිය. එයයි බුදුන් වහන්සේ ලෝකෙට හෙළි කරන මේ දහම තුළ අර මජ්ඣෙ ඤාණං කියන තැන තියෙන්නෙ. දෙයක් නැති බව. දෙයක් තිබ්බොත් ඇත නැත අන්ත තියෙනවා. දෙයක් නැත්නම් අන්ත නැහැ. අන්ත මජ්ජිම සූත්‍රයෙන් පෙන්වන තැන, "යො උභො අන්තෙ විදිත්වාන මජ්ජෙ මන්තා නලිප්පති තං බෲහි මහා පුරිසෝ සේද සිබ්බනි මජ්ජගා. අම්මට දහම හමුවෙලා තියෙනවා. අම්ම හිතනවට වැඩිය කල්‍යාණ මිත්‍ර ඇසුර හරිම ප්‍රබලයි. අම්මට දැනටමත් පුදුම විදිහට දැනෙනවා ඇති.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ:** මේ නිවන තුළම නේද මේ ඉන්නෙ. මේ ආර්යයන් වහන්සේ නිවන ස්පර්ශ කරල පෙන්වනව නේද? මේ තියෙන්නෙ කියල.

**උපාසිකාව :** එහෙමයි ආර්යයන් වහන්ස. බුදුහාමුදුරුවො මේ තරම් කරුණාවෙන් මේ දේ කිව්ව ඔබ වහන්සේත් ඒ තරම්ම කරුණාවෙන් දේශනා කරනවා. මේ දේශනා හාරසියයකට වැඩිය මං අහල තියෙනවා.

**ආර්යයන් වහන්සේ:** අම්මට දැන් තේරෙනවද?

**උපාසිකාව :** එහෙමයි ආර්යයන් වහන්ස. ආර්යයන් වහන්ස මම කරපිංචා කොට ටිකක් වේලලා කුඩු කරා. දැන් මං බලනව කෝ කරපිංචා කොළ ටිකක් කියලා. දැන් මෙතන තියෙන්නෙ කුඩු ගොඩක් විතරයිනෙ කියලා. එතකොට ඒ සිතුවිල්ල වැරදිද ආර්යයන් වහන්ස. මෙහෙම බැලුව එක හරිද කමක් නැද්ද?

**ආර්යයන් වහන්සේ:** දැන් අම්ම එහෙම හිතන එක සිතුවිලිනෙ. දැන් අම්මගෙ සිහියට අසුවෙනවනෙ දැනෙනවනෙ. එහෙම දෙයක් නැති බව.

**උපාසිකාව:** එහෙමයි.

**ආර්යයන් වහන්සේ:** ඒ දෙක දෙකක්.

**උපාසිකාවඃ** එහෙමයි.

**ආර්යයන් වහන්සේඃ** සිතුවිල්ල වෙනයි දැනෙන එක වෙනයි. සිතුවිල්ල තුළ කරපිංච කියල දෙයක් නැහැ කියන දේ තියෙනවා. හැබැයි දැනෙන එකේ එහෙම නැහැ.

**උපාසිකාවඃ** අනික ආර්යයන් වහන්ස අපි කරපිංච කිව්වට වෙනත් ජාතිකයො කරපිංච කියන්නෙ නැහැනෙ.

**ආර්යයන් වහන්සේඃ** මෙතන දෙයක් නැහැ කියල හිතන එක සිතුවිල්ලෙ තියෙනවා. සිතුවිල්ලෙ හැම තිස්සෙම නාමරූප තියෙනවනෙ. කරපිංච කියන දෙය නැහැ කියල හිතන එක සිතුවිල්ලක්. හැබැයි අර දැනෙන එක එහෙම දෙයක් නෙමෙයි.

දැන් අර ලුණු වගේ දැනෙන එක තියෙනවා. එහෙම **දැනෙන එක වෙනයි. ඔය හිතන එක වෙනයි. දෙක දෙකක්. අන්න ඒ දැනෙන එකට සිහිය පැවැත්තුවොත් නිවන් දකිනවා.** හැම මොහොතෙම ඒක කාටවත් කියන්න බැහැ. සාන්දිට්ඨිකයි. හැම මොහොතෙම ඔහොම දෙයක් දැනෙනවා.

**උපාසිකාවඃ** මෙනෙහි කරන්නෙ නැතිව.

**ආර්යයන් වහන්සේඃ** ඔව්. හිතන එක නෙමෙයි. මේක හැම වෙලාවෙම සිතුවිල්ලක් කියල හිතුවොත් දැනෙන එක අසුවෙනවා. ඒ සිතුවිල්ල අයින් කරගන්නකම්ම දැනෙන එක අසුවෙන්නෙ නැහැනෙ. ඒ කියන්නෙ මේක අරමුණට එන්න නැත්තෙ නුවණට එන්න නැත්තෙ. එතකොට ඒක මග ඇරෙනවා. ඒකයි නිවන මග ඇරෙනවා කියන්නෙ. ඒක ටිකක් ගැඹුරුයි නේද මේ කියන තැන. එකම තැන නේද මේ කරකැවෙන්නෙ. දෙයක් වගේ දැනෙන එක ආයෙ පොඩ්ඩක් සිහි කරන්න ආර්යයන් වහන්සේ මොකක්ද මේ කියන්නෙ කියල. දෙයක් වගේ දැනෙනව කියන එක. ආත්මෙත් දෙයක් වගේ දැනෙනවා. දරුවත් දෙයක් වගේ දැනෙනවා. ගෙදරත් දෙයක් වගේ දැනෙනවා. හැම එකක්ම දෙයක් වගේ දැනෙනව. හැබැයි මේ එකක්වත් හිතන ඒවා නෙමෙයි. දැනෙන ඒවා. තේරුණා

නේද?

**උපාසිකාව:** දෙයක් නැහැ කියල අවබෝධය තමයි එන්න ඕනි නේද ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** හැබැයි දෙයක් නැහැ කියල හිතුවොත් ඒකත් සිතුවිල්ලක්. දැන් අපි හිතමු මෙතන ඇමරිකන් ජාතිකයෙක් ඉන්නවා. හින්දු ජාතිකයෙක් ඉන්නව, ජපන් ජාතිකයෙකුත් ඉන්නව, සිංහල ජාතිකයෙකුත් ඉන්නව. දැන් මේ හතරදෙනා භාෂා හතරක් නෙ කතා කරන්නෙ. ශබ්ද හතරක්නෙ. දැන් කතා කරන්නෙ. කෙනෙක් කරපිංච කියනව. ඒ වගේ භාෂා හතරක්. මේ හැමෝටම මෙතන දෙයක් වගේ දැනෙනවනෙ. ශබ්ද ටික පැත්තකින් තියමුකො. හැබැයි ඔය හැමෝටම දෙයක් තියෙනවනෙ. කරපිංච වෙන්න පුළුවන්. කරපිංච කියන ශබ්දය බොරුවක්. හැබැයි හැමෝටම දෙයක් තියෙනවනෙ.

අන්න දෙයක් කියන එකයි අපි මේ කතා කරන්නෙ. සිහියටයි මේක අසු වෙන්නෙ. දෙයක් නැති බව දැනෙන එකයි සත්‍යය. දෙයක් කියල දැනෙන එකක් මෙතනතියෙනව මීට යටින්. එතනට පොඩ්ඩක් සිහිය පවත්වගන්න. කරපිංචත් දෙයක් වෙලා දැන්. එතකොට කරපිංච කියල දෙයක් නැති බව දැනෙනවා. කරපිංච කියල දෙයක් නැති බව දැනෙන එකයි නිවන කියන්නෙ. සංඛාරවල සමතයක් සිද්ධ වෙන්නෙ. හැබැයි මේ හැම තැනම දෙයක් වගේ දැනෙන ගතිය තියෙනව නෙ. දෙයක් වගේ තේරෙනවනෙ. සාමාන්‍යයෙන් මේ කරපිංච කියල දෙයක් කොහෙවත් නැහැනෙ. හැබැයි කරපිංච කියල දෙයක් නැති වුණාට දැනෙන ගතියක් තියෙනවනෙ. ඒ දෙක දෙකක්. දැන් කරපිංච කියල දෙයක් කොහෙවත් නැහැ. හැබැයි කරපිංච කියල කිව්වොත් කරපිංච ඒක දෙයක් බවට පත්වෙනවා. කරපිංච කියල දෙයක් අපි ඇසුරු කරානෙ. ඇයි කරපිංච කියල දැම්මේ. දැන් කරපිංචා කියල දෙයක් නැතුවත් යමක් අපිට දැනෙන එකක් තියෙනවනෙ. **ඒ දැනෙන එකට භාෂාව නැති වුණොත් ඒක දෙයක් වෙන්නෙ නැහැ. ඔන්න ඔතනයි මිදීම** තියෙන්නෙ.

**උපාසිකාව:** එහෙමයි.

**ආර්යයන් වහන්සේ:** ඔය නාම රූප ටික අයිනට වෙච්ච ගමන්ම, අර දැනෙන එක ක්‍රියාවලියක් බවට පත්වෙනවා. ඔය නම් ටික සේරම දකින, පේන, ඇහෙන ඔය සේරම නම් ටික මැකුවොත් අන්න ක්‍රියාවලිය මතුවෙනවා. හැම එකම ක්‍රියා සිතක් වෙනවා.

**උපාසිකාව:** එහෙමයි.

**ආර්යයන් වහන්සේ:** ඒකෙ දෙයක් නැති වෙනව කියන්නෙ කරපිංච කියන දෙයයි, නැති වෙන්නෙ. මේක ටිකක් ගැඹුරුයි. අර කරපිංච කියල නැති වුණාට අර දෙයක් වගේ දැනෙන ක්‍රියාවලිය පවතිනව. ස්කන්ධ මට්ටම කරපිංච කියල දෙයක් නැති වෙනවා. දරුව කියල දෙයක් නැති වෙනවා. අම්ම කියල දෙයක් නැති වෙනවා. ඉර කියල, හඳ කියල දෙයක් නැති වෙනවා. හැබැයි ක්‍රියාවලියක් තියෙනවා. දැනෙන දෙයක් තියෙනවා. යටින් ඒක දෙයක් නෙමෙයි. කරපිංච කියල දෙයක් නෙමෙයි. සංඛාර සමතයක් වෙනවා. දැන් මේ නම් ටිකයි නැති වෙන්නෙ. මේකෙ දෙයක් කියල අපි පනවගෙන තියෙන්නෙ නම. නම දෙයක් කරගෙන තියෙන්නෙ. **රූප සංඥාවක් දෙයක් කරගෙන තියෙන්නෙ.** කරපිංච කියන කොට වටිනාකමකුත් තියෙනවනෙ. කරපිංච කියන රූප සංඥාවක් තියෙනවනෙ. කරපිංච දෙයක් වෙලා තියෙනවා.

මේ ඔක්කොම ටික කාම භූමිය රූප භූමිය අරූප භූමියනෙ. **කරපිංච කියන වටිනාකම කාම භූමියෙ, කරපිංච කියන රූප සංඥාව - රූප භූමියෙ. කරපිංච කියන දේ අරූප සංඥාව. හැබැයි ඔය ඔක්කොම අයින් කරොත් අන්න නිකම් ක්‍රියාවලියක් තියෙන්නෙ.** දැනෙන ස්වභාවය ක්‍රියාවලියක් බවට පත්වෙනවා. ඒ ක්‍රියා සිත් දැන් තුන් භූමියෙන්ම මිදිල කටයුතු කරන හැටි දන්නව. මේක ඉතාම ගැඹුරු පර්යායක්.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** පුදුම දහමක්. බුදුන් වහන්සේ එදා කෙසේද 2500ට පසු අද කෙසේද? දෙකම එකයි. මේ දහමේ විග්‍රහය. මේ බෞද්ධ ස්වභාවයේ දෙකක් නැහැ. එකමයි. ඒකයි කිව්වෙ වෙන කෙනෙකුට අවබෝධ වෙලා දේශනා කරත් ඒත් එකමයි. සමානයි. ඒ බුද්ධ දේශනාවයි.

ඒ බුද්ධ දේශනාවයි. ඒක මහා ගැඹුරුයි. අති සියුම් දේශනා කළ යුතුම දේශනාවක් තමයි මේ දේශනා කරන්නෙ.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** මේ දේශනා මොහොතක් අහනව කියන්නෙ බුදුරජාණන් වහන්සේ කියනව කල්පයක් හිටියත් වැඩක් නැහැ මහණෙනි, මේ සත්‍යය මොහොතක් හෝ නොදැන කියල. ඔබතුමිය හරිම භාග්‍යවන්තයි.

**උපාසිකාව:** එහෙමයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඔබතුමිය විශාල කටයුත්තක් කරා. ඒක විශාල දෙයක්. අපි ඒකෙන් දෙයක් නොකළ බව දන්නවා. නමුත් ඉදිරියෙදි සමාජයට ඉතාම වැදගත් වෙයි.

**උපාසිකාව:** එතනත් දෙයක් නැහැනෙ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඒක දකින නිසයි අම්ම ඒක කළේ. අම්මට තියෙන්නෙ මේක තව ටිකක් පිරිසිදු කර ගන්න. මේ දේශනයම සිය පාරක් අහන්න කිව්වෙ ඒකයි. අම්ම නිවන් දකිනවා. මේ දේශනයේ මේ සියල්ලම තියෙනවා. එහෙනම් තෙරුවන් සරණයි.

**උපාසිකාව:** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස.

**සියල්ලෝම සත්‍ය ධර්මය දකිත්වා!**

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මුද්‍රණය කරන එම ධර්ම ග්‍රන්ථ සඳහා ඔබටත් දායක විය හැක.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය

ගිණුම් අංක : 106161005988

බැංකුව : සම්පත් බැංකුව

ශාඛාව : බත්තරමුල්ල

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මගින් මෙතෙක් මුද්‍රණය කර ඇති ග්‍රන්ථ පහත සඳහන් වේ.

1. සතිය කියන්නේ අපේ ගෙදර
2. මට මම නැතිවන හැටි
3. මොහොතට අවධිය (පළමු කොටස)
4. බුද්ධ දර්ශනය
5. නිවැරදි නිවන් මඟ හමුවිය
6. මොහොතට අවධිය (දෙවන කොටස)
7. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 1
8. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 2
9. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 3
10. The true dhamma has awakend, volume 1
11. මේ අසන මොහොතේම ඔබ නිවන් දකිනවා